ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 449**

# පළමුවැනි අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තාව

# (2025.01.24 සිට 2025.03.07 දක්වා)

නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති
ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා
විසින්
2026 ක් වූ ජනවාරි මස 23 වැනි දින ඉදිරිපත් කරන ලදී.

අනුමතිය ලැබීම මත වාර්තාවට ඇතුළත් කරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| අනු අංකය | අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම | දිනය |
|---|---|---|
| 01 | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.01.24 |
| 02. | වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.05 |
| 03. | කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.21 |
| 04. | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.02.27 |
| 05. | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.03.03 |
| 06. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2025.03.07 |

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්ය මණ්ඩලය (2025.01.24 - 2025.03.07)**

- ඩී. ඩී. යූ. කේ. මුණසිංහ මහතා, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - කාරක සභාවේ ලේකම්
- චන්දිමා සුභසිංහ මිය, ප්‍රධාන නිලධාරී
- ඩී. ආර්. ඒ. එම්. ඩී. සෙව්වන්ති රණසූරිය මිය, සහකාර ප්‍රධාන නිලධාරී
- උදේශිකා තත්සරණී වීරසිරි මිය, පාර්ලිමේන්තු නිලධාරී
- ඩබ්. පී. යූ. හංසනී මුණසිංහ මිය, පාර්ලිමේන්තු නිලධාරී
- මාධවී අර්ථනායක මිය, පාර්ලිමේන්තු නිලධාරී
- ඩබ්. එම්. මධුෂාණි වීරසේකර මිය, පාර්ලිමේන්තු නිලධාරී
- ප්‍රභා හෙට්ටිආරච්චි මෙනෙවිය, පාර්ලිමේන්තු නිලධාරී
- රුක්මණී දේවී මිය, ජ්‍යෙෂ්ඨ භාෂා පරිවර්තක
- එම්. එල්. මුහම්මදු පත්හුල්ලා මහතා, පරිගණක ක්‍රියාකරු

**අමාත්‍යාංශ ලේකම්වරුන් (2025.01.24 - 2025.03.07)**

- එච්. එස්. එස්. තුයියකොන්තා මහතා - ආරක්ෂක අමාත්‍යාංශය
- කේ. එම්. එම් සිරිවර්ධන මහතා - මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
- වරුණ ශ්‍රී ධනපාල මහතා (වැ.බ.) - ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
- කේ. එම්. ජී. එස්. නාලක කළුවැව මහතා - අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
- ඩී. පී. වික්‍රමසිංහ මහතා - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
- අරුණි රණරාජ මහත්මිය - විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
- එම්. ඒ. එල්. එස්. එන්. කේ. මන්ත්‍රිනායක මහතා - ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
- ජේ. එම්. තිලකා ජයසුන්දර මහත්මිය - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සී. කේ. පෙරේරා මහතා - ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
- බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා - වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
- වෛද්‍ය අනිල් ජාසිංහ මහතා - සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
- කේ. ඒ. විමලේන්තිරරාජා මහතා - වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය
- එස්. එම්. පියතිස්ස මහතා - කම්කරු අමාත්‍යාංශය
- යූ. ජී. රංජිත් ආරියරත්න මහතා - නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය
- එස්. ආලෝකබණ්ඩාර මහතා - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
- මලර්මතී ගංගාදරන් මහත්මිය - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

- වයි. එල්. මොහොමඩ් නවාවි මහතා - විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
- ඩී. ඩබ්. ආර්. බී. සෙනෙවිරත්න මහතා - මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
- මහාචාර්ය කේ. ටී. එම්. උදයංග හේමපාල මහතා - බලශක්ති අමාත්‍යාංශය
- ඒ. එච්. එම්. යූ. අරුණ බණ්ඩාර මහතා - තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
- කේ. ඩී. ආර්. ඔල්ගා මහත්මිය - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
- කේ. ආර්. උඩුවාවල මහතා - පරිසර අමාත්‍යාංශය
- ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා - බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය - අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ප්‍රවේශ පථය (Access Path) ඔස්සේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ වාර්තා බාගත කළ හැකිය.

www.parliament.lk ⟶ පාර්ලිමේන්තුවේ කටයුතු ⟶ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා ⟶ වාර්තාව පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කළ දිනය අනුව තෝරන්න ⟶ බාගත කරන්න/ බලන්න

**ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ**
**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 ජනවාරි මස 24**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු බිමල් රත්නායක මහතා (සභාපති)
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය)
ගරු චතුරංග අබේසිංහ මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු අජිත් අගලකඩ මහතා
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
ගරු තනූර දිසානායක මහතා
ගරු සුජීව දිසානායක මහතා
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
ගරු ධනුෂ්ක රංගනාත් මහතා
ගරු දීප්ති වාසලගේ මහත්මිය
ගරු ආර්. ජී. විජේරත්න මහතා
ගරු ජගත් විතාන මහතා
ගරු දිනිඳු සමන් මහතා
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
ගරු දේවානන්ද සුරවීර මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු එරංග ගුණසේකර මහතා
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා
ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා
ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු රොෂාන් අක්මීමන මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා

ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා
ගරු තිලංක යූ. ගමගේ මහතා
ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
ගරු රුවන්තිලක ජයකොඩි මහතා
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
ගරු මොහමඩ් සාලි නලීම් මහතා
ගරු අරුණ පනාගොඩ මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
ගරු නන්ද බණ්ඩාර මහතා
ගරු විජේසිරි බස්නායක මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
ගරු රියාස් ෆාරුක් මහතා
ගරු මංජුල සුගත් රත්නායක මහතා
ගරු සුරංග රත්නායක මහතා
ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
ගරු ෆස්මින් ෂරීෆ් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා
ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
ගරු මුහම්මද් ෆයිසාල් මහතා

## 1. වාර්ෂික වාර්තා සලකා බැලීම

2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව අධ්‍යයනයෙන් අනතුරුව ඉදිරි කාරක සභා රැස්වීමක දී සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති ගැටලු විසඳා ගැනීම සඳහා ප්‍රවාහන, පාරිසරික, ව්‍යාපාරික සහ ජනතා හිතවාදී සංකල්ප ඔස්සේ ගරු මන්ත්‍රීවරුන් වෙතින් අදහස් සහ යෝජනා අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, උක්ත ඉලක්කය වෙත ළඟා වීම සඳහා පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට වගකියනු ලබන පහත විස්තර දැක්වෙන අනු කාරක සභා ත්‍රිත්වයක් පිහිටුවීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.1 අවිධිමත් ප්‍රවාහන කර්මාන්තය හා සම්බන්ධ වෘත්තිකයින්ගේ වෘත්තිය සුරක්ෂිතතාව තහවුරු කිරීම - ප්‍රථම අනු කාරක සභාව

ඒ අනුව, ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ විධිමත්ව සංවිධානය නොවූ සේවකයන් ඉලක්ක කර ගනිමින් එනම්, පුද්ගලික බස් රථ රියදුරුවරුන්, කොන්දොස්තරවරුන්, ත්‍රීරෝද රථ රියදුරන් සහ

ඉලෙක්ට්‍රොනික යෙදවුම් හරහා ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ නියැලී සිටින්නන් (App Base Workers) සඳහා වෘත්තිමය වශයෙන් පිළිගැනීමක් ඇති කොට ඔවුන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ (ETF) දායකත්වය ලබා දීම සහ දායක විශ්‍රාම වැටුපක් හෝ පළාත් සභා මඟින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ ආරක්ෂණ අරමුදලක් එකී සේවකයන් වෙනුවෙන් පිහිටුවීම සම්බන්ධයෙන් වන ප්‍රථම අනු කාරක සභාව ගරු ජගත් විතාන මහතා, ගරු දිනිඳු සමන් මහතා, ගරු දේවානන්ද සුරවීර මහතා සහ ගරු චන්දන සූරියආරච්චි මහතාගේ සාමාජිකත්වයෙන් යුතුව පිහිටුවීමට කටයුතු කරනු ලබන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එකී අනු කාරක සභාව සඳහා ශ්‍රී ලංකා ගමනාගමන කොමිෂන් සභාව නියෝජනය කරමින්, එහි සභාපති ආචාර්ය බී. ඩී. විතාරණ මහතා සම්බන්ධ කරගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

අනු කාරක සභාවට ඉදිරියට අවශ්‍ය කුමන නිලධාරියෙකු වුව ද කැඳවීම සඳහා මෙන්ම අවශ්‍ය කුමන ස්ථානයක් වුව ද නිරීක්ෂණය කිරීම සඳහා බලය ඇති බවත් අනු කාරක සභාව රැස් වී ඒ සඳහා සභාපතිවරයකු යෝජනා කර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා විසින් එකී අනු කාරක සභාවේ සාමාජිකයින් වෙත උපදෙස් ලබාදෙන ලදී.

### 2.2 ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ නීතිමය රාමුව ශක්තිමත් කිරීම තුළින් සාධනීය දිශානතියක් කරා ප්‍රවාහන ක්ෂේත්‍රය යොමු කරවීම - දෙවැනි අනු කාරක සභාව

ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ නීතිමය රාමුව ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් බස් රථ අසුන්වල නියමිත ප්‍රමාණය තීරණය කිරීම ආදී ගැටලු සඳහා පිළියම් සෙවීම මෙන්ම ඉදිරි වසර 05කින් පසුව ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ දිශානතිය කෙබඳු ද යන්න තීරණය කිරීම ද ඇතුළත්ව කාන්තාවන් සහ ආබාධ සහිත ප්‍රජාව මුහුණ දෙන ගැටලු කෙරෙහි ද විශේෂ අවධානය යොමු කරමින් ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා නෛතික සහ පරිපාලනමය යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවියගේ සභාපතිත්වයෙන් යුතුව සහ ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා, ගරු තනුර දිසානායක මහතා සහ ගරු සුජීව දිසානායක මහතාගේ සාමාජිකත්වයෙන් ද, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතාගේ සක්‍රිය දායකත්වයෙන් ද යුතුව දෙවැනි අනු කාරක සභාව පිහිටුවීමට කටයුතු කරනු ලබන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එකී අනු කාරක සභාව සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය නියෝජනය කරමින් එල්. එච්. තිලකරත්න මහතා (අතිරේක ලේකම් - පාලන) සම්බන්ධ කරගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

අවශ්‍ය ස්ථානීය පරීක්ෂණයන් සහ අනෙකුත් නිරීක්ෂණයන් සිදුකොට නීතිමය රාමුව ශක්තිමත් කර ගැනීම සඳහා විසඳුම් සහ යෝජනා ඉදිරිපත් කර මාස 02ක පමණ කාලයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත්

කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අදාළ අනු කාරක සභාවේ ගරු සභාපතිතුමියට උපදෙස් ලබාදෙන ලදී.

**2.3 ප්‍රවාහන කර්මාන්තය හා බැඳි අතිරේක සේවා නිර්මාණය කිරීම සඳහා ව්‍යාපෘති මාදිලි (Business Models) සැකසීම - තෙවැනි අනු කාරක සභාව**

පවතින සම්පත් භාවිත කොට ප්‍රවාහන ක්ෂේත්‍රයෙහි මූලික අභිප්‍රායන් හා බැඳී පවතින අංශ දියුණු කිරීම සඳහා මෙන්ම අතිරේක සේවා නිර්මාණය කොට එමඟින් අමතර ආදායම් උත්පාදනය කිරීම සඳහා ව්‍යාපෘති මාදිලි (Business Models) සැකසීම වෙනුවෙන් ගරු චතුරංග අබේසිංහ මහතාගේ සභාපතිත්වයෙන් යුතුව, ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා සහ ගරු ධනුෂ්ක රංගනාත් මහතාගේ සාමාජිකත්වයෙන් ද, ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා සහ ගරු සුරංග රත්නායක මහතාගේ සක්‍රීය දායකත්වයෙන් ද යුතුව තෙවැනි අනු කාරක සභාව පිහිටුවන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එකී අනු කාරක සභාව සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් වී. එස්. පොල්වත්තගේ මහතා (අතිරේක සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්) සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නියෝජනය කරමින් ජී. ජී. එම්. මහේෂ් කුලතිලක මහතා (ප්‍රධාන විධායක නිලධාරී) යන නිලධාරීන් සම්බන්ධ කරගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1 ශ්‍රී ලංගම බස් රථ හිඟය - ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ ප්‍රමාණවත් පරිදි මාර්ගවල ධාවනය නොවීම සම්බන්ධයෙන් කළ විමසීමක දී බස් රියදුරන් සහ කොන්දොස්තරවරුන්ගේ හිඟය මත එවන් තත්ත්වයක් උද්ගතව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.2 ගරු චන්දන සූරියආරච්චි මහතා**

**3.2.1 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් ග්‍රාමීය ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කරන බස් රථ සේවාවන්හි බිඳවැටීම**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මඟින් ග්‍රාමීය ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කරන බස් රථ සේවාවන්හි සැලකිය යුතු බිඳවැටීමක් දක්නට ඇති බවත් ප්‍රධාන මාර්ගවල ගමන් කරන බස්රථවල දෝෂ ඇති වන අවස්ථාවන්හී දී ග්‍රාමීය ප්‍රදේශයන්හි ධාවනය වන බස්රථ ඒ සඳහා යොදා ගැනීම හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශයන්හි බස්රථ ගමනාගමනය අඩාළ වන බවට ඩිපෝ සම්බන්ධයෙන් සිදුකරන ලද නිරීක්ෂණ මඟින් අනාවරණය වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, ලංගම බස් රථ ඇණිය තුළ ඇති ධාවන තත්ත්වයේ නොපවතින බස් රථ සුළු අලුත්වැඩියා කිරීම්වලින් අනතුරුව ධාවනය සඳහා යොදා ගැනීමේ හැකියාව පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ග්‍රාමීය ප්‍රදේශ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ලබාදෙන ලෙස මහජන දිනවල දී බොහෝ ඉල්ලීම් ලැබෙන බවත් ඒ සඳහා ඉහත සඳහන් කරන ලද ගැටලුකාරී තත්ත්වයන් මගහරවා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.2.2 ලෝක බැංකු ව්‍යාපෘති යටතේ මාර්ග ඉදිකිරීම් සඳහා ලැබී ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් විමසීම

පසුගිය වර්ෂයේ ලෝක බැංකු ව්‍යාපෘති යටතේ මාර්ග ඉදිකිරීම් සඳහා යම් ව්‍යාපෘතියක් ආරම්භ වී ඇති බවත් සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බල ප්‍රදේශ තුළ ස්ථාන කිහිපයක මෙකී ව්‍යාපෘති සඳහා කළුගල් කියුබ් සියයකට අධික සංඛ්‍යාවක් ගොඩබෑම් සිදුකර ඇති අතර එවන් ව්‍යාපෘති සඳහා අනුමතියක් මෙතෙක් ලැබී නොමැති බව වාර්තා වූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එවන් ව්‍යාපෘති ලැබී තිබේ ද, අනුමත වූ ව්‍යාපෘති වේ නම් ඒ කවරේ ද, රජයේ මුදල් භාවිතා කර ඉහත කී ආකාරයෙන් මාර්ගයේ තැනින් තැන ගල් කියුබ් ගොඩබෑම් සිදු කළ හැකි ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 3.2.3 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ සඳහා අමතර කොටස් මිලදී ගැනීමේ දී මතුවන ගැටලු

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථ සඳහා අමතර කොටස් මිලදී ගැනීමේ දී එහි ආයතනික ක්‍රියාපටිපාටිය සැකසී ඇති ආකාරයේ පවතින දුර්වලතාව හේතුවෙන් ඩිපෝව පිහිටි ස්ථානයෙන් ඉතා දුර බැහැර ප්‍රදේශවලින් අදාළ අමතර කොටස් මිලදී ගැනීමට සිදුව ඇති බවත් ඒ හේතුවෙන් විශාල ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුව ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

වාහන අමතර කොටස් මිලදී ගැනීමේ දී නිර්ව්‍යාජ අමතර කොටස් සහ ව්‍යාජ අමතර කොටස් සම්බන්ධයෙන් ගැටලු පැන නඟින බවත් බස් ධාවනය කඩා වැටීම සඳහා එකී හේතුව ද බලපා ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

වාහන අමතර කොටස් මිලදී ගැනීම සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවලට මුදල් බලතල ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලබාගෙන ඇති බැවින් එවිට ගැටලුවකින් තොරව අදාළ අමතර කොටස් ළඟම ඇති සැපයුම්කරුවෙකු මඟින් මිලදී ගත හැකි බවත් දෙසතියක් සඳහා අවශ්‍ය කරනු ලබන අමතර කොටස් රැස් කර තබා ගැනීමේ හැකියාව ද සෑම ඩිපෝවක් සඳහා ලබා දී ඇති බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

වාහන අමතර කොටස් සම්බන්ධ ව්‍යාපාර සිදුකිරීමේ හැකියාව ඩිපෝ සතුව පවතින්නේ ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

එවැනි ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ හැකියාව පවතින බවත් එහිදී ගබඩා පහසුකම් නොමැති වීම, සුදුසුකම්ලත් ඉංජිනේරුවරුන්ගේ

පුරප්පාඩු පැවතීම ආදි ගැටලු පවතින බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

**3.3 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත කොන්දොස්තරවරුන් පිරිසකගේ වැඩ තහනම් කිරීම - ගරු දේවානන්ද සුරවීර මහතා**

හෝමාගම සහ මහරගම ඩිපෝ ආශ්‍රිතව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්තව සේවය කරනු ලබන කොන්දොස්තරවරුන් 18 දෙනෙකුගේ වැඩ කෙටි කාලයක් ඇතුළත දී තහනම් කර ඇති බවත් ඒ හේතුවෙන් බාධාවකින් තොරව සේවා සැපයීම විශාල ගැටලුවක් බවට පත්ව ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.4 ශ්‍රී ලංගම වාර ප්‍රවේශපත් හිමිකරුවන් මුහුණදෙන ගැටලු - ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

වාර ප්‍රවේශපත්‍රලාභී ශිෂ්‍යයන් සහ රජයේ නිලධාරීන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් දුර ගමන් සේවා බස්රථවල ගමන් කිරීම සඳහා අවස්ථාව නොලැබෙන බැවින් අසීරුතාවන්ට ලක් වීම නිසා එවන් තත්ත්වයන් මතු නොවන පරිදි වාර ප්‍රවේශපත් හිමිකරුවන්ට දුර ගමන් බස් රථවල ගමන්කිරීම සඳහා අවස්ථාව ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.5 හෝමාගම ඩිපෝවෙහි පවතින කාර්ය මණ්ඩල හිඟය - ගරු අරුණ පනාගොඩ මහතා**

වසර ගණනාවකින් කාර්ය මණ්ඩලය බඳවා ගෙන නොමැති බව හෝමාගම ඩිපෝව නිරීක්ෂණය කිරීමට ගිය අවස්ථාවේ දී වාර්තා වූ බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, සේවක හිඟය හේතුවෙන් ආයතනය තුළ පැන නගින සුළු ගැටලුවක් විසඳීමට පවා දීර්ඝ කාලයක් ගතවන තත්ත්වයක් උදා වී ඇති බවත් අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවාගැනීම් සිදු කොට ආයතනික වශයෙන් පැන නැඟ ඇති ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා කටයුතු සළසා දෙන ලෙසට එම ආයතනයේ වත්මන් කාර්ය මණ්ඩලය විසින් ඉල්ලීම් කරනු ලබන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

සියලුම ඩිපෝවල පවතින සේවක හිඟයට විසඳුමක් ලෙස රියැදුරු, කොන්දොස්තර සහ කාර්මික ශිල්පීන් බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කොට ඒ සඳහා අනුමතිය ලබාගෙන ඇති බවත් එකී කටයුතු නුදුරේදීම සිදුකිරීමට අපේක්ෂා කරන බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

ධාවනයට නුසුදුසු මට්ටමේ පවතින්නේ යැයි බැහැර කරන ලද බස් රථ විශාල සංඛ්‍යාවක් ද ඩිපෝ පරිශ්‍රය තුළ ඒකරාශී වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ද සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**3.6 කිරිඳිවැල - නිට්ටඹුව 182 මාර්ගය සඳහා ශ්‍රී ලංගම - පුද්ගලික ඒකාබද්ධ බස් රථ සේවාවක් ස්ථාපිත කිරීම - ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

කිරිඳිවැල - නිට්ටඹුව 182 මාර්ගයේ පුද්ගලික බස් රථ පමණක් ධාවනය වන අතර ප. ව. 06.00න් පසුව එම බස් රථ ධාවනය නොවන බවත් එකී වේලාවන්වලට බස්රථවල ගමන් කිරීම සඳහා මඟී ජනතාව අවම බව ඊට හේතු වශයෙන් දක්වා සිටින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ සහ පෞද්ගලික අංශයේ බස් රථ සඳහා ඒකාබද්ධ කාලසටහනක් සකස් කොට මඟී ජනතාවට පහසුව සලසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.7 අයිරෝඩ් ව්‍යාපෘති (i – road project) හරහා ක්‍රියාත්මක වන KL 02 කොන්ත්‍රාත් පැකේජය තුළින් මතුවූ ගැටලු - ගරු ධනුෂ්ක රංගනාත් මහතා**

අයිරෝඩ් ව්‍යාපෘති (i – road project) හරහා ක්‍රියාත්මක වන KL 02 යන කොන්ත්‍රාත් පැකේජය යටතේ ඉදිකිරීම් සිදු කරන ලද අගලවත්ත සහ මතුගම ප්‍රදේශ ආශ්‍රිත මාර්ග සම්බන්ධයෙන් මේ වන විට ගැටලුවක් පැන නැඟී ඇති බවත් එකී පැකේජය හරහා ඉදිකරන ලද මාර්ග සඳහා කිසිඳු නඩත්තු කටයුත්තක් වසර අටක් ගතවන තෙක් ප්‍රාදේශීය සභාවකට හෝ සිදුකිරීමට ඉඩ ලබා නොදුන් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට ඒ සම්බන්ධයෙන් ගොනු කර තිබූ නඩු කටයුතු අවසන් වී ඇති බැවින් නැවත පවරාදීමක් සිදුකළ ද එකී මාර්ග නඩත්තු කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

අයිරෝඩ් ව්‍යාපෘතිය (i - road project) ආසියානු සංවර්ධන බැංකුව යටතේ ප්‍රතිපාදන ලබාගත් ව්‍යාපෘතියක් වන අතර, එසේ ලබාදුන් ප්‍රතිපාදන කපා හැරීම මත ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු නතර වී ඇති බවත් ඉදිරියේ දී නැවත ප්‍රතිපාදන සපයාදෙනු ලබන්නේ නම් එම ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කළ හැකි බවත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

**3.8 කිරලව පාලම ප්‍රතිසංස්කරණය කිරීම - ගරු සුරංග රත්නායක මහතා**

මඩාටුගම සිට පුබ්බෝගම දක්වා දිවෙන මාර්ගයේ කිරලව - දඹුලුඔය හරහා ඇති කිරලව පාලම පූර්ණ වශයෙන් ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා කඩිනමින් කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.9 අබලන්ව ඇති පාලම් ප්‍රතිසංස්කරණය කිරීම - ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

පුත්තලම - මදුරන්කුලියේ සිට මුහුද දක්වා දිවෙන මහාමාර්ගයේ පවතින පාලම් 02ක් කැඩී ගොස් ඇති බවත් ඒවා තහඩු යොදා පිළිසකර

කර තිබුණ ද එකී පාලම් ද්විත්වයම කඩා වැටීමට ඉතා ආසන්න තත්ත්වයක පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

විරුදෝඩෙ ග්‍රාමය හරහා ඇති පාලම ද දැඩි ලෙස අබලන් තත්ත්වයේ පවතින බවත් රථවාහන ධාවනයට එමඟින් ඉතා බාධාකාරී තත්ත්වයක් පැන නැගී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කොට ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පුත්තලම වෙරළබඩ මාර්ගයේ පිහිටි පාලම හැරුණු කොට ගරු මන්ත්‍රීවරුන් විසින් කරුණු ඉදිරිපත් කරන ලද සෙසු පාලම් ත්‍රිත්වය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බවත් එහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා නියෝජිත ආයතන සමඟ සාකච්ඡා කරමින් පවතින බවත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

**3.10 සිසු සැරිය ලංගම බස් රථ සේවාව ශක්තිමත් කිරීම - ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

පාසල් සිසු දරුවන් භාවිත කරන සිසු සැරිය ලංගම බස් රථ සේවාව ශක්තිමත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පාසල් සේවා, ග්‍රාමීය සේවා සහ රාත්‍රී සේවා ශ්‍රී ලංගම මඟින් ඉටු කරන අතර මහා භාණ්ඩාගාරය මඟින් සිසු සැරිය සහ නිසි සැරිය යන බස් රථ සේවාවන් සඳහා මුදල් වෙන් කර ඇති බවත් රජයේ සහනාධාර මත එකී සේවාවන් වැඩිදියුණු කිරීමේ අවස්ථාව පවතින බවත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මෙම සේවාවන් ලබා දිය හැකිවනුයේ ජනතාව විසින් කරනු ලබන ඉල්ලීම් මත බැවින් ඒ සම්බන්ධයෙන් ජනතාව අතර දැනුම්වත් කිරීමක් සිදු කළ යුතුව ඇති බව ද ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**3.11 ආබාධ සහිත පුද්ගලයින් උදෙසා හිතෛෂී ප්‍රවාහන සේවයක් නිර්මාණය කිරීම - ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත ප්‍රජාව 8.7%ක් පමණ වෙසෙන බවත් එකී ප්‍රජාව අරභයා හිතකර ප්‍රවාහන සේවාවක් හෝ මහාමාර්ග පද්ධතියක් ලංකාව තුළ දක්නට නොලැබෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

විශේෂයෙන්ම, උතුරු දුම්රිය මාර්ගය ඉදිකිරීමේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කොට කටයුතු කරන ලෙසට ඉල්ලීම් සිදු කර තිබුණ ද එකී ඉල්ලීම් නොසලකා හැර ඇති බැවින්, ඉදිරියේ දී ප්‍රවාහන අංශය සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උතුරු දුම්රිය මාර්ගයේ දුම්රිය නැවතුම්පොළ සැකසීමේ දී ආබාධ සහිත පුද්ගලයන් සඳහා විශේෂ පීයිකා හා ප්‍රවේශ මාර්ගය ආදිය

නිර්මාණය කරන ලද නමුත් එම ප්‍රජාව සඳහා සනීපාරක්ෂක පහසුකම් මෙතෙක් ඉදිකර නොමැති බවත් ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

දුම්රිය නැවතුම්පොළවල් බොහෝමයක දුම්රිය ස්ථාන වේදිකා දුම්රියෙහි මට්ටමට සමවීමට ඔසවා ඇති බවත් එසේ සිදුකර නොමැති දුම්රිය වේදිකා හඳුනාගෙන ඒවා කඩිනමින් නවීකරණය කර ආබාධ සහිත පුද්ගලයන්ට භාවිත කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ඉදිරියේ දී කටයුතු කරන බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.12 ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

### 3.12.1 අක්‍රිය තත්ත්වයේ පවතින බස් රථ යළි ප්‍රවාහන සේවයට එක් කර ගැනීම

කුරුණෑගල පිහිටි ඩිපෝ තුනෙහි දැනට අක්‍රිය තත්ත්වයේ පවතින බස් රථ 23ක් පමණ පවතින අතර සුළු නඩත්තු කිරීම්වලින් අනතුරුව නැවත ධාවනය සඳහා එකී බස් රථ යොදා ගැනීමේ හැකියාව පවතින බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, එකී ඩිපෝවල ඩිපෝ අධිකාරිවරුන් ලෙස රාජකාරි කිරීම සඳහා නුසුදුසු පුද්ගලයන් පත්ව ඇති බවත් ඒ හේතුවෙන් ආයතනය තුළ දැඩි අකාර්යක්ෂම තත්ත්වයක් නිර්මාණය වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, කුරුණෑගල සිට අධිවේගී මාර්ගය ඔස්සේ කොළඹට පැමිණීම සඳහා බස් රථයක් යොදවන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.12.2 පොල්ගහවෙල දක්වා ධාවනය වන අධිවේගී දුම්රිය කුරුණෑගල දක්වා දීර්ඝ කිරීම

පොල්ගහවෙල දක්වා ධාවනය වන අධිවේගී දුම්රිය කුරුණෑගල දක්වා දීර්ඝ කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පොල්ගහවෙල දක්වා ධාවනය වන සීඝ්‍රගාමී දුම්රිය කුරුණෑගල දක්වා දීර්ඝ කරන ලෙස මතු වූ යෝජනාව සම්බන්ධයෙන් ගැටලු කිහිපයක් මතුවන බවත් අදාළ සීඝ්‍රගාමී දුම්රිය රාත්‍රී කාලයේ දී නතර කර තැබීම සඳහා දුම්රිය නැවතුම්පොළක් පවතී ද යන්න පිළිබඳව සහ කුරුණෑගල සහ පොල්ගහවෙල අතර ඇති දුම්රිය මාර්ගය යම් තදබදයකින් යුක්ත තනි මාර්ගයක් වන බැවින් ඒ සම්බන්ධයෙන් ද නිරීක්ෂණය කොට සතියක් තුළ පිළිතුරු ලබාදීමට හැකියාව පවතින බවත් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

**3.13 සමස්ත ප්‍රවාහන පද්ධතියෙහි පවත්නා සැඟවුණු පිරිවැය කළමනාකරණය කිරීම - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු චතුරංග අබේසිංහ මහතා**

සමස්ත ප්‍රවාහන පද්ධතියම සැලකීමේ දී සැඟවුණු පිරිවැයක් එහි පවතින බවත් එනම්, සේවක ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය සහ නිෂ්කාශනය ආදී වශයෙන් ගත් විට එකී සෑම ක්ෂේත්‍රයක් තුළම 10%කට ආසන්න වූ සැඟවුණු නිෂ්පාදන පිරිවැයක් දක්නට ලැබෙන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

එකී සෑම ක්ෂේත්‍රයක් සඳහාම දෙන ලද නිර්ණායකයන් අනුව කටයුතු කිරීමට සැලසුම් කිරීම තුළින් සැඟවුණු පිරිවැය පාලනය කර ගැනීමට හැකිවන බවත් අවසාන ඉලක්කයක් අනුව කටයුතු කිරීම තුළින් ප්‍රවාහන ක්ෂේත්‍රය හා ඊට අනුබද්ධව පවතින ගැටලු නිරාකරණය කර ගැනීමට හැකියාව ලැබෙන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

**3.14 කාර්තිව් - මාවඩිපල්ලි පාලම සහ කිට්ටංගි පාලම සංවර්ධනය කිරීම - ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා**

ගංවතුර තත්ත්වයන්වල දී අම්පාර ප්‍රදේශයේ කාර්තිව් - මාවඩිපල්ලි පාලම අසල අනතුරුදායක පරිසරයක් නිර්මාණය වී ඇති බැවින් එකී තත්ත්වය වළක්වා ගැනීම සඳහා මාවඩිපල්ලි පාලම ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කල්මුණේ සිට නාවිදන්වෙලි ප්‍රදේශය තෙක් ගමනාගමන කටයුතු සඳහා භාවිත කරන කිට්ටංගි පාලම ද සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.15 ගරු ජගත් විතාන මහතා**

**3.15.1 ජාතික ගමනාගමන කොමිෂන් සභාවට (National Transport Commission) අයත් බස් රථවල අයිතිය සංශෝධනය කිරීම සඳහා අනුමතිය ලබා ගැනීම**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවට (National Transport Commission) අයත් බස් රථවල අයිතිය සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතීන් දෙකක් ලැබී තිබුණු බවත් පාර්ලිමේන්තුවේ අනුමතිය ඒ සඳහා මෙතෙක් ලබා නොගැනීම හේතුවෙන් එකී කාර්යයන් ඉදිරියට සිදුකිරීම අඩාල වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

බස් රථ අයිතිකරුවන් දහසක් පමණ ඇටෝර්නි බලපත්‍ර භාවිත කිරීම තුළින් බස්රථ ධාවන කටයුතුවල යොදවා ඇති බවත් එලෙස ඇටෝර්නි බලපත්‍ර භාවිත කිරීම තුළින් විවිධ ගැටලුකාරී තත්ත්වයන් මතුව ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එබැවින්, බස් රථවල අයිතිය සංශෝධනය කර ගැනීම සඳහා කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පවතින ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අනුව බස් රථවල අයිතිය මාරු කිරීම සිදුකළ නොහැකි බවත් අයිතිය මාරු කිරීම සඳහා

පනතෙහි සංශෝධනයක් සිදු කිරීමට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 3.15.2 බස් රථ අලංකරණය කිරීම සඳහා පවතින නෛතික රාමුවෙන් පරිබාහිරව කටයුතු සිදුවීම

බස් රථ අලංකරණය කිරීමේ දී අයිතම 18ක් සඳහා නෛතික වශයෙන් අනුමතිය ලබා දී ඇති බවත් එම ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක වීමේ දී යම් වංචාසහගත කටයුතු සිදුවන බවට වාර්තා වී ඇති අතර බස් රථ අලංකරණය සඳහා සංගමයක් පිහිටුවා ඒ හරහා වංචනික ලෙස අධික මුදලක් අය කරමින් නීතියට පරිබාහිරව බස් රථ අලංකරණය කිරීම සඳහා කටයුතු සිදුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හරහා මෙලෙස අතරමැදියන් යොදවා නීතියට පරිබාහිරව එවන් කටයුතු සිදුවේ නම් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කොට එවන් තත්ත්වයන් වැළැක්වීම සඳහා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.15.3 කළුතර දිස්ත්‍රික්කය සඳහා දුර ගමන් සේවා බස් රථ ටෙන්ඩර් කිරීම සඳහා අවස්ථාව ලබාදීම

කළුතර දිස්ත්‍රික්කය තුළ දුර ගමන් සේවා සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක වන බස් රථ ඉතා සීමිත ප්‍රමාණයක් පමණක් පවතින බැවින් දුර ගමන් සේවා බස් රථ ටෙන්ඩර් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

## 3.16 ගරු රවී කරුණානායක මහතා

### 3.16.1 මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය හරහා රට තුළට ගලා එන ආදායම

මධ්‍යම භාණ්ඩ පරීක්ෂණ අංශය (Central Cargo Examination Directorate) හරහා පසුගිය වසර තුළ බහාලුම් 139,000ක් පමණ සංසරණය වී ඇති බවත් එමගින් ලැබෙන ආදායම නියමිත පරිදි රට තුළට ගලා ඒමක් සිදුවේ ද යන්න පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.16.2 ගොඩබිම් වරායන් (Dry Ports) වත්මන් තත්ත්වය

ගොඩබිම් වරායන් (Dry Ports) සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ගොඩබිම් වරාය සංකල්පය සම්බන්ධයෙන් 2011/2012 වර්ෂ තුළ ඉදිරිපත් කරන ලද වාර්තාවක් පවතින බවත් ගොඩබිම් වරාය ඉදිකිරීම සඳහා වේයන්ගොඩ සහ කොළඹ ආසන්නයේ ප්‍රදේශ කිහිපයක් හඳුනාගෙන ඇති අතර ප්‍රවාහනකරු වශයෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට ඒ සඳහා සහයෝගය ලබා දිය හැකි බවත් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

ගොඩබිම් වරාය සංකල්පය යටතේ වේයන්ගොඩ ගොඩබිම් වරාය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් දුම්රිය මාර්ගය, නව වරාය තෙක් දීර්ඝ කර නොමැති වුව ද, වරායට අයත් බ්ලූමැන්ඩල් කලාපය හරහා දුම්රිය මාර්ගය ගමන් කරන බැවින් සැපයුම් මධ්‍යස්ථානය (Logistics Centre) වශයෙන් ද, ගොඩබිම් වරායෙන් පැමිණෙන භාණ්ඩ ප්‍රතිනැව්ගත කිරීම (Cargo Transshipment) සඳහා ද එකී දුම්රිය මාර්ගය තම ප්‍රධාන සැලැස්මේ (Master plan) සඳහන් අයුරින් යොදාගත හැකි බවත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

#### 3.16.3 කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තය විවෘත කරන කාලසීමාව

කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තය විවෘත කිරීමට බලාපොරොත්තු වන කාලසීමාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ පළමුවැනි අදියරෙහි වැඩකටයුතු ජුනි මස අවසන් වන විට ආරම්භ කිරීමට හැකි බව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

#### 3.16.4 මට්ටක්කුලිය - උතුරු කොළඹ - 155 සහ දෙහිවල - ඇලකන්ද - 172 බස් සේවය ප්‍රතිස්ථාපනය කිරීම

සේවක හිඟය හේතුවෙන් 155 - මට්ටක්කුලිය - උතුරු කොළඹ සහ 172 - දෙහිවල - ඇලකන්ද බස් සේවය මේ වන විට නතර කොට ඇති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

155 සහ 172 බස් මාර්ග සම්බන්ධයෙන් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 3.17 ගරු මොහමඩ් සාලි නලීම් මහතා

#### 3.17.1 එරාවූර් ඩිපෝව නවීකරණය කිරීම

එරාවූර් ඩිපෝව සඳහා සනීපාරක්ෂක පහසුකම්වල, පරිපාලන ගොඩනැගිල්ලක සහ ආයතනයේ සේවකයන් සඳහා විවේකාකාර පහසුකම් ආදියෙහි අඩුපාඩු පවතින බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත්, වායු සමනය කරන ලද බස් රථයක් අදාළ ඩිපෝව සඳහා ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තව ද, දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක එකී ඩිපෝව පිහිටුවා ඇති බැවින් එම ඉඩම සම්බන්ධයෙන් සුදුසු පියවර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සංවර්ධනය උදෙසා අදාළ ඉඩම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලබාදීමේ හැකියාව පවතින බව දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

#### 3.17.2 එරාවුර් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

එරාවුර් මාර්ගය සහ දෙපස කාණු පද්ධතිය විධිමත් කොට ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එරාවුර් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධ කටයුතු පිළිබඳව පරීක්ෂා කරන බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 3.18 ගරු දිනිඳු සමන් මහතා

#### 3.18.1 මාර්ග සංවර්ධන අධිකාරියේ ඌව පළාත සඳහා පළාත් භාර අධ්‍යක්ෂකවරයෙකු පත්කර ගැනීම

මාර්ග සංවර්ධන අධිකාරියේ ඌව පළාතට අනුබද්ධව වැඩ බලන අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරන බැවින් ස්ථිර වශයෙන් අධ්‍යක්ෂවරයෙක් පත්කර ගැනීම සඳහා පසුගිය දෙසැම්බර් මස 13 වැනි දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඇති නමුත් මෙතෙක් ඊට අදාළව බඳවා ගැනීමක් සිදුවී නොමැති බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂකවරුන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති බවත් එමගින් තෝරාපත් කරගන්නා ලද සුදුසුම පුද්ගලයා පළාත් භාර අධ්‍යක්ෂකවරයා ලෙස බඳවා ගැනීමට කටයුතු කරන බවත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

#### 3.18.2 ඌව පළාතේ පිහිටි රජ මාවත සහ බෙරගල මාර්ගය සංවර්ධනය කිරීම

බදුල්ල දිස්ත්‍රික්කය හා මහනුවර යා කරන රජ මාවතෙහි ඉදිරි ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමු කොට එකී ඉදිකිරීම් කඩිනම් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වැල්ලවාය - කොස්ලන්ද ප්‍රදේශයේ පිහිටි බෙරගල මාර්ගය සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා සෘජුවම සම්බන්ධ වන බැවින් එකී මාර්ගයේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ද අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රජ මාවත සහ බෙරගල මාවත සංවර්ධනය කිරීමේ කටයුතු ද ඉදිරියේ දී සිදුකිරීමට බලාපොරොත්තු වන බව මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 3.19 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ දී සලකා බලන අධ්‍යාපන සුදුසුකම් - ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ දී අධ්‍යාපන සුදුසුකම් වශයෙන් දෙවරකට වැඩි නොවන වාර ගණනක දී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා විෂයන් 06ක් සහ අවම වශයෙන් සම්මාන සාමාර්ථ 02ක් සහිතව සමත් වී තිබීම

සුදුසුකමක් වශයෙන් දක්වා ඇති බවත් ඒ හේතුවෙන් රියදුරු තනතුරු සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් නොවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුමත කර ඇති බවත් ඒ අනුව බඳවා ගැනීම් සිදු කරන බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා බඳවා ගැනීමක් සිදුකිරීමට ගතවන කාලය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරීගෙන් විමසීමක් කරන ලදී.

ඒ සඳහා මාස දෙකක පමණ කාලයක් ගතවන බවත් සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරාගන්නා ලද පිරිස් සඳහා දින 21ක පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව පරීක්ෂණයක් පැවැත්වෙන බවත් ඉන් සමත් වන අයවලුන් මාර්ගයක ධාවනය කිරීම සම්බන්ධයෙන් ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා යොමු කරන බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

නවක බඳවා ගැනීම සඳහා ගතවන කාලය සැලකිල්ලට ගනිමින් වැටුප් ගෙවීමේ හැකියාව පවතී නම් මාස 06ක කාල සීමාවකට ඩිපෝ සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විශ්‍රාමික බස් රියදුරන් සහ කොන්දොස්තරවරුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා කලාපීය ඩිපෝ ප්‍රධානීන් සතුව හැකියාවක් පවතින්නේ ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

වයස අවුරුදු 60න් පසුව සේවයට බඳවා ගන්නා පුද්ගලයන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කොට ඔවුන් සේවාවක් සැපයීම සඳහා සුදුසු සෞඛ්‍ය තත්ත්වයේ පසු වන්නේ ද යන්න විමසා බැලිය යුතු බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

පොදු ප්‍රවාහන සේවාවක රියදුරු වශයෙන් කටයුතු කිරීම සඳහා පුද්ගලයකුට වයස අවුරුදු 65 දක්වා පමණක් අවස්ථාව හිමිවන බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා හැකියාව පවතින බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

එලෙස බඳවාගැනීම් සිදුකළහොත් අදාළ සේවකයින් සඳහා වැටුප් ගෙවීම් සිදුකරනුයේ කිනම් ආයතනයක් හරහා ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

අදාළ ඩිපෝ හරහා සේවකයන්ට වැටුප් ගෙවීම් කටයුතු සිදුකළ හැකි බව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු තනතුරු සඳහා කාන්තා රියදුරුවරියන් බඳවා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ගරු රවී කරුණානායක මහතා විසින් විමසීමක් කරන ලදී.

නව බඳවා ගැනීම් සිදුකරන අවස්ථාවන්වල දී එකී ඉල්ලීම පිළිබඳ සළකා බැලීමට කටයුතු කරන බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීවරුන් විසින් කාරක සභාවේ දී ඉදිරිපත් කරන ලද ගැටලු සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධ පිළිතුරු වාර්තා අදාළ මන්ත්‍රීවරුන් වෙත ලැබීමට සලස්වන ලෙස ගරු සභාපතිතුමා විසින් නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලදී.

**4.** කාරක සභාව ප.ව. 12.50ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 05**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු වසන්ත සමරසිංහ මහතා (සභාපති)
ගරු උපාලි සමරසිංහ මහතා (සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය)
ගරු අජිත් අගලකඩ මහතා
ගරු (මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු නීතිඥ සරත් කුමාර මහතා
ගරු තිලංක යූ. ගමගේ මහතා
ගරු අජිත් ගිහාන් මහතා
ගරු නිමල් පලිහේන මහතා
ගරු විජේසිරි බස්නායක මහතා
ගරු සුනිල් බියන්විල මහතා
ගරු රියාස් ෆාරුක් මහතා
ගරු සුනිල් රත්නසිරි මහතා
ගරු ආර්. ජී. විජේරත්න මහතා
ගරු ෆස්මින් ෂරීෆ් මහතා
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු අර්කම් ඉල්යාස් මහතා
ගරු තිළිණ සමරකෝන් මහතා

**1.** **නියෝග සලකා බැලීම**

- **2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 160අ, 161ආ, 161ඇ, 161ඈ, 161ඉ, 161ඊ, 161උ, 161එ, 161ඔ සහ 161ඕ වගන්ති සමඟ කියවිය යුතු 204 වගන්තිය යටතේ එවකට වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා, සමූපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ඔක්තෝබර් 22 දිනැති අංක 2407/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග (2025.01.21 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)**

පසුගිය පාර්ලිමේන්තුවේ දී ලබාගත් ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන් ගාස්තු අය කිරීමක් සම්බන්ධයෙන් වූ නියෝග සඳහා රජයේ මුදල් කාරක සභාවේ දී අනුමතිය අවශ්‍ය බව ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් දැනුම් දෙන ලදී.

මෙම රෙගුලාසි අනුමත කිරීමෙන් අනතුරුව භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීම තනි නීතියක් ලෙස ක්‍රියාත්මක වන පළමු අවස්ථාව බවත් මීට පෙර වෙළෙඳ ලකුණු නීතිය යටතේ සහතික කිරීමේ ලකුණක් ලෙස අයදුම්කරුවන්ට භූගෝලීය දර්ශක ලබා දුන් බවත් ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

තනි පුද්ගලයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැකි අතර ආයතනයක් හෝ කණ්ඩායමක් ලෙස අයදුම් කළ හැකි බව ද ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

යම් නිෂ්පාදනයකට එහි පවතින සුවිශේෂීතාවය නිසා ලැබෙන අගයන් භූගෝලීය දර්ශකයක් ලෙස හඳුන්වා දිය හැකි බවත් 1994 වර්ෂයේ දී මෙම සංකල්පය බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ වෙළෙඳ කටයුතු සම්බන්ධිත කරුණු හරහා ඉදිරිපත් වූ බවත් ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

පසු කාලීනව ශ්‍රී ලංකාව සම්බන්ධ වූ අතර 2003 වර්ෂයේ දී භූගෝලීය දර්ශක සහතික කිරීමේ ලකුණක් ලබා දීම සඳහා පනත සංශෝධනය කළ බවත් ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

2014 - 2016 කාලය තුළ අපනයනකරුවන්, ව්‍යවසායකයින් භූගෝලීය දර්ශක සම්බන්ධව යෝජනා කළ තනි නීතියක් ගෙන ඒමට ක්‍රියාමාර්ග ගත් බව ද ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, භූගෝලීය දර්ශක නීතිය 2022 අංක 8 දරන පනතෙන් අනුමත කරගත් බවත් ඒ සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයට අවශ්‍ය රෙගුලාසි පාර්ලිමේන්තු වෙත ඉදිරිපත් කර ඇති බවත් ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

අක්කර පහක කුරුඳු වැවිලිකරුවෙක්ට එනම්, තනි පුද්ගල වැවිලිකරුවෙක්ට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය හරහා භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදු කළ හැකි ද යන්න පිළිබඳව ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මඟින් භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදුකළ නොහැකි බවත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) හරහා ගාස්තු සමඟ විස්තරාත්මක අයදුම් පත්‍රයක් යොමු කළ පසු භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදුකළ හැකි බවත් ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා ස්ටිකරයක් භාවිතා කරන බව ද ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් ද අදහස් දක්වන ලදී.

වර්තමානය වන විට භූගෝලීය දර්ශක ලියාපදිංචි කළ භාණ්ඩ පිළිබඳව ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් නිලධාරීන්ගෙන් විමසීමක් කරන ලදී.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) හරහා කුරුඳු සහ සිලෝන් ටී (Ceylon Tea) සඳහා එක් එක් ප්‍රදේශයේ රස අනුව වෙන වෙනම භූගෝලීය දර්ශක තිබෙන බවත් මෙමඟින් විදෙස් රටවල පහසුවෙන් මෙවැනි භාණ්ඩ ලියාපදිංචි කළ හැකි බවත් ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

Ceylon Golden Pineapple, කිතුල්, කජු, මැණික් වැනි නිෂ්පාදනවලට භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදුකළ හැකි බව ද ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ වන විට සහතික ලකුණක් (Certification Mark) ලෙස පමණක් ක්‍රියාත්මක වීම හේතුවෙන් භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබාදීම අරමුණ වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ දක්වා භූගෝලීය දර්ශක ලබාගැනීමට පනතක් පැවතුනත් ඒ යටතේ රෙගුලාසි නොතිබුණු බවත් මෙම රෙගුලාසි තුළින් භූගෝලීය දර්ශක ලියාපදිංචිය සඳහා අයදුම් කිරීම, එම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම සඳහා රෙගුලාසි සැකසෙන බවත් මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් විසින් අදහස් දක්වන ලදී.

එකම අපනයන භාණ්ඩයකට විවිධ ආයතන කිහිපයකට වෙන වෙනම භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කළ හැකි ද යන්න

පිළිබඳව ගරු (මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා විසින් විමසීමක් කරන ලදී.

එකම නිෂ්පාදනයකට භූගෝලීය දර්ශක ලියාපදිංචි සහතික කිහිපයක් ලබා ගැනීමට නම් කඳුරට තේ, පහතරට තේ වැනි එම එක් එක් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවයේ විවිධත්වයක් පැවතිය යුතු අතර ඒ සඳහා විශේෂිත වූ සංගමයක් මගින් අයදුම් කළ යුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එම සහතික ලකුණ අදාළ පිළිගත් ආයතනයට පමණක් ලබාදෙන බවත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය (Ceylon Tea Board) වැනි ආයතනවලට මෙහෙයවීමට තනි අයිතියක් පවතින බවත් එහිදී එම ආයතන විසින් සැපයුම්කරුවන්ට සහතික ලකුණු ලබා දීම සම්බන්ධයෙන් තීරණ ගනු ලබන බවත් ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ බුද්ධිමය දේපල අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මැණික්වලට භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදු කළ හැකි ද යන්න සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

යම්කිසි ප්‍රදේශයක ඇති එක් නිෂ්පාදනයක් සඳහා පවතින නිෂ්පාදන ක්‍රමවේදයට නිකුත් කළ හැක්කේ එක් භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමක් පමණක් බවත් එබැවින්, එක් නිෂ්පාදනයකට ලබා දිය හැක්කේ එක් භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමක් පමණක් බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ඉන්දියාවේ සිල්ක් සාරිවලට කන්චිපුරම්, වර්ණාසී වැනි සෑම අංශයකටම භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමක් ලබාගෙන ඇති බවත් එලෙස තේ සඳහා "මතුරට ප්ලාන්ටේෂන්" හි නිෂ්පාදනවලට වෙන වෙනම භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදුකළ හැකි ද යන්න සම්බන්ධයෙන් ගරු (මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා විසින් විමසීමක් කරන ලදී.

Dilmah වැනි ආයතනවල Single Origin Tea ලෙස විකිණුම් සිදු කරන බවත් කලවම් තේ විකිණීම සිදු නොකරන නිසා කර්මාන්ත ශාලාවෙන් කර්මාන්ත ශාලාවට භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදුකළ හැකි බවත් එක් කර්මාන්තශාලාවක් සැලකූ විට විවිධ පාරිසරික සාධක හේතුවෙන් තේවල රසය වෙනස් විය හැකි බවත් ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් දැනුම් දෙන ලදී.

භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදු කරන ලද විවිධ රටවලට විශේෂිත වූ වයින් වර්ග ඇති බවත් තේවල රසය හා වර්ණය ඇතුළු සාධක පදනම් කරගනිමින් අවම පිරිවැයක් යටතේ නිෂ්පාදනය මෙන්ම නියමිත ප්‍රතිශතයට අනුව ආනයනික තේ මිශ්‍ර කරන ලද නිෂ්පාදන පවතින බවත් ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නියමිත ප්‍රතිශතයට අනුකූලවම ආනයනික තේ මිශ්‍ර කරන ලද, තේ නිෂ්පාදනවල සංයුතිය පැවතිය යුතු බවත් ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ආනයනික තේ මිශ්‍ර කරන ලද නිෂ්පාදනවල සංයුතිය ට්‍රිප්ස් ගිවිසුමට අනුකූලව පවතී ද යන්න පරීක්ෂා කරන බව ගරු (මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා විසින් දැනුම් දෙන ලදී.

ඉදිරියේ දී භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමට නියමිත නිෂ්පාදන මෙන්ම ගම්මිරිස්, කරාබු නැටි වැනි කුළුබඩුවලට භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සිදු කළ හැකි ද යන්න සම්බන්ධයෙන් ගරු ෆස්මින් ෂරීෆ් මහතා විසින් විමසීමක් කරන ලදී.

මීට ඉහත දී වැවිලි කටයුතු අමාත්‍යාංශය යටතේ සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව මගින් නිෂ්පාදනයට අදාළ අයදුම් පත්‍ර යොමු කළ විට අදාළ භූගෝල දර්ශක ලියාපදිංචිය ලබාගත හැකි බවත් ඒ සඳහා ඉදිරියේ දී අවශ්‍යාම මැදිහත්වීම් සිදු කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

- රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා ඇතුළු බුද්ධිමය දේපළ පනත යටතේ නියෝග සලකා බැලීම සඳහා ම රැස්වූ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හා සම්බන්ධ නිලධාරීන් කාරක සභාවෙන් නික්ම යන ලදී.

## 2. වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් සලකා බැලීම

- **2023 වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් (2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)**

1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත ක්‍රියාත්මක කිරීම මගින් පාරිභෝගිකයන්ට නිවැරදි හා විශ්වාසනීය මිනුම් පද්ධතියක් තුළින් සුරක්ෂිත පාරිභෝගික සමාජයක් ඇති කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යභාර්ය වන බවත් ප්‍රධාන කාර්යාලය ඇතුළු දිස්ත්‍රික්ක 25ක කාර්ය සාධනය ඇසුරෙන් මෙම කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

කාර්ය සාධන වාර්තාවට පාර්ලිමේන්තුවේ අනුමතිය ලබා ගැනීමට පෙර මෙම කාරක සභාවේ අනුමතිය අවශ්‍ය බැවින් 2023 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2024.05.31 වන විට ලබා දිය යුතු අතර ප්‍රමාදයකින් තොරව කඩිනමින් වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරියේ දී ඉදිරිපත් කළ යුතු බවට ගරු සභාපතිතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාව නියමිත දිනයට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් එක් දිස්ත්‍රික්කයක හෝ කාර්ය සාධනය ප්‍රමාද වීම සමස්ත වාර්තාවේ ප්‍රමාදයට බලපාන බවත් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

2025 වර්ෂයේ දිස්ත්‍රික්ක 25 ජාලගත කිරීමෙන් මාර්ගගත ක්‍රමවේදයකට වඩා කාර්යක්ෂමව මෙම කාර්ය සාධන වාර්තා ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් එහි වැඩකටයුතු 35%ක් පමණ

අවසන් බවත් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් නියෝගවලට සහ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්වලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු වසන්ත සමරසිංහ මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 3. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව, අමාත්‍යාංශ ලේකම් අදාළ ආයතන සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

වෙළෙඳපොළ තුලනයට පියවර ගනිමින් පවතින බවත් අමාත්‍යාංශයට අදාළ ආයතනවල ඉදිරි වැඩපිළිවෙළ මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බව ද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශයේ ඉදිරි වැඩපිළිවෙළට අදාළ යෝජනා හා විවේචන ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දෙන ලදී.

## 4. වෙනත් කරුණු

### 4.1 ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා

#### 4.1.1 රටේ සහල් පරිභෝජනය පුරෝකථනය කිරීම

වර්තමානයේ පවතින හාල් හිඟය උද්ගත වීමට පෙර ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයක් ලෙස පුරෝකථනයක් සිදුකර තිබුණේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

රටේ වාර්ෂික සහල් පරිභෝජනය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික සහල් අස්වැන්න පිළිබඳ දත්ත ලබා ගනිමින් පසුගිය ඔක්තෝබර් මස වන විට සහල් මෙට්‍රික් ටොන් 7,000ක් අවශ්‍ය බව පුරෝකථනය කර තිබූ බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

පාරිභෝගික සේවා අධිකාරිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශයත් ඒකාබද්ධව ගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා පැවැත්වූ බවත් සංඛ්‍යාලේඛන අනුව මාස 02කට සහල් අතිරික්තයක්

ඇති වන බවට පුරෝකථනය කළ අතර විවිධ පාරිසරික හේතු මත එම දත්ත වෙනස් වන බවත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

පාරිභෝගිකයින්ගෙන් 65%ක් පමණ පරිභෝජනය කරන නාඩු සහල්, සති දෙකකට ප්‍රමාණවත් පරිදි මෙට්‍රික් ටොන් 70,000ක් ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කළ බවත් මාස තුනහමාරකට ප්‍රමාණවත් විය යුතු සහල් මෙට්‍රික් ටොන් 170,000ක් ආනයනය කළ ද මෙම සහල් හිඟය ඇතිවීම හේතුවෙන් පුරෝකථනය සඳහා උපයෝගී කරගන්නා ලද දත්ත පිළිබඳ ගැටලුවක් ඇති බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කුඩා සහල් මෝල් හිමියන්ගෙන් 62%ක් පමණ සහල් සැපයුමක් ඇති බැවින් පසුගිය දත්තවලට අනුව මහ කන්නයේ අස්වැන්න මාස 7කට ප්‍රමාණවත් වන අතර මෙට්‍රික් ටොන් ලක්ෂ 04ක් පමණ අතිරික්ත විය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් නියාමන කටයුතු සිදු කරන බවත් සහල් ගෙන්වීම සිදු කළ හැක්කේ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC) සහ සමූපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) හරහා පමණක් බවත් මේ වන විට පවතින සහල් ප්‍රමාණය ප්‍රමාණවත් බවට පුරෝකථනය කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.1.2 දත්ත පද්ධති යාවත්කාලීන කිරීම

සෑම අංශයකම පසුගිය දත්ත පද්ධතිවල පවතින අක්‍රමිකතා හේතුවෙන් පුරෝකථනයේ දී ගැටලු මතු වීම නිසා මෙම දත්ත පද්ධති යාවත්කාලීන කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

ජනාධිපති ලේකම් කාර්යාලය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය හා වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය ඒකාබද්ධව ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ කමිටුවක් පත් කර සෑම පුද්ගලයෙකුටම භාවිතා කළ හැකි නිවැරදි දත්ත පද්ධතියක් නිර්මාණයට මෙම කමිටුවේ දී සාකච්ඡා කළ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, දත්ත පද්ධතියට අමාත්‍යාංශය ඇතුළු වෙනත් ආයතන විසින් ඇතුළත් කරන දත්ත ගබඩා විය යුතු අතර එම දත්ත සඳහා අදාළ ආයතන වග විය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.1.3 රටේ සහල් ප්‍රමාණය ගණනයට විධිමත් පද්ධතියක් ස්ථාපනය කිරීම

සීමාසහිත ලංකා සතොස හා සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව යන ආයතන ක්‍රියාත්මක වීමේ දී පවතින දුරස්ථභාවය මගහරවා ගැනීමට කටයුතු කිරීම මෙන්ම වෙළෙඳපොළ පවතින සහල් ප්‍රමාණය ගණනයට විධිමත් පද්ධතියක් ඇති කිරීමට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

සීමාසහිත ලංකා සතොස ආයතනයේ බෙදාහැරීමේ ජාලය, සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට පවරා තිබූ බවත් මේ වන විට සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව ප්‍රතිස්ථාපනය කරමින් පවතින බවත් පෙර පැවැති දේශපාලන අධිකාරිය විසින් පසුගිය සැප්තැම්බර් මාසයේ දී සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව සතු වාහන 52ක් වෙළෙඳපොළ මිලටත් වඩා අඩුවෙන්ම විකුණා ඇති බැවින් මෙම බෙදාහැරීමේ ජාලය සම්පූර්ණයෙන්ම බිඳ වැටී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ආයතන අමාත්‍යාංශය හා පළාත් සභා යටතේ වෙන් වෙන්ව පාලනය වීම නිසා ජාලගත ක්‍රමයකින් සම්බන්ධීකරණය වී නොමැති බැවින් පාරිභෝගික සේවා ක්‍රියාවලිය මෙන්ම මූල්‍ය ක්‍රියාවලි නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව ගොඩනැගීම මෙන්ම භාණ්ඩ බෙදා හැරීමේ ක්‍රියාවලිය ගම දක්වා ගෙන යෑමට ක්‍රියාත්මක කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රධානීන්ගේ දුරකථන අංක කාරක සභික මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.2 ගරු ෆස්මින් ෂරීෆ් මහතා

### 4.2.1 දැනට ක්‍රියාත්මක වන සමූපකාර සමිති හා සමාගම්වල පවතින අක්‍රමිකතා

මෙම ආයතනවල විශාල අක්‍රමිකතා, දූෂණ, වංචා සිදුවන බැවින් එම ආයතනවල සභාපතිවරුන් නැවත පත්කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සමූපකාර සමිති හා සමාගම්වල ඡන්ද පැවැත්වීම අතුරු ව්‍යවස්ථා සංශෝධනයකින් අනතුරුව සිදු කළ යුතු බවත් එහිදී එම අතුරු ව්‍යවස්ථාවට, ඡන්දය ඉල්ලන සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවුරුද්දක් පමණ විය යුතු වීම යන්න ඇතුළත් කළ යුතු බවත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව එම සංශෝධිත අතුරු ව්‍යවස්ථාව පළාත් කොමසාරිස් හෝ මධ්‍යම රජයේ කොමසාරිස් විසින් අනුමත කළ යුතු බව ද සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් දැනුම් දෙන ලදී.

නැවත මෙම ආයතන ප්‍රතිසංවිධාන කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබුණු බවත් ඉදිරි උපදේශක කාරක සභාවක දී සමූපකාර සමිති හා සමාගම් පිළිබඳව පුළුල් සාකච්ඡාවක් පැවැත්වීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු නිමල් පලිහේන මහතා ද මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

### 4.2.2 සීමාසහිත ලංකා සතොස ආයතන පාඩු ලැබීම

වෙනත් සුපිරි වෙළෙඳසැල්වලට සාපේක්ෂව සීමාසහිත ලංකා සතොස ශාඛාවල විකිණීමට ඇති විවිධාංගීකරණය වූ නිෂ්පාදන අඩු බවත් නාගරික ප්‍රදේශවල කුලී පදනම් මත ලබාගන්නා ගොඩනැගිලිවල සීමාසහිත ලංකා සතොස ආයතන පවත්වාගෙන යාමට විශාල පිරිවැයක් යෙදවීම හේතුවෙන් පාඩු ලැබීම සිදුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සීමාසහිත ලංකා සතොස ආයතනයේ 3,300ක් පමණ ලියාපදිංචි භාණ්ඩ අතරින් දැඩි ඉල්ලුමක් පවතින භාණ්ඩ 450ක් පමණ හඳුනාගෙන ඇති අතර සෑම ශාඛාවකටම නිසි පරිදි භාණ්ඩ බෙදා හැරීම දෛනිකව නියාමනය වන බවත් රතු සහල් හැරුණු කොට වෙනත් විශේෂිත භාණ්ඩයක් නොමැති වුවහොත් ඒ සම්බන්ධයෙන් තම ආයතනයට දැනුම් දෙන ලෙසත් සීමාසහිත ලංකා සතොස ආයතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

සීමාසහිත ලංකා සතොස ආයතනයේ ශාඛා 451න් 225ක ප්‍රමාණයක අලාභ පවතින අතර එයින් ශාඛා 40ක් මෙම මස දී ලාභදායී තත්ත්වයට පත් කිරීමට පියවර ගෙන ඇති බවත් 2013 - 2024 කාල පරාසය තුළ රු. බිලියන 24ක අලාභයක් ද, 2023 හා 2024 වර්ෂවල පිළිවෙලින් රු. මිලියන 650ක හා රු. මිලියන 1.2ක පමණ අලාභයක් ඇස්තමේන්තු ගත කර ඇති අතර පෙර පැවතුණු සීමාසහිත ලංකා සතොස ආයතනයේ තොග අස්ථානගත වීම මෙන්ම (Inventory Loss) ලේඛනගත නොවීම සිදු වී ඇති බවත් ලංකා සතොස ලිමිටඩ් ආයතනයේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ගැටලු මාස තුනක සැලැස්මකට අනුව නිවැරදි කරමින් පවතින බවත් 2025 ජනවාරි මාසයේ දී රු. බිලියන 4.8ක ඇස්තමේන්තුගත ආදායම රු. බිලියන 4.9 දක්වා ඉහළ ගිය බවත් සීමාසහිත ලංකා සතොස ආයතනයේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

විවිධ දේශපාලන බලපෑම් මත ආරම්භ කරන ලද සීමාසහිත ලංකා සතොස ආයතනය ප්‍රතිස්ථානගත කරන බවත් ශාඛා 600ක් දක්වා ඉහළ දැමීමට අයදුම්පත් කැඳවා ඇති අතර වෙළෙඳපොළ අධ්‍යයනයකින් අනතුරුව එම ශාඛා ආරම්භයට පියවර ගන්නා බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, 2024 සැප්තැම්බර් මස වන විට සීමාසහිත ලංකා සතොස ආයතනය වසා දැමීමට තීරණය කර තිබූ බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.2.3 සීමාසහිත ලංකා සතොස ආයතනය අනිසි ලෙස භාණ්ඩ කඩහිමියන්ට විකිණීම

සීමාසහිත ලංකා සතොස ආයතනයේ සහන මිලට බඩු ලබා දුන්න ද වැඩි ප්‍රමාණයක් අනිසි ලෙස කඩහිමියන්ට විකුණන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවලිය පාරිභෝගික අධිකාරියෙන් නියාමනය වන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මීට පෙර එසේ සිදුවුවත් වර්තමානයේ දී, සිදු නොවන බවත් එසේ සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සීමාසහිත ලංකා සතොස ආයතනයේ ගෙවීම් පියවන අවස්ථාවේදීම තොරතුරු පද්ධතිය ස්වයංක්‍රීයව භාණ්ඩ සීමිතව මුදාහරින අයුරින් සකසා ඇති බව සීමාසහිත ලංකා සතොස ආයතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 4.3 ගරු විජේසිරි බස්නායක මහතා

### 4.3.1 සමූපකාර ශාඛාවල ඉදිරි න්‍යායාත්මක වැඩපිළිවෙළ

විසි එක් වන ශතවර්ෂයේ පාරිභෝගිකයාට අනුව ශාඛා 300කට වැඩි සමූපකාර ශාඛාවල දැක්ම, ක්‍රමෝපායන් හා කළමණාකාරීත්වය වෙනස් යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් පවතින ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

බස්නාහිර පළාතේ සමූපකාර ණය දෙන සමිති 68ක විවිධ ගැටලු පවතින බවත් ඒ සම්බන්ධයෙන් වැඩ කටයුතු සිදු කරමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.3.2 මහපොළ ශිෂ්‍යත්වය දරුවන්ට නිසි පරිදි ලබාදීම

මහපොළ ශිෂ්‍යත්වය දරුවන්ට නිසි පරිදි නොලැබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පසුගිය මාස කිහිපයක පසුබෑමක් තිබූ දරුවන්ගේ ශිෂ්‍යාධාර ලබාදීමට අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරයෙන් ගෙවන බවත් විශ්වවිද්‍යාල සිසුන්ට මහපොළ ලබාදීමේ දී මහපොළ භාරකාර අරමුදලින් රු.2,650/-ක් හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් රු.2,450/-ක් දරන බවත් ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මහපොළ ශිෂ්‍යත්වය දරුවන්ට ලබාදීමට මහා භාණ්ඩාගාරයෙන් මාස කීපයකින් මුදල් ලැබී නොමැති අතර එම මුදලින් කොටසක් ලැබීම හේතුවෙන් 2024 ඔක්තෝබර් ශිෂ්‍යත්ව පසුගිය සතියේ නිකුත් කළ බව ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

රු. 5,000/-ක් ගෙවීමේ පදනම මත රු. මිලියන 563ක මුදලක් රජයෙන් ලැබිය යුතු බවත් ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන

ශිෂ්‍යත්ව භාර අරමුදලෙන් පමණක් ගෙවීම් සිදු කළහොත් ඉදිරි වසර තුන අවසානයේ ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වසා දැමීමට සිදුවන බවත් ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ පිළිබඳ විශ්වවිද්‍යාල කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කළ බවත් ඉදිරි මාස 03 ඇතුළත මෙම ක්‍රියාවලිය යාවත්කාලීන කරන අතර ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මෙවර අයවැයෙන් වැඩි කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.4 වර්තමානයේ පවතින වී මිල - ගරු රියාස් ෆාරුක් මහතා**

වර්තමානයේ පවතින වී මිල සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විමසීමක් කරන ලදී.

නාඩු වී මිල රු.120/-, සම්බා වී මිල රු.125/-ක් ලෙස 14%ක තෙත මාපක අගයකට යටත්ව අද දින වී මිල ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබුණු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සහල් මිල සම්බන්ධයෙන් සැපයුම්කරුවන් කැඳවා ඉදිරියේ තීරණය කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.5 සමූපකාර ආශ්‍රිත ආයතන විධිමත්ව පවත්වාගෙන යෑමට වැඩපිළිවෙලක් සකස් කිරීම - ගරු නිමල් පලිහේන මහතා**

පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනය සහ ප්‍රාදේශීය පුහුණු ආයතන න්‍යායාත්මකව මෙන්ම ප්‍රායෝගික පුහුණුව තුළින් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කිරීමට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

**4.6 ගරු අසෝක සපුමල් රන්වල මහතා**

**4.6.1 ප්‍රාදේශීයව පවතින භාණ්ඩ හිඟය මැඩලීමට විවිධ සේවා සමූපකාර සමිති යොදා ගැනීම**

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම විවිධ සේවා සමූපකාර සමිති මෙන්ම ගබඩා සංකීර්ණ පවතින බැවින් ප්‍රාදේශීය භාණ්ඩ හිඟය මැඩලීමට මෙම ආයතන යොදා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මෙම ආයතනවලට ඍජුවම බඩු ගෙන්වා බෙදා හැරීමට කටයුතු සැලසිය හැකි ද යන්න සම්බන්ධයෙන් ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) ප්‍රතිස්ථාපනයට යෝජනාවලියක් සකස් කර ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති බවත් සියලු සම්පත් උපයෝගී කරගනිමින් ආයතන යළි ගොඩනැගීම සමූපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) හරහා භාණ්ඩ බෙදා හැරීම

සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතින බවත් සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

කොළඹ, මාතර, කුරුණෑගල සමූපකාර තොග වෙළෙඳ මධ්‍යස්ථාන තුනක් ආරම්භ කිරීමට මෙන්ම 2027 වසර අවසන් වන විට පෞද්ගලික අංශවලටත් මිලදී ගැනීම් සිදු කළ හැකි ආකාරයට බෙදා හැරීම් ජාලය ස්ථාපනයට මෙන්ම ශක්තිමත් කිරීමටත් අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ලොරි රථ 90ක් පමණ වෙන්දේසි කළ පසු මාස 12කට පමණ අධික කාලයක් ඉතිරි ලොරි රථ 41 නවතා ඇති බවත් සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

දේශීය ධාන්‍යවලට නිසි වෙළෙඳපොළ හඳුන්වා නොදීම හේතුවෙන් මීට පෙර ඒවා ආනයනය කර ඇති බවත් මේ සඳහා නිෂ්පාදන සමූපකාර සමිති 1,000ක් පමණ ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම මාසයේ වවුනියාවේ දී පළමු සාකච්ඡාව පවත්වන බවත් මූලිකවම ඇන්ලීන් වැනි සමාගම් සමඟ ඒකාබද්ධව බඩ ඉරිඟු, වියලි මිරිස්, කුරුඳු, මුං ඇට, කව්පි හා තල යන ධාන්‍යවලට නිෂ්පාදන සමූපකාර 6ක් ඇති කිරීමට අපේක්ෂා කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙමගින් වැවිලිකරුවන්ගේ ජන ජීවිතය නගා සිටුවීම අතරමැදියන් විසින් උපයා ගන්නා ලද ලාභ වැවිලිකරුවන්ට සම්ප්‍රේෂණය මෙන්ම මේ සඳහා ස්ථිර මිලක් නියම කර වැවිලිකරුවන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීම සිදුකිරීමට අපේක්ෂා කරන බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.6.2 සමූපකාර තොග වෙළඳ සංස්ථාවට (CWE) සෘජු ආනයනයට අවසර දීම

යම්කිසි භාණ්ඩයක හිඟයක් වෙළෙඳපොළෙහි ඇති වූ විට, එය පියවා ගැනීමට සමූපකාර තොග වෙළඳ සංස්ථාවට (CWE) සෘජු ආනයනයට අවසර දීමේ ශක්‍යතාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඇතැම් භාණ්ඩ සෘජු ආනයනයට අමාත්‍ය මණ්ඩල අනුමතිය අවශ්‍ය අතර අනෙකුත් ආනයනයට විවෘතව භාණ්ඩ ගෙන්විය හැකි බවත් සහල් සෘජු ආනයනයට විවෘත කළ අවස්ථාවේ ඕනෑම ව්‍යාපාරිකයෙක්ට ආනයනය කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) හරහා ඉදිරියේ දී සෑම සමූපකාරයකටම හා සීමාසහිත ලංකා සතොස ආයතනයකටම අවශ්‍ය භාණ්ඩ එම ගබඩා වෙත ලබා දීමට සැලසුම් කරමින් පවතින බවත් එවිට වෙළෙඳපොළ භාණ්ඩ හිඟයන්වලට සාර්ථක විසඳුමක් ලබාගත හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් පත්‍රයක් යොමු කිරීම මගින් 2025.02.28 වැනි දින දක්වා ලුණු ආනයනය කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ලුණු සම්බන්ධව පවතින දත්තවල නිරවද්‍යතාවය පිළිබඳව ගරු (මහාචාර්ය) එල්. එම්. අබේවික්‍රම මහතා විසින් විමසීමක් කරන ලදී.

ලුණු ලේවායන්වල මෙට්‍රික්ටොන් 200,000 නිෂ්පාදන ධාරිතාව පවතින අතර ලුණු පාරිභෝජනය මෙට්‍රික්ටෝන් 150,000 – 180,000 වන බවත් පාරිසරික හේතු මත පසුගිය වර්ෂයේ අස්වැන්න අඩුවීම වෙළෙඳපොළ ලුණු හිඟයට හේතු වූ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එවැනි අවස්ථාවකට මෙට්‍රික්ටොන් 30,000ක් ආනයනය ප්‍රමාණවත් වන බවට කර්මාන්තකරුවන් අදහස් දැක්වූ බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පුත්තලම හා දකුණේ ලුණු නිෂ්පාදනාගාර තුනක් ස්ථාපනයට මෙන් ම ලුණු අතිරික්තය අපනයනයට ද අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.7 ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) ගොඩනැගීමට ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි මුදල් යොදා ගැනීම - ගරු සුනිල් රත්නසිරි මහතා**

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) ගොඩනැගීමට ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි මුදල් යොදා ගනු ලැබුවේ ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වර්තමානයේ ඉහළ කළමනාකාරිත්වය නොමැති මහපොළ භාරකාර අරමුදල යටතේ පෞද්ගලික සමාගම් 02ක් පවතින බවත් ඒ සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු තම ආයතනය සතුව මේ වන විට නොපවතින බවත් ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

විගණනයක් සිදුකර එය අනාවරණය කර ගැනීමට අපේක්ෂා කරන බව ද ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) බදු මුදලක් ලෙස රු. මිලියන 24ක් ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ගෙවන බව ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම පිළිතුර සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි බවත් කඩිනමින් නීතිය ක්‍රියාත්මක කිරීමටත් රටේ අභිවෘද්ධිය සඳහා රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලු දේශපාලන අධිකාරිය එක් අරමුණකින් වැඩ කිරීම අත්‍යවශ්‍ය බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල හරහා ශිෂ්‍යයින් 70,000කට පමණ අරමුදල් ලබාදෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම අරමුදල් සම්බන්ධයෙන් පමණක් අභ්‍යන්තර විගණනයක් සිදුකළ බවත් මීට පෙර රජයේ විගණන අංශයෙන් ව්‍යෝහාරික විගණනයක් සිදුකර විගණන වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බවට වාර්තා වුවත් එය කිසිම ආයතනයකට ඉදිරිපත් නොවී ඇති බවත් ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් දැනුම් දෙන ලදී.

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සතු රු. මිලියන 1,900ක වියදමින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) ගොඩනගා ඇති අතර එම ඉඩම මේ වන විටත් ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සතු බවත් රු. මිලියන 97ක් ලබාගෙන රු. මිලියන 37ක් නැවත ගෙවා ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.8 පාරිභෝගික කටයුතුවල නියැලෙන සමුපකාර සමිති සංවර්ධනය - ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

හපුතලේ නගරයේ තෛයිපොංගල් දිනයේ රතු සහල්වල මිල රු. 360/-ක් වැනි ඉහළ මිලකට අලෙවි වූ බවත් මෙම සමුපකාර සමිති සංවර්ධනයට කඩිනමින් පියවර ගත යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

විවිධ සේවා සමුපකාර සමිති ශක්තිමත් කිරීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ද යෝජනා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.9 ගරු තිලංක යූ. ගමගේ මහතා**

**4.9.1 සාමාන්‍ය සිල්ලර අලෙවිසැල්වලට වඩා සමුපකාරවල ඇතැම් භාණ්ඩවල මිල අධික වීම**

සාමාන්‍ය සිල්ලර අලෙවිසැල්වලට වඩා සමුපකාරවල ඇතැම් භාණ්ඩවල මිල අධික බවත් ඒ හේතුවෙන් අධ්‍යක්ෂක මණ්ඩල විශාල ලාභ පෙන්වමින් සිටින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.9.2 යක්කලමුල්ල ප්‍රදේශයට සීමාසහිත ලංකා සතොස ශාඛාවක් ස්ථාපිත කිරීම**

මෙම ප්‍රදේශයට සීමාසහිත ලංකා සතොස ශාඛාවක් නොමැති අතර එහි ශාඛාවක් කිලෝමීටර 18ක් පමණ දුරින් තිබීම හේතුවෙන් සතොස ශාඛාවක් ස්ථාපිත කර දෙන ලෙසට ගරු මන්ත්‍රිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සීමාසහිත ලංකා සතොස ශාඛා වර්ග 04ක් තිබෙන බවත් වරලත් ව්‍යාපාර ලෙස සීමාසහිත ලංකා සතොස ශාඛාවක් විවෘත කිරීමට අපේක්ෂා කරන බවත් සීමාසහිත ලංකා සතොස ආයතනයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

**4.10 විවිධ සේවා සමූපකාර සමිති ප්‍රතිව්‍යුහගතකරණය කිරීම - නියෝජ්‍ය අමාත්‍ය ගරු උපාලි සමරසිංහ මහතා**

විවිධ සේවා සමූපකාර සමිති සාමාන්‍යාධිකාරී ඇතුළු රාජ්‍ය නිලධාරින් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත වන අතර මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීමට අපහසු බවත් ඒ සඳහා සැලසුම් සකස් කරමින් පවතින බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

විවිධ සේවා සමූපකාර සමිති සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩපිළිවෙළ මීළඟ කාරක සභාවේ දී ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**5.** කාරක සභාව ප.ව. 12.45කට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

-----------------------------------------------------------------------------------

**කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 21**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (සභාපති)
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා හා ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍ය )
ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය
ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු හේමාලි වීරසේකර මහත්මිය
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය
ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
ගරු එම්. ඒ. සී. එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

## 1. වෙනත් කරුණු

### 1.1 ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා

#### 1.1.1 1939 අංක 48 දරන ළමා හා යෞවන ආඥාපනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ගන්නා ලද ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ විමසීම

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට පැවරී ඇති 1939 අංක 48 දරන ළමා හා යෞවන ආඥාපනත සංශෝධනය කිරීම පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.
ළමා ආරක්ෂණය පළාත් විෂය පථයට අයිති බවත් අධිකරණ විෂය පථය රේඛීය අමාත්‍යාංශයට අයත් වීම ගැටලුවක් බවත් ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

1939 අංක 48 දරන ළමා හා යෞවන ආඥාපනත සංශෝධනය කිරීම පිළිබඳ අවසන් තීරණය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට පැවරී ඇති බවත් ගෘහස්ථ හිංසනය පිටු දැකීම සම්බන්ධව නව පනතක් පිළිබඳව සාකච්ඡා කරමින් පවතින බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරියේ සභාපති සුහද ගම්ලත් මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවත් තවත් ආයතන කිහිපයක් හා රාජ්‍ය නොවන සංවිධානත් නියෝජනය වන පරිදි විශේෂඥවරුන්ගේ කමිටුවක් පිහිටුවා ඇති බවත් එම කමිටුව පිහිටුවන අවස්ථාවේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේම ළමා ආරක්ෂණය විෂය ක්‍රියාත්මක වූ බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට ළමා ආරක්ෂණය විෂය පථය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ගැසට් කර ඇති බව ද ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

නව අමාත්‍යවරයෙක් පත්වීම නිසා, පැවති කමිටුව අහෝසි වූ බවත් නැවත නව කමිටුවක් හරහා ක්‍රියාත්මක වීමට සැලකිය යුතු කාලයක් ගත වීම හේතුවෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ මෙම කමිටුව හරහාම ක්‍රියාත්මක කිරීමට එකඟතාවය විමසා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම් හරහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්ට ලිපියක් ඉදිරිපත් කර පිළිතුරු අපේක්ෂාවෙන් සිටින බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ සඳහා කාලරාමුවක් ලබාදෙන ලෙස ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් ඉල්ලීමක් කරන ලදී.

කාලරාමුව පිළිබඳ එකඟතාවය පළ කර ලිඛිතව දැනුම් දෙන බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.1.2 ශාරීරික දණ්ඩනය

දරුවන්ට කෲර ලෙස දඬුවම් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ශාරීරික දණ්ඩනය තහනම් කිරීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

පසුගිය වර්ෂයේ දී දණ්ඩ නීති සංග්‍රහයේ (Penal Code) 308 (අ) වගන්තියට සංශෝධනයක් වශයෙන් ශාරීරික දණ්ඩනය තහනම් කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ බවත් නව රජය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් නැවත අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කර එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ යුතු බවත් නීති නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) වැනි සංවිධාන මේ සඳහා අවශ්‍ය සහාය ලබාදීමට පසුගිය වර්ෂයේ කොළොම්බියාවේ පැවැති සම්මේලනයක දී එකඟතාවය පළ කළ බවත් මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව දැනුවත් කිරීම් හා අනෙකුත් චක්‍රලේඛ සකස් කර ගැනීමට පෙර, ඉදිරිපත් කිරීමට නියමිත පනත් කෙටුම්පත තවදුරටත් සංශෝධනය කළ යුතු බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

ශාරීරික දණ්ඩනය තහනම් කිරීම පාසල්වලට මෙන්ම දෙමාපියන්ටත් බලපාන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් තමා පෞද්ගලිකව එකඟවන බවත් 2005න් පසු පාසල්වල ශාරීරික දණ්ඩනය නවතා ඇති බවත් ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ශාරීරික දණ්ඩනය තහනම් කිරීම හැරුණු කොට ගුරුවරුන්ට හා දෙමාපියන්ට අදාළ වන පරිදි මානසික හිංසනය මෙම සංශෝධනවලට ඇතුළත් කර ඇති බව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් දැනුම් දෙන ලදී.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි 10,000න් 3,000ක් පමණ දරුවන්ගේ භාරය සහ ආරක්ෂාව දරන අය දරුවන්ට හිංසා කිරීම සම්බන්ධයෙන් වන අතර එසේ ශාරීරිකව හෝ මානසිකව හිංසනයට පත් කිරීම, දණ්ඩ නීති සංග්‍රහයේ 308 වගන්තිය අනුව අවුරුදු 2-10ත් අතර සිර දඬුවම් ලැබිය යුතු වරදක් බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නියමාකාරව නීතිය ක්‍රියාත්මක කළහොත් අඩන්තේට්ටම් කිරීම සහ මානසික හිංසනය පවා කෲරත්වය ලෙස සැලකිය යුතු බවත් සමාජය තුළ පවතින සංස්කෘතික ගැටලු නිසා නීතිය ක්‍රියාත්මක කිරීම අපහසු බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මානසික හිංසනය අධිකරණයක දී තහවුරු කිරීමේ ක්‍රමවේදය පිළිබඳ ගරු සභාපතිතුමිය විසින් විමසීමක් කරන ලදී.

මානසික සෞඛ්‍ය සම්බන්ධ වෛද්‍ය වාර්තා කැඳවීම මඟින් තහවුරු කළ හැකි බව ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

දරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම නීතියේ ආරක්ෂාව උපරිමයෙන් පවතින රටක තිබිය යුතු ප්‍රධානතම අංගයක් ලෙස, පාසල්වල විනය පොදු රාමුවකට අනුගත කළ යුතු බවත් ගුරුවරුන් වැඩමුළු හරහා දැනුවත් කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

ළමයින්ව ශික්ෂණය කරන ආකාරය සම්බන්ධයෙන් ගුරු අත්පොතක් (Module) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මනෝ සමාජීය අංශයෙන් සකස් කර ඇති බවත් එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිකම ගැටලුවක්ව පවතින බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් දැනුම් දෙන ලදී.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය විසින් ද මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

### 1.1.3 දරුවෙක් ජීව විද්‍යාත්මක පවුලෙන් වෙන් කිරීම

අන්තර්ජාතික ළමා ප්‍රඥාප්තියට අත්සන් තැබීමෙන් අනතුරුව දරුවා ජීව විද්‍යාත්මක පවුලෙන් වෙන් කරන්නේ නම් එය බලධාරියෙක් විසින් සිදු කළ යුතු බව ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

දරුවන් මහණ කිරීමේදී ද පන්සලකට යොමු කළත් භාරකරුවන් වෙනස් නොවන බැවින් ළමයින් හා යෞවනයන් ආඥාපනත යටතේ මහණ කරන මොහොතේදීම, මහණ කිරීමෙන් පසු භාරකරු නම් කර නීත්‍යනුකූලව ලියාපදිංචි කළ යුතු බව ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

එම නම් කරන ලද භාරකරු හරහාම මහණ කරන ලද දරුවාට සෞඛ්‍ය ඇතුළු ප්‍රතිකාර කළ හැකි බව ගරු අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කුලදරුවන් උපසම්පදා කිරීමේ දී හැඳුනුම්පත සැකසීම, භාරකාරත්වය නම් කිරීම හා පන්සල නම් කිරීම ක්‍රමවත්ව සිදුකරන බවත් මෙම ගැටලු මෙහෙණින් වහන්සේලා සම්බන්ධයෙන් පමණක් උද්ගත වන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

තමන් පෙර මහණ වූ භික්ෂුණිය යටතේ සිල් මාතාවක්ව පැවිදිව සිටීම සාමාන්‍ය සම්ප්‍රදාය බව ගරු අමාත්‍යතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

පොදු ස්ථානවලදී භික්ෂූන් වහන්සේලාට හිමිවන පිළිගැනීම කන්‍යා සොහොයුරියන් හා භික්ෂුණීන් වහන්සේලාට හිමි නොවන බව බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී.

## 1.2 ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

### 1.2.1 යාපනය දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථානවලට දෙමළ කතා කළ හැකි කාන්තා නිලධාරිනියක් පත් කිරීම

යාපනය දිස්ත්‍රික්කය තුළ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (gender base violence) හා ළමා අපචාර බොහොමයක් සිදුවූවත් විවිධ සංස්කෘති ගැටලු හේතුවෙන් පොලිසියට පැමිණිලි නොකරන බවත් පොලිස් ස්ථානවල සිංහල කතා කරන පිරිමි නිලධාරීන් පමණක් සිටින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ග්‍රාම නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් එම පැමිණිලි ඉදිරිපත් කරන දිනයේම, වාර්තා කිරීමට පහසු වීම සඳහා පොලිස් ස්ථානවලට දෙමළ කතා කළ හැකි කාන්තා නිලධාරිනියක් පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.2.2 සෑම ප්‍රදේශයකම මානසික උපදේශන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම

උතුරු පළාතේ කාන්තාවන් අතර රැකියා වියුක්තිය ඉහළ බවත් සෑම ප්‍රදේශයකම මානසික උපදේශන සේවා මධ්‍යස්ථාන පිහිටුවිය යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන කාන්තාවන්ට විශේෂයෙන්ම රැඳවුම් මධ්‍යස්ථාන මෙන්ම නීතිමය සහාය ද අවශ්‍ය බව අධිකරණ සහ ජාතික ඒකාබද්ධ අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය ද මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

කිලිනොච්චිය, මඩකලපුව හා නුවරඑළිය වැනි ප්‍රදේශ ඇතුළුව මේ වන විට රැඳවුම් මධ්‍යස්ථාන 10ක් ද සෑම පොලිස් ස්ථානයකම ගෘහස්ථ හිංසන කවුළුවක් (domestic violence desk) ස්ථාපිත කර එයට ගැටලු ඉදිරිපත් කිරීමට පහසුකමක් ද සලසා ඇති බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

රැඳවුම් මධ්‍යස්ථානවල දී නොමිලේ නීති උපදෙස් ලබා දෙන බැවින් හිංසනයට ලක් වන කාන්තාවන් යොමු කළ හැකි බව නීති නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක් වූ කාන්තාවන් රෝහල් ගත වී රෝහලින් පිටවීමේ දී නැවත නිවසට යාමට නොහැකි අවස්ථාවල දී මෙම රැඳවුම් මධ්‍යස්ථානවලට යොමු කළ හැකි බව ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා විසින් දැනුම් දෙන ලදී.

එම මධ්‍යස්ථානවල ආහාර, උපදේශනය වැනි සේවාවන් පවතින බවත් සෑම දිස්ත්‍රික්කයකම මෙවැනි මධ්‍යස්ථාන පිහිටුවීමට ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා විසින් යෝජනා කරන ලදී.

## 1.3 ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

### 1.3.1 ළමා නිවාසවලට කාලානුරූපීව ක්‍රමවත් සමීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම

ළමා නිවාසවලින් 50%කට මූලික පහසුකම් නොමැති බවත් මෙම ළමා නිවාසවලට විවිධ පාර්ශ්වවලින් ප්‍රතිපාදන හා පරිත්‍යාග ලැබෙන බැවින් ළමා නිවාස පවත්වාගෙන යාම ව්‍යාපාරයක් වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ළමා නිවාසවලට කාලානුරූපීව ක්‍රමවත් සමීක්ෂණයක් සිදුකර ප්‍රමිතිගත පරිපාලන ව්‍යුහයක් ක්‍රියාත්මක කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

උතුරු නැගෙනහිර ප්‍රදේශවල පශ්චාත් යුධ සමය අවසන් වූ පසු දෙමාපියන් නොමැති දරුවන් සිටීම, මව මැදපෙරදිග රැකියාවකට විදේශගත වීම මෙන්ම දරිද්‍රතාවය ද දැඩි ලෙස පවතින බවත් මේ හේතුවෙන් ළමා නිවාසවලට භාරකරුවන් විසින්ම දරුවන් භාරදීමට පෙළඹෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

2005 සිට රාජ්‍ය හා රාජ්‍ය නොවන සියලුම ළමා නිවාස ප්‍රාදේශීය නිලධාරීන් විසින් අධීක්ෂණය කර වාර්තා ඉදිරිපත් කරන බව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

අක්‍රමවත් ළමා නිවාස පිළිබඳ නිශ්චිත තොරතුරු නාමිකව ඉදිරිපත් කළහොත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පහසු වන බැවින් ළමා නිවාසය පිළිබඳව නිශ්චිත තොරතුරු ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මීළඟ කාරක සභාවට ළමා හා කාන්තා කාර්යාංශයේ නියෝජ්‍ය පොලිස්පති රේණුකා ජයසුන්දර මහත්මිය සහභාගී කරගත යුතු බව ගරු සභාපතිතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ආර්ථික ගැටලු හේතුවෙන් දෙමාපියන් විසින් දරුවන් ළමා නිවාසවලට යොමු කිරීමට විසඳුමක් ලෙස ළමා නිවාසයක් ආරම්භ කිරීමට මෙන්ම ළමා නිවාසවලට දරුවන් ඇතුළත් කර ගැනීමට ද පරිවාස කොමසාරිස්ගේ අනුමතිය ලබා ගැනිම අනිවාර්ය කරන ලෙස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් යෝජනා කරන ලදී.

පළාත් සභා යටතට ගැනෙන මෙම විෂය පථය සඳහා නීති ආකෘතියක් (Model of Law) පළාත්වලට යොමු කර ඇති බවත් දැනට පළාත් පහක් ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්ති ලෙස අනුමත කර ඇති බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

එහිදී ළමා නිවාස අවුරුද්දකට වරක් සමීක්ෂණය කිරීමට මෙන්ම අනවශ්‍ය ළමා නිවාස වසා දැමීමට තීරණය කළ හැකි බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

පළාත් සභාවල කාලය අවසන් වීම හේතුවෙන් අනෙකුත් නීති සම්පාදන කටයුතු කිරීමට අපහසු වී ඇති බව ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

එම ප්‍රඥාප්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ අපහසුතා ඇති බව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

උතුරු පළාතේ ළමා නිවාසවල සිටි 20,000කට අධික දරුවන් ප්‍රමාණය මේ වන විට 9,000කට පමණ අඩු කර ගත හැකි වූ බවත් මුළු දිවයිනම සැලකූ විට ළමා නිවාසවල දරුවන් 50%කින් පමණ අඩුකර ගත හැකි වූ බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

2019 දී හඳුන්වා දුන් විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක වන බවත් ආධාරයක් ලබා දී පවුලේ ඥාතියෙකුගේ රැකවරණය දරුවාට ලබාදිය හැකි බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

දරුවා හදා වඩා ගැනීමට පවුලේ ඥාතියෙක් නොමැති අවස්ථාවේ දී දරුවන් හදා වඩා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින දේශීය ඉල්ලුම්කරුවන් 5000කට අධික පිරිසට හැකි ඉක්මනින්ම යොමු කිරීමට පළාත් මට්ටමින් සිදු කරන ලද රැස්වීම්වලදී සාකච්ඡා කළ බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ළමා නිවාස ශක්තිමත් කිරීම වෙනුවට පවුල් ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වන බවත් ළමා නිවාස සඳහා විදේශීය ආධාර මෙන්ම තත්කාර්ය ප්‍රතිපාදන (Ad hoc grant) සහ නඩත්තුව සඳහා ප්‍රතිපාදන ද පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් සපයන බවත් අස්වැසුම යටතේ රු. 5,000/- ලබාදීමට යෝජනා කළ බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

මෙම සියලු ආකාරවලින් ළමා නිවාසයක සිටින එක් දරුවෙක්ට මසකට රු.30,000/- ක් පමණ ලැබෙන බවත් මෙම ලැබෙන ප්‍රතිපාදන සම්බන්ධයෙන් විගණනයක් සිදුකරන ක්‍රමවේදයක් නොමැති බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

එම ප්‍රතිපාදන සෘජුව පවුලටම ලබාදිය හැකි නම් ළමා නිවාසවලට යොමුවන දරුවන් ප්‍රමාණය අඩු කර ගත හැකි බවත්මෙම දරුවන්ගෙන් 85%ක මව හෝ පියා ජීවත්වන බව සමීක්ෂණයකින් අනාවරණය කරගෙන ඇති බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

දැනට දිවයිනෙහි පවතින ළමා නිවාස 379න් 47ක් රජය යටතේ පාලනය වන අතර ඉතිරි ළමා නිවාස ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යන, විදෙස් ආධාර ලැබෙන ළමා නිවාස වන බවත් මෙම ළමා නිවාස විධිමත්ව නියාමනය කළ යුතු බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

ළමා නිවාසවල සිටින 9,000ක් පමණ දරුවන්ගේ සුබසාධනය සඳහා මෙවර අයවැයෙන් රු. මිලියන 500ක් වෙන් කර ඇති අතර මෙම දරුවන්ට වයස අවුරුදු 18 දී වෘත්තීය පුහුණුව ලබාදීමෙන් අනතුරුව ද ළමා නිවාසයේම රැඳී සිටිය හැකි බව ගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කරන ලද බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ගැහැණු දරුවෙක්ට විවාහ වීම දක්වාම නිවාස ණය ලබා දීම වැනි වැඩපිළිවෙළක් ඇති කිරීම සම්බන්ධයෙන් ද ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළ බව ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

දරුවෙක් හදා වඩා ගැනීමට බලාපොරොත්තු වන ඉල්ලුම්කරුවෙක්ට එම පළාත තුළ සිටින දරුවෙක් හදා වඩා ගැනීමට ලබා දීම සිදුකළ හැකි වුවත් අන්තර් පළාත් වශයෙන් දරුවන්ව දරුකමට හදා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන නොමැති බව පරිවාස කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

### 1.3.2 ළමා නිවාසවල රැඳී සිටින දරුවන්ගේ ආගම වෙනස් කිරීම

ළමා නිවාසවල රැඳී සිටින දරුවන්ගේ ආගම වෙනස් කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.3.3 යුධ වාතාවරණය පැවැති ප්‍රදේශවල මාතෘ මූලික පවුල් සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීම

යුධ වාතාවරණය පැවැති ප්‍රදේශවල කාන්තාවන් ආදායම් උපයා ගැනීමේ අරමුණින් නීති විරෝධී ක්‍රියාවලට පෙළඹෙන බැවින් මෙම මාතෘ මූලික පවුල්වල ආරක්ෂාව හා මඟ පෙන්වීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

### 1.3.4 පෙර පාසල් පද්ධතිය නියාමනය කිරීම

පෙර පාසලකට දරුවෙක් යොමු කළ යුතු කාලසීමාව, විෂය නිර්දේශය, පෙර පාසල් ගුරුවරුන්ගේ සුදුසුකම් මෙන්ම සමස්ත පෙර පාසල් පද්ධතිය නියාමනය කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

පෙර පාසල්වල ඉරිදා වරුවේ පන්ති පවත්වන බවත් මේ හේතුවෙන් දරුවන්ට දෙමාපියන් සමඟ ගත කිරීමට ඇති කාලය සීමාසහිත වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් පවතින බවත් 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පෙර පාසල් කළමනාකරණය, ලියාපදිංචිය හා සුපරීක්ෂණය පළාත් සභාවට පවරා ඇති බවත් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

ජාතික ප්‍රමිති හඳුන්වා දීමෙන් අධීක්ෂණය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයට බලය පවරා ඇති බවත් පෙර පාසල් සමගාමී ලැයිස්තුව යටතට ගැනෙන විෂයක් වීම හේතුවෙන් සම්බන්ධීකරණ කටයුතු කිරීමේ දී ගැටලු පැන නඟින බවත් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය මූලිකත්වයෙන් හා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ දායකත්වයෙන් පෙර පාසල් සඳහා ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරමින්

පවතින බව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

සියලු පෙර පාසල් සඳහා පොදු විෂයමාලා මාර්ගෝපදේශයක් සකස් කරමින් පවතින බවත් මෙම මාර්ගෝපදේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම නියාමනයට ද පාර්ශ්වයක් අවශ්‍ය බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

පළාත් සභා විෂය යටතට ගැනෙන ආයතන නියාමනයට මධ්‍යම රජයට වෙනම නීතියක් හෝ බලයක් නොමැති බැවින් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන ප්‍රතිපත්තිය පනතක් ලෙස සම්මත කර ඒ සඳහා නියාමන ආයතනයක් ස්ථාපනය කිරීමෙන් නීතිමය බලයක් ලැබෙන බව මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

පනතක් ඉදිරිපත් වන තෙක් පෙර පාසල් නියාමනයට පළාත් සභා සමඟ සාකච්ඡාවකින් පසු එකඟතාවයකට එළඹීමට ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් යෝජනා කරන ලදී.

ස්වයං රැකියාවක් ලෙස පෙර පාසල් පවත්වාගෙන යාම සිදුවන බැවින් පවතින පෙර පාසල් ක්‍රමවත්ව නියාමනය කරන තෙක්, අලුතෙන් පෙර පාසල් ආරම්භ කිරීම අත්හිටුවන ලෙසත් ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය විසින් ඉල්ලීමක් කරන ලදී.

සෑම දිස්ත්‍රික්කයකම පෙර පාසල් නියාමනයට කමිටුවක් ඇති කළ යුතු බවත් අවුරුද්දකට වරක් මෙම සියලු කමිටු සහභාගිත්වයෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පළාත් සභා යටතේ පවතින "සකුරා" පුහුණු මධ්‍යස්ථානවල NVQ 4 මට්ටමේ පුහුණුවක් සෑම පෙර පාසල් ගුරුවරයෙක්ම සතු විය යුතු බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.4 ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා

### 1.4.1 ඩයස්පෝරාව මඟින් හිමිවන සහන සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් සකස් කිරීම

දෙමාපියන් නොමැති 28,000කට අධික දරුවන් අතර, ලිංගික අපචාර බහුල බවත් ප්‍රාදේශීය මට්ටමින් මේ සඳහා විසඳුමක් ලබාදිය යුතු බවත් ගරු අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

යාපනය දිස්ත්‍රික්කයේ සිටින වැන්දඹුවන් සම්බන්ධව නිසි සංඛ්‍යාලේඛන නොමැති වීම ගැටලුවක් බවත් ඩයස්පෝරාව විසින් සහන ලබා දෙන අතර මේ සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් සකස් කළ යුතු බවත් ගරු අමාත්‍යතුමා විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.4.2 මෙහෙණින් වහන්සේලා වෙසෙන ආරාමවල පහසුකම් අවම වීම

මෙහෙණින් වහන්සේලා වෙසෙන ආරාමවල පහසුකම් අවම බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ආගමික ස්ථානවල දී පුද්ගලයන් මුහුණපාන ලිංගික අතවර වැනි ගැටලු සම්බන්ධයෙන් ඒ සඳහා අදාළ සියලු ආයතන සම්බන්ධ කර ගනිමින් පැවැත්වූ සාකච්ඡාවේ දී මහණ කිරීමට අවම වයස් සීමාවක් පැන විය යුතු බවට සාකච්ඡා වූ බවත් පැවිදිවූවන්ගේ පෝෂණය හා පෞද්ගලික සනීපාරක්ෂාව වැනි කරුණු සම්බන්ධයෙන් ද සාකච්ඡා වූ බවත් පරිවාස කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී.

## 1.5 ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

### 1.5.1 රත්මලාන ප්‍රදේශයේ ළමා නිවාස අධීක්ෂණය කිරීම

රත්මලාන ප්‍රදේශයේ ළමා නිවාස 05ක් වසා දැමීමට නියමිත බවත් එයින් 04ක්ම පරිවාස නිලධාරීන්ගේ වැටලීම්වලින් වසා දැමීමට තීරණය කළ බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

මෙම ළමා නිවාස ආශ්‍රිතව අපරාධ රාශියක් සිදුව ඇති බවත් එම ළමා නිවාස අධීක්ෂණයක් සිදුවී නොමැති බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 1.5.2 ළමා නිවාසයක දරුවකුට හිමි විය යුතු රු. 30,000ක් පමණ මුදල නියාමනය කිරීම

ළමා නිවාසයක දරුවකුට හිමිවිය යුතු රු. 30,000ක පමණ මුදල දරුවන්ට නියමාකාරව ලැබීම සම්බන්ධයෙන් ක්‍රමවත් අධීක්ෂණයක් සිදු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.

මෙම මුදල් සම්බන්ධයෙන් විනිවිදභාවයකින් යුතු විගණනයක් සිදු කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 1.5.3 ළමා නිවාසවල දරුවන් පාසල් නොයැවීම

මව හෝ පියා අහිමි දරුවන් මෙන්ම ළමා නිවාසවල දරුවන් පාසල්වලට යැවීමට කටයුතු නොකරන බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

පරිවාස නිලධාරීන් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා මෙම පවුල් සඳහා උපදේශනය ලබා දීම හා ළමා නිවාස නියාමනයට වැඩපිළිවෙළක් සැකසිය යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනියක් සම්බන්ධ කරගත යුතු බව ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.5.4 කාන්තා හා ළමා කටයුතු විෂය සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක පදනම් කර ගනිමින් අධීක්ෂණයක් සිදු කිරීම

දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටුවල න්‍යාය පත්‍රයට ඇතුළත් කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා රාජ්‍ය ආයතනවල නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් කාන්තා හා ළමා කටයුතු විෂය සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක පදනම් කර ගනිමින් අධීක්ෂණයක් සිදු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.

මාතර ප්‍රාදේශීය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සාකච්ඡා වූ කරුණුවලට අදාළව නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් සාකච්ඡා පැවැත්වූ බවත් එහිදී ගැටලු හා යෝජනා ඉදිරිපත් කළ බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මෙම සම්බන්ධීකරණ කමිටුවල සංවර්ධන යෝජනා පිළිබඳව සාකච්ඡා කළ ද කාන්තාවන් හා ළමයින් පිළිබඳව න්‍යාය පත්‍රයෙන් ඉවත්වන බැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හරහා ඉල්ලීමක් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ලිඛිතව දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කිරීමට අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දුන් බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මෙම ගැටලු සාකච්ඡා කිරීමට ඇතැම් දිස්ත්‍රික්කවල වෙන වෙනම අනු කමිටු පවතින බව නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු හේමාලි වීරසේකර මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හරහා ද දැනුවත් කිරීම් සිදුකරන බව අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් හා මෙහෙයුම්) විසින් දැනුම් දෙන ලදී.

## 1.6 ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (ගරු සභාපතිතුමිය)

### 1.6.1 විදෙස් ගමන් බලපත්‍රය ලබා ගැනීමේ දී මෙහෙණින් වහන්සේලා පත්වන අපහසුතාවය

මෙහෙණින් වහන්සේලාට හැඳුනුම්පත නොමැති වීම හේතුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම හා විදෙස් ගමන් බලපත්‍රය සාදා ගැනීමේදී ද අපහසුතාවයට පත් වන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 1.6.2 කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය හරහා සමාජ සුභසාධනය ඉහළට ඔසවා තැබීම

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ආදායම් උපයන අමාත්‍යාංශයක් නොවන අතර සමාජ සුභසාධනය සලසන අමාත්‍යාංශයක් බැවින් අයවැය හරහා අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරන ලද සියලු ප්‍රතිපාදනවලින් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සමාජ සුභසාධනය ඉහළට ඔසවා තැබිය යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා කාන්තාවන් සවිබල ගැන්වීම, අවතැන් වූ දරුවන් හා දෙමව්පියන් අහිමි වූ දරුවන්ගේ ජීවන මට්ටම ඉහළ දැමීම මෙන්ම වඩා සුරක්ෂිත ජන සමාජයක් ස්ථාපනයට ප්‍රතිපාදන යෙදවිය යුතු බවත් දියුණු මානව ප්‍රජාවක් බිහිකිරීමට වැඩපිළිවෙළ සැකසිය යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 05ම අමාත්‍යාංශයේ දැක්ම ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් අවධාරණය කරන ලදී.

## 1.7 දරුවෙක් හදා වඩා ගැනීම සඳහා නීත්‍යානුකූලව ඉල්ලුම්කරුවෙකු වෙත පවරා දීම - ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

නීත්‍යානුකූලව ස්වභාවික පියා නොමැති දරුවන්, දරුකමට හදා වඩා ගැනීමට ඉල්ලුම්කරුවන්ට ලබා දීමේ දී ස්වභාවක පියා නොමැතිවීම හේතුවෙන් දරුවාගේ අයිතිය පැවරීමේ දී අධිකරණය විසින් අපහසුතාවයට පත්වන බවත් එහිදී දරුවන් වෙනත් දෙමාපියන් ළඟ රැකවරණය ලැබුව ද පුරවැසියෙක් ලෙස කටයුතු කිරීමට කිසිඳු ලේඛනයක් නොමැති බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

ස්වභාවික දෙමාපියන් සොයා ගත නොහැකි අවස්ථාවල දී ප්‍රසිද්ධ දැන්වීමකින් පසු හා අවස්ථානුගත කරුණු යටතේ පරිවාස වාර්තා අධ්‍යයනයකින් අනතුරුව ළමයින් දරුකමට හදා ගැනීමේ (සංශෝධන) පනතේ ප්‍රතිපාදනයක් යටතේ දරුවන් හදාවඩා ගැනීමට ඉල්ලුම්කරුවෙක්ට ලබාදිය හැකි බව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අධිකරණ පද්ධතිය තුළ නිසි අවබෝධයක් නොමැති බව ද ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා යම්කිසි නිශ්චිත ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු බව ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් යෝජනා කරන ලදී.

ළමයින් දරුකමට හදා ගැනීමේ පනත සංශෝධනය කිරීමේ දී මේ සම්බන්ධයෙන් සාකච්ඡා වූ අතර මෙම ක්‍රියාවලියට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් ජනතාව අකමැත්තෙන් පසුවන බවත් විදේශිකයෙක් විසින් දරුවෙක් හදාවඩා ගැනීමක දී දින 14ක් ඇතුළත පරිවාස කොමසාරිස් වාර්තාව යැවිය යුතු බවත් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් දැනුම් දෙන ලදී.

ළමයෙකුගේ ස්වභාවික දෙමව්පියන් නිශ්චිතව සොයා ගැනීමේ දී පියා දිස්ත්‍රික්කයෙන් පිටත වාසය කිරීම, දේශීය ඉල්ලුම්කරුවෙක්ට ළමයින් දරුකමට හදා ගැනීමට ලබාදීමේ දී දීර්ඝ කාලයක් ගත වීමට බලපාන බව ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.8 ස්වභාවික දෙමාපියන් විසින්ම දරුවන් සිඟමනේ යෙදවීම - නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු හේමාලි වීරසේකර මහත්මිය

උදය කාලයේ දරුවන් පාසල් යවා සවස් කාලයේ ස්වභාවික දෙමාපියන් විසින්ම දරුවන් වෙළෙඳාම් කටයුතුවල මෙන්ම සිඟමනේ යොදවන බව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධනයට සිදු කරන ලද 1998 අංක 29 දරන සංශෝධන අනුව දරුවන් සිඟමනේ යෙදවීම අපරාධ වරදක් බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 1929 වෙත වාර්තා වන පැමිණිලි පොලීසිය වෙත යොමු කිරීමේ දී එම ස්ථානවල පුද්ගලයන් රැඳී නොසිටින බවට පිළිතුරු ලැබීම ගැටලුවක් බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම දරුවන් සමඟ කාන්තාවන් පොලිස් ස්ථානයක රඳවා තබා ගැනීමට යටිතල පහසුකම් නොමැති බවත් "ආරක්ෂක මාතා" තනතුරට සෑම පොලිස් ස්ථානයකම නිලධාරිනියක් පත්කළ යුතු බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් දැනුම් දෙන ලදී.

ආර්ථික අපහසුතා හේතුවෙන් මව විදෙස් රැකියාවලට යොමු වීමේ දී පියා මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීම නිසා දරුවන් අනාරක්ෂිත වන බැවින් ළමා අපචාර සිදුවීම් වාර්තා වන බවත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මව රැකියා සඳහා විදෙස්ගත වීමේ දී දරුවන්ගේ වයස අවුරුදු 05 සීමාව මේ වන විට අවුරුදු 02 දක්වා අඩු කර ඇති බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බොහෝ නීති සම්පාදනය හා නීති ක්‍රියාත්මක කිරීම ආයතන දෙකකින් සිදුකිරීම මෙන්ම එම ආයතන අතර සහසම්බන්ධතාවය නොමැතිවීම දුර්වලතා ලෙස දැකිය හැකි බව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ගැටලු මඟහරවා ගැනීමට මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මෙන්ම දරුවන්ගේ හා කාන්තාවන්ගේ සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධව පැන නැඟින ගැටලු සාකච්ඡා කිරීමට සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යන ආයතනවල නිලධාරීන් මීළඟ කාරක සභාවට සම්බන්ධ කරගත යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

හදිසි තත්ත්වයක දී අධිකරණයට වාර්තාව ඉදිරිපත් කළ යුතු අවස්ථාවක වෛද්‍ය පරීක්ෂණ වාර්තා ප්‍රමාද වීම ගැටලුවක් වන බැවින් රෝහලක පැය 24 පුරාම අධිකරණ වෛද්‍ය නිලධාරීවරයෙක් (JMO) සේවයේ යෙදිය යුතු බවට සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය හරහා

ඉල්ලීමක් කළ හැකි බව ගරු සභාපතිතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**1.9 ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**

**1.9.1 විවිධ ළමා අපයෝජනවලට ලක්වූ දරුවන් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරගැනීම**

විවිධ ළමා අපයෝජනවලට ලක්වූ දරුවන්ට උපදේශනය ලබා දෙමින් මෙම දරුවන් රටේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරගත යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

**1.9.2 විවිධ අසනීප ඇති දරුවන් සඳහා දායකත්වයක් දැක්වීම**

විවිධ අසනීප තත්ත්වවලට ප්‍රතිකාර ලෙස අධික වියදමක් දැරීමට සිදුව ඇති දරුවන් වෙනුවෙන් දායකත්වයක් දැක්විය යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

පාසලට පළමු ශ්‍රේණියට ඇතුළත් කරන දරුවන් 50ක් සැලකූ විට දරුවන් 15 - 20ක් මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ගත නොහැකි දෙමාපිය රැකවරණය අහිමි දරුවන් බවත් විවිධ ගැටලු හේතුවෙන් මෙම දරුවන් අනාගතයේ දාමරිකයන් බවට පත්වීම, සියදිවි හානිකර ගැනීම දැකගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දෙමාපියන් රැකියාවල නිරත වීම, දරුවන් හුදෙකලා වීම හා නිරතුරුවම ජංගම දුරකථන භාවිතය හේතුවෙන් ඉතා සුළු ගැටලුකාරී තත්ත්වයක දී වුවත් දරුවන් සිය දිවි හානි කර ගැනීමට පෙළඹෙන බව ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දරුවන් නිරතුරුව ජංගම දුරකථන භාවිතා කිරිම මෙන්ම විවිධ සමාජ මාධ්‍යවලට නිරාවරණය වීමේ ප්‍රවණතාව ඉහළ යාම හේතුවෙන් සියදිවි හානිකර ගැනීම් ඉහළ යන බව ද ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.9.3 රාජ්‍ය නොවන සංවිධාන නියාමනයට ලක් කිරීම**

මෙම ආයතන නියාමනයට ලක් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

**1.10 කාන්තාවන් හා දරුවන් සම්බන්ධ ගැටලුවල දී නීතිය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම - ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

කාන්තාවන් හා දරුවන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ දී පවතින පසුබෑම මඟ හරවා ගැනීමට මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය විසින් යෝජනා කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා ද අදහස් දක්වන ලදී.

**2.** කාරක සභාව ප.ව. 12.50 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

## අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

## පළමුවැනි රැස්වීම - 2025 පෙබරවාරි මස 27

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (සභාපති)
ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍ය)
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා
ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
ගරු නීතිඥ සරත් කුමාර මහතා
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා
ගරු මොහමඩ් සාලි නලීම් මහතා
ගරු තුරෙරාසා රවිකරන් මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

### 1. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය පිළිබඳ කෙටි හැඳින්වීම

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන, ඒවායේ කාර්යභාර්ය සහ මේ වන විට එම ආයතනවල පවතින පුරප්පාඩු සම්බන්ධව අතිරේක ලේකම් (සංවර්ධන) විසින් ඉදිරිපත් කිරීමක් (Presentation) මඟින් දැනුවත් කරන ලදී.

මෙම ඉදිරිපත් කිරීමේ දී ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලයේ සහ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දත්තයන්හි දෝෂයක් නිරීක්ෂණය වූ බැවින් එය නිවැරදි කර ගතයුතු බව ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය විසින් දැනුම් දෙන ලදී.

අධිකරණවල පවතින විසඳීම ප්‍රමාද වී ඇති නඩු ලක්ෂ 11ක ප්‍රමාණය බෙදී ඇති ආකාරය පිළිබඳව ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු 5,785ක්, අභියාචනාධිකරණයේ නඩු 4,572ක්, අපරාධ නඩු විභාග කරන අධිකරණවල නඩු 6,286ක්, වාණිජ මහාධිකරණයේ නඩු 6,146ක්, විශේෂ ත්‍රිපුද්ගල අධිකරණයේ නඩු 03ක්, මහාධිකරණ නඩු 27,324ක්, දිසාධිකරණවල නඩු 262,665ක්, දිසා මහේස්ත්‍රාත් අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණවල අපරාධ නඩු 813,726ක්, ළමා මහේස්ත්‍රාත් අධිකරණවල නඩු 1,260ක් සහ කම්කරු විනිශ්චය සභාවල නඩු 4,051ක් යනාදී වශයෙන් මුළු නඩු 1,131,818ක් පවතින බව නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් දැනුම් දෙන ලදී.

මෙම සංඛ්‍යාත්මක දත්ත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2. වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා සලකා බැලීම**

- **2023 වර්ෂය සඳහා පුනරුත්ථාපන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව**
  (2025.02.05 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)
- **2023 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව**
  (2025.02.05 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)
- **2023 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
  (2024.12.04 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)
- **2023 වර්ෂය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව**
  (2025.01.10 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තා සහ වාර්ෂික කාර්ය සාධන වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**3. වෙනත් කරුණු**

**3.1 ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**3.1.1 මඩකලපුව බන්ධනාගාරය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම**

මඩකලපුව ශික්ෂණ රෝහලට ඉතා ආසන්නයෙන් පවතින අධික තදබදයකින් යුතු බන්ධනාගාරය අනාගතයේ දී වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධව අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.1.2 මඩකලපුව බන්ධනාගාරයේ සහ මඩකලපුව ශික්ෂණ රෝහලේ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය

මඩකලපුව බන්ධනාගාරයේ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සහ මඩකලපුව ශික්ෂණ රෝහලේ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වෙන් වෙන් වශයෙන් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නැගෙනහිර පළාතේ මිලියනයකට අධික ජනතාවකට සේවා සපයන සහ මඩකලපුව දිස්ත්‍රික්කයට පවතින එකම ශික්ෂණ රෝහල මෙය වන අතර එහි හදිසි සැලසුම්වලට අනුව ඉදිකිරීම් සිදුකිරීමට හෝ තවත් සංවර්ධන කටයුතු සිදු කිරීමට තිබේ නම් ඉඩමක් අවශ්‍ය වන බැවින් රෝහල අසල ස්ථාපිත කර ඇති බන්ධනාගාරය ඉවත් කිරීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

බන්ධනාගාර මූලස්ථානය වෙත මඩකලපුව ප්‍රදේශයෙන් ඉඩම් ලබාගෙන ඇති නමුත් මේ වන විට මඩකලපුව බන්ධනාගාරය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම පිළිබඳව ප්‍රමුඛතාවය ලබාදී නොමැති බවත් මෙම වසරේ දී වෙන් කරනු ලබන ප්‍රතිපාදන මගින් සනීපාරක්ෂක මලාපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධ ගැටලුව විසඳිය හැකි වනු ඇති බවත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙම ආයතන ද්විත්වය සඳහා පොදු අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් නොමැති නම් ප්‍රතිපාදන සපයා දීම මත බන්ධනාගාරය සඳහා වෙනම අපජල පවිත්‍රාගාර ඒකකයක් හඳුන්වා දිය හැකි බව අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී.

වසර කිහිපයකට පෙර මඩකලපුව නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වෙන් කර ඇති අක්කර 14ක ඉඩමක් පවතින අතර මේ වනතෙක් එහි කිසිඳු ඉදිකිරීමක් සිදු කර නොමැති බවත් මඩකලපුව කලපුව ආශ්‍රිතව ධීවරයින් ධීවර කටයුතුවල නිරත වන බැවින් කලපුව වෙත ඍජුවම අපද්‍රව්‍ය බැහැර කිරීම සෞඛ්‍යාරක්ෂිත නොවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙය සෞඛ්‍ය සම්බන්ධ ගැටලුවක් වන බැවින් මේ සම්බන්ධව ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.2 ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

### 3.2.1 යාපනය දිස්ත්‍රික්කයේ අධිකරණවල පවතින ලඝු ලේඛකයින්ගේ හිඟය

යාපනය දිස්ත්‍රික්කයේ අධිකරණවල පවතින ලඝු ලේඛකයින්ගේ හිඟයක් හේතුවෙන් නඩු තීන්දු ලබාදීමේ ප්‍රමාදයක් පවතින බැවින් මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම තනතුර අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ලබාදෙන පත්වීමක් වන බවත් ඉදිරියේ දී අධිකරණ සඳහා පරිවර්තකයින් සහ ලඝු ලේඛකයන් බඳවා ගැනීමට කටයුතු කරන බවත් අතිරේක ලේකම් (පාලන) විසින් දැනුම් දෙන ලදී.

අධිකරණ සේවා කොමිෂන් සභාව යටතේ පවතින ආයතනවල පුරප්පාඩු 753ක් පිරවීම සඳහා ඉල්ලීම් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට අදාළව වැඩ කටයුතු සිදුවෙමින් පවතින බවත් ඉදිරි මාස 06ක පමණ කාලය තුළ පත්වීම් ලබාදීමට හැකි වනු ඇති බවත් අතිරේක ලේකම් (පාලන) විසින් දැනුම් දෙන ලදී.

මෙම පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සහ ඒ ආශ්‍රිත ප්‍රගතිය පිළිබඳව අමාත්‍යාංශ ලේකම් විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධව පැහැදිලි කර ගැනීමක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලිඛිතව දන්වා ඇති බවත් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ කමිටුව වෙත ඉදිරිපත් කර බඳවා ගැනීම සඳහා අනුමතිය ලබාගත හැකිවනු ඇති බවත් අතිරේක ලේකම් (පාලන) විසින් දැනුම් දෙන ලදී.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය තුළ ඇති සියලුම දෙපාර්තමේන්තු ඇතුළත් කරමින් මෙම බඳවා ගැනීම් 753 සිදු කරන්නේ ද යන්න පිළිබඳව සහ එයට ලඝු ලේඛකයින් සහ භාෂණ පරිවර්තකයින් ඇතුළත් වන්නේ ද යන්න පිළිබඳව ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා විසින් විමසීමක් කරන ලදී.

අධිකරණ ක්ෂේත්‍රය තුළ පමණක් 6,026ක කාර්යමණ්ඩල හිඟයක් පවතින අතර මේ අවස්ථාවේ දී පුරප්පාඩු 753ක් පිරවීම සඳහා හදිසි පදනම් මත බඳවා ගැනීම් සිදු කිරීම සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත් එයට ලඝු ලේඛකයින් සහ භාෂණ පරිවර්තකයින් ඇතුළත් වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

### 3.2.2 මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය

පොලිස් බල ප්‍රදේශ 09ක අධිකරණමය කටයුතු මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය විසින් සිදු කිරීම අපහසු බැවින් නව හෝ අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයක් ස්ථාපිත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එක් අධිකරණයකට පොලිස් බල ප්‍රදේශ 09ක් පැවතීම සාමාන්‍ය තත්ත්වයක් බවත් පොලිස් බල ප්‍රදේශ 09හිම අධිකරණමය කටයුතු එකම දිනයේ දී සිදු නොවන අතර එක් එක් පොලිස් බල ප්‍රදේශ සඳහා වෙන් වෙන් දින ලබා දෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නව මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිකිරීම සම්බන්ධව සාධාරණීකරණය කරන්නේ නම් පවතින නඩු කටයුතු සංඛ්‍යාව ද ඇතුළත්ව මේ සම්බන්ධව සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.3 පූගොඩ අධිකරණ සංකීර්ණය - ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

වසර 04ක් වැනි දීර්ඝ කාලයක් පුරා බදු කුලී පදනම මත, නුසුදුසු ස්ථානයක පූගොඩ අධිකරණය පවත්වාගෙන යන බැවින් ඉදිකෙරෙමින් පවතින පූගොඩ අධිකරණ සංකීර්ණයේ ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එමෙන්ම, පූගොඩ අධිකරණ සංකීර්ණය නිරීක්ෂණය කිරීම සඳහා ගරු සභාපතිතුමාට පැමිණෙන ලෙසත් ඒ සඳහා දිනයක් ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පූගොඩ අධිකරණය නිරීක්ෂණය කිරීමට සහ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ සැලසුම් සහ ඉංජිනේරු අංශ සමඟ සාකච්ඡා කිරීමට දින ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පසුගිය වසර 02 තුළ ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන් නොකළ බැවින් මෙම කටයුතු අතරමඟ නවතා ඇති නමුත් මෙම වසරේ දී නැවත එම කටයුතු ආරම්භ කර කඩිනමින් ක්‍රියාත්මක කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

2021 සහ 2022 වර්ෂවල දී පැවති ආර්ථික පසුබෑම සහ භාණ්ඩවල මිල වැඩිවීමත් සමඟ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් එකඟ වූ මිල ගණන්වලට අනුව 2019 - 2020 වැනි වර්ෂවල ආරම්භ කළ ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකිවූ බැවින් නැවත පාර්ලිමේන්තුවේ අවසරය ලබා ගෙන 20%ට වැඩි මිල විචලනයන් අනුමත කරගෙන නැවත මෙම ව්‍යාපෘති ආරම්භ කර සිදුකරගෙන යන බවත් පූගොඩ අධිකරණ සංකීර්ණය ඉදිකරනු ලබන්නේ රාජ්‍ය ආයතනයක් හා සම්බන්ධ වීමෙන් වන අතර එම ආයතනයේ මූල්‍ය තත්ත්වය හේතුවෙන් පසුබෑමක් පැවැති බවත් අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී.

නමුත් මෙය කඩිනමින් අවසන් කිරීමට පියවර ගන්නා බව අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මඟින් අදාළ ඉදිකිරීම් ආයතනය වෙත ගෙවීම් සිදුකිරීමට තිබේ ද යන්න පිළිබඳව සහ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරගෙන තිබේ ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරගෙන පවතින බවත් අදාළ ඉදිකිරීම් ආයතනයෙන් මේ වන විට ප්‍රමාදයක් පවතින බවත් අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී.

මෙම ප්‍රමාදය සම්බන්ධව අමාත්‍යාංශය වශයෙන් මැදිහත් වී මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කරගත හැකි කාලයක් සම්බන්ධව විමසීම් සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අතිරේක ලේකම් (ඉංජිනේරු) වෙත උපදෙස් ලබාදෙන ලදී.

මේ සම්බන්ධව අමාත්‍යාංශය තුළ සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බව අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී.

## 3.4 ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා

### 3.4.1 මුස්ලිම් ජනතාව මිය ගිය පසු අවසන් කටයුතු සිදු කිරීම

සාධාරණ හේතුන් මත මුස්ලිම් ජනතාව මියගිය විට පැය 24ක් තුළ අවසන් කටයුතු සිදු කරන අතර ඒ සම්බන්ධව විශේෂ චක්‍රලේඛයක් ද නිකුත්කර ඇති නමුත් ඇතැම් රෝහල්වල මෙම චක්‍රලේඛ උල්ලංඝනය කරමින් කටයුතු කරන බැවින් මේ පිළිබඳව පරීක්ෂා කර බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම චක්‍රලේඛය සම්බන්ධව නැවත සලකා බලන බවත් මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇති භූමදාන සහ ආදාහන අයිතිවාසිකම් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.4.2 ජ්‍යෝෂ්ඨත්වය අනුව මහාධිකරණ විනිසුරුවරුන් පත් කිරීම

මහාධිකරණ සඳහා විනිසුරුවරුන් පත් කිරීමේ දී ජ්‍යෝෂ්ඨත්වය සලකා බලා ඒ අනුව පත්වීම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් වශයෙන් පවතින අතර අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ නීතිපති දෙපාර්තමේන්තුව පවතින බවත් එම ආයතනවලින් ගනු ලබන තීරණ සඳහා රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයාට මැදිහත් විය නොහැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මහාධිකරණ විනිසුරුවරුන් පත් කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් සිදුකරන අතර මහාධිකරණ සඳහා විනිසුරුවරුන් පත් කිරීමේ දී ජ්‍යෝෂ්ඨත්වය පමණක් නොව ඔවුන්ගේ කාර්යසාධනය, ඔවුන් සම්බන්ධව ලැබී ඇති පැමිණිලි ආදිය සලකා බැලීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව සතුව ස්වාධීන ක්‍රමවේදයක් පවතින බවත් මේ සම්බන්ධව යම් පැමිණිල්ලක් වෙතොත් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු අතර ඒ සඳහා අමාත්‍යවරයාට මැදිහත් විය නොහැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව පරීක්‍ෂා කර බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.4.3 "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන සඳහා මුස්ලිම් නියෝජිතයෙක් සහ දමිළ නියෝජිතයෙක් පත් කිරීම

"ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන සඳහා පත් කර ඇති කමිටුව වෙත මුස්ලිම් නියෝජිතයෙක් සහ දමිළ නියෝජිතයෙක් පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

"ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහනට නියෝජිතයින් පත්කිරීමේ බලය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට නොමැති බවත් එය ජනාධිපති ලේකම් කාර්යාලය හරහා සිදුවන ක්‍රියාවලියක් බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.5 ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

### 3.5.1 විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග සන්තකයේ තබා ගැනීම හේතුවෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින්ට ඇප ලබා දීම

(218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග ආඥාපනතට අනුව ග්‍රෑම් 10ට වැඩි ප්‍රමාණයක් සන්තකයේ තබාගැනීම හේතුවෙන් අත්අඩංගුවට ගන්නා පුද්ගලයෙකුට ඇප දීමේ බලය මහාධිකරණය සතුව තිබූ බවත් ඉන් පසුව ඉදිරිපත් කරන ලද විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතට අනුව එම බලය අභියාචනාධිකරණය සතු වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ලංකාවේ කුමන ස්ථානයක දී හෝ මෙම වරද හේතුවෙන් අත්අඩංගුවට ගන්නා පුද්ගලයින් හට ඇප ලබා ගැනීමට කොළඹ අභියාචනාධිකරණය වෙත පැමිණීමට සිදුවීමෙන් ජනතාව ඉතා අපහසුතාවට පත්වන බැවින් මේ සම්බන්ධව යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඇප ලබාගැනීම සඳහා කොළඹට පැමිණීමේ අපහසුව මෙන්ම රක්ෂිත බන්ධනාගාරවල තදබදය වැඩිවීමටත් මෙය ප්‍රධාන හේතුවක් වන බවත් 8,000 – 9,000ක් පමණ පිරිසක් මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීමේ වරද හේතුවෙන් රජයේ රස පරීක්ෂණ වාර්තා ප්‍රමාද වීම මත රක්ෂිත බන්ධනාගාරගත වී සිටින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

රක්ෂිත බන්ධනාගාරවල පවතින තදබදය අඩුකිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එහිදී මෙම කරුණ අවධානයට ලක්වනු ඇති බවත් එමෙන්ම, යෝජනාව සඳහා පදනම් වූ කමිටු නිර්දේශ සහ තර්කය කුමක්ද යන්න පිළිබඳව සොයා බැලිය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් ද අදහස් දක්වන ලදී.

මීට අදාළ කරුණු පරීක්ෂා කර අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.5.2 අධිකරණවල පවතින අධික තදබදය

අධිකරණවල පවතින අධික තදබදය හේතුවෙන් එහි පැමිණෙන ජනතාව ඉතා අපහසුතාවයන්ට පත්වන අතර ඇතැම් අධිකරණවල විනිසුරුවරුන් විසින් නඩු කැඳවීමේ ක්‍රමයක් ස්වේච්ඡාවෙන් සකස් කරගෙන (මීළඟ නඩු දිනයේ දී සලකා බලනු ලබන නඩු පිළිබඳව ඊට පෙර දිනයේ දී ප්‍රදර්ශනය කිරීම ආදී) කටයුතු කරන බැවින් සමස්ත අධිකරණ පද්ධතියටම මාර්ගෝපදේශ ලබාදී මෙවැනි කටයුතු ක්‍රියාත්මක කිරීමෙන් ජනතාවට සහ නීතිඥවරුන්ට විශාල පහසුවක් වනු ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සම්බන්ධයෙන් මේ අවස්ථාව වන විට අධිකරණ සේවා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පුහුණු කිරීම් පවත්වාගෙන යන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

2025 වර්ෂයේ දී නඩු කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බවත් සමස්ත අධිකරණ පද්ධතියේම නඩු සඳහා ඒකාකාර අංකන ක්‍රමයක් සහ වර්ණ කේතයක් හඳුන්වාදීමට සැලසුම් කරන බවත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහාධිකරණ විනිසුරු) විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට මෙහි පුහුණු කිරීම් වට 02ක් පවත්වා ඇති අතර විශේෂයෙන්ම සුළු හිමිකම් අධිකරණ සම්බන්ධ පනතේ ප්‍රතිපාදන, පූර්ව නඩු විභාග සම්බන්ධව පවතින ප්‍රතිපාදන සහ නඩු කළමනාකරණ පද්ධතිය ආදර්ශ උසාවි 21ක් තුළ එක ආකාරයකට ක්‍රියාත්මක වන බැවින් අනෙක් අධිකරණ සඳහා ද මෙම වැඩපිළිවෙළ හඳුන්වාදීමට පියවර ගත් බවත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහාධිකරණ විනිසුරු) විසින් දැනුම් දෙන ලදී.

බස්නාහිර පළාත් දිසා අධිකරණයේ මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන අතර මහේස්ත්‍රාත් අධිකරණ වෙත ද නුදුරේදීම මෙය හඳුන්වා දීමට නියමිත බවත් මෙම වසර අවසානය වන විට ක්‍රමවත් වැඩපිළිවෙළක් අනුව නඩු කටයුතු සිදු කිරීමට හැකිවනු ඇති බවත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහාධිකරණ විනිසුරු) විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් ද අදහස් දක්වන ලදී.

මෙම කටයුතු සඳහා අධිකරණවලට අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබා දීමට වැඩපිළිවෙලක් පවතී ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කටයුතු ක්‍රමානුකූලව සිදුකළ යුතු අතර පළමුවෙන්ම ආයතන තුළ ඒකාකාරී වැඩපිළිවෙලක් ස්ථාපිත කළ යුතු බවත් නුවර සහ මීගමුව අධිකරණවල අධිකරණ කටයුතු ඩිජිටල්කරණ ව්‍යාපෘතිය (Rapid Digitalization Program) ක්‍රියාත්මක කිරීමට තෝරාගෙන ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.6 නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතුවල පවතින ප්‍රමාදය - ගරු නීතිඥ සරත් කුමාර මහතා

නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතුවල පවතින ප්‍රමාදය පිළිබඳව ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුව තුළ සේවක පුරප්පාඩු 606ක් පවතින අතර මෙම ප්‍රමාදයට හේතුව වන්නේ පොලිස් ස්ථානවලින් පැමිණෙන නඩු සංඛ්‍යාව හැසිරවීම සඳහා සිටින අපරාධ නීති වෘත්තිකයින් සංඛ්‍යාවේ අඩුවක් පැවතීම නිසා බවත් පසුගිය වසරේ දී ජ්‍යෙෂ්ඨ රජයේ

අධිනීතිඥවරුන් 28 දෙනෙක් පමණ සේවය හැර ගොස් ඇති අතර මෑතක දී රජයේ අධිනීතිඥවරුන් 37 දෙනෙකු බඳවා ගැනීමට පියවර ගත් බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අධිකරණයේ පෙනී සිටීම, ලිපිගොනු සම්බන්ධව කටයුතු කිරීම, ලැබෙන ලිපි ගොනුවල පවතින අඩුපාඩු හේතුවෙන් නිශ්චිත පිළිතුරක් ලබාදීමට නොහැකිවීම, ඒ හේතුවෙන් නැවත අදාළ ලිපි ලේඛන කැඳවීම ආදී හේතූන් මත ප්‍රමාද වීම් සිදුවන බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ සිට අධිකරණවල නඩු මෙහෙයවන නිලධාරීන් දක්වා නිලධාරීන් 80ක් පමණ සේවය කරන බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ විසින් දැනුම් දෙන ලදී.

අනුමත රජයේ අධිනීතිඥයින් සංඛ්‍යාව 218ක් වන නමුත් මේ වන විට රජයේ අධිනීතිඥයින් 144ක් පමණක් සිටින අතර ඉන් 70 දෙනෙකු පමණක් අපරාධ අංශයේ සේවය කරන බවත් නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ විසින් දැනුම් දෙන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින රජයේ අධිනීතිඥ පුරප්පාඩු සංඛ්‍යාව පිරවිය යුතු බවත් නව බඳවාගැනීම් සිදු කළ ද සංකීර්ණ නඩුවල චෝදනා මෙහෙයවන තත්ත්වය දක්වා ළඟාවීමට සැලකිය යුතු කාලයක් ගතවන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුව තුළ අතිරේක සොලිසිටර් ජනරාල්වරුන්ගේ සිට රජයේ අධිනීතිඥවරුන් දක්වා නීති නිලධාරීන්ගේ පුරප්පාඩු 157ක් පවතින බව නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ විසින් දැනුම් දෙන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සැපයිය යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

වසර 30ක පමණ සේවා අත්දැකීම් සහිත අතිරේක සොලිසිටර් ජනරාල්වරුන් 06 දෙනෙකු මෙම වසරේ දී සේවයෙන් ඉවත්වන බවත් මේ වන විට රට තුළ පවතින තත්ත්වය හේතුවෙන් දක්ෂතාවය සහිත නිලධාරීන් මෙරට තුළ රඳවා ගැනීම අපහසු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.7 අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය පිළිබඳව පැහැදිලි කිරීම - ගරු එම්. කේ. එම්. අස්ලම් මහතා

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය පිළිබඳව පැහැදිලි කිරීමක් සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් මෙම වසරේ දී සංහිඳියා වැඩසටහන් කිහිපයක් ආරම්භ කිරීමට නියමිත බවත් අධ්‍යාපනය, ගැටුම් කළමනාකරණය, සංහිඳියාව උදෙසා කලාව භාවිත කිරීම සහ මාධ්‍ය යන විවිධ අංශ ඔස්සේ මෙරට සංහිඳියාව ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ඇති බවත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

අධ්‍යාපනය සමඟ ජාතික ඒකාබද්ධතා වැඩසටහන් සිදුකිරීමේ දී විශ්වවිද්‍යාල සහ පාසල් සම්බන්ධ කරගනිමින් සැලසුම් සහිතව විෂය මාලා, පසු විපරම් ආදිය ඇතුළත් ක්‍රමවේදයක් සකස් කරගෙන අවම වශයෙන් වසර 03ක් හෝ මෙම ව්‍යාපෘතිය සිදුකළ යුතු බවත් දරුවන් තුළ ආකල්පමය වශයෙන් වෙනසක් ඇති කිරීමට පාසල්වලින් මෙම කටයුතු ආරම්භ කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පසුගිය කාලයේ දී ඇති වූ සිදුවීම් ආදිය සමාලෝචනය කර, ඇගයීමට ලක් කළ හැකි වන අයුරින් ව්‍යාපෘතියක් ලෙස මෙය සිදුකළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශය තුළ ඉදිරි වැඩ සැලසුම් කිරීමේ දී මෙවැනි යෝජනා ඇතුළත් කරගනිමින් කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.8 ගරු මොහමඩ් සාලි නලීම් මහතා

### 3.8.1 එරාවූර් ප්‍රදේශයේ අත්අඩංගුවට ගනු ලබන භාණ්ඩ ගබඩා කර තැබීම

වසර 40කට පමණ පෙර කාලයක සිට ග්‍රාමීය උසාවියක් පවතින බල ප්‍රදේශයකට පවුල් 12,000ක් පැවති නමුත් මේ වනවිට එය 45,000ක් දක්වා වැඩි වී ඇති බවත් එරාවූර් ප්‍රදේශයේ පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා භාණ්ඩ ගබඩා කර තැබීමට නිශ්චිත ස්ථානයක් නොමැති වීම හේතුවෙන් වීරපත්තිරන් කෝවිල අසල මාර්ගය අවහිර කරමින් අත්අඩංගුවට ගෙන ඇති භාණ්ඩ ස්ථානගත කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ හේතුවෙන් කෝවිලේ ආගමික කටයුතු සිදු කිරීමට, කෝවිලට ප්‍රවේශ වීමට සහ වාහන නැවැත්වීමට ද අපහසු තත්ත්වයක් මතුවී ඇති බැවින් අත්අඩංගුවට ගනු ලබන භාණ්ඩ වෙනත් ස්ථානයක ස්ථානගත කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.8.2 මුස්ලිම් හදිසි මරණ පරීක්ෂකවරු පත් කිරීම

මඩකලපුව ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාවගේ අවමංගල කටයුතුවල දී අදාළ මෘත ශරීර පැය කිහිපයක් තුළ නිදහස් කරගත යුතු බැවින් ඊට අදාළ කටයුතු සඳහා මේ වන විට එම ප්‍රදේශයට පත්කර ඇති දමිළ හදිසි මරණ පරීක්ෂකවරයා හට එම ප්‍රදේශයේ මීට පෙර සේවය කළ මුස්ලිම් හදිසි මරණ පරීක්ෂකවරයාගේ උපදෙස් සහ සහාය ලබාගෙන කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මඩකලපුව ප්‍රදේශයේ පමණක් නොව දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල ද මෙම ගැටලුව පවතින බැවින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

මඩකලපුව රෝහල් සඳහා හදිසි මරණ පරීක්ෂකවරු දෙදෙනෙක් පත් කරන අතර මේ වන විට ඉන් එක් අයෙකුට පත්වීම් ලබා දී ඇති බවත් මීට අදාළව එම්. එස්. නසීර් නමැති හදිසි මරණ පරීක්ෂකවරයා විසින් ඉල්ලීමක් කර තිබූ අතර ඔහුගේ ලිපි ගොනුවේ පවතින ගැටලුවක්

හේතුවෙන් මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කිරීමට නියමිත බැවින් එය අවසන් වූ පසුව පත්වීම ලබාදිය හැකි බවත් අතිරේක ලේකම් (ප්‍රතිසංස්කරණ) විසින් දැනුම් දෙන ලදී.

## 3.9 ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

### 3.9.1 කළුතර අධිකරණ සංකීර්ණය වෙනත් ස්ථානයකට රැගෙන යාම

කළුතර නව අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කළුතර දිස්ත්‍රික්කයට නව අධිකරණ සංකීර්ණයක් ඉදිකිරීම සම්බන්ධව මෙම වසරේ සැලසුම්වල ඇතුළත් කර ඇති නමුත් එහි කටයුතු කඩිනමින් අවසන් කිරීම සම්බන්ධව තීරණයක් නොමැති බව අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී.

කළුතර නගර සැලැස්ම සකස් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඇති බවත් කළුතර අධිකරණ සංකීර්ණය පවතින ස්ථානය වෙනත් කටයුත්තක් සඳහා භාවිත කිරීමට සාකච්ඡා වූ නමුත් අධිකරණ සංකීර්ණය වෙනත් ස්ථානයකට රැගෙන නොයන්නේ නම් එම අදහස් ඉවත් කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කළුතර අධිකරණ සංකීර්ණය වෙනත් ස්ථානයකට රැගෙන යාම සම්බන්ධව කටයුතු මේ වන විට සාකච්ඡා මට්ටමේ පවතින බවත් මේ පිළිබඳ උපදේශන කටයුතු තාවකාලිකව නවත්වා ඇති බවත් අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී.

ආර්ථික අර්බුදයට පෙර අධිකරණ ගොඩනැගිලි 86ක් ඉදිකිරීමේ වැඩසටහනක් පැවැති බවත් කළුතර අධිකරණ සංකීර්ණය යනු විශාල ඉදිකිරීම් ව්‍යාපෘතියක් වන බැවින් එය තාවකාලිකව නවත්වා මේ වන විට අතරමඟ ඉදිකිරීම් නවතා ඇති අධිකරණ සංකීර්ණ 23 සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබා දීමට තීරණය කර ඇති බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් දැනුම් දෙන ලදී.

එම අධිකරණ සංකීර්ණ 23 ඉදිකර අවසන් වූ පසුව වසරකට විශාල ව්‍යාපෘති 1 - 2ක් පමණ සිදු කිරීමට සැලසුම් කර ඇති බවත් ආර්ථිකය යහපත් වූ පසු කළුතර අධිකරණ සංකීර්ණය ඉදිකිරීමට ප්‍රමුඛතාව ලබා දී කටයුතු කිරීමට හැකි බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් දැනුම් දෙන ලදී.

### 3.9.2 බේරුවල හපුගොඩ ප්‍රදේශයේ පිහිටි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සතු ඉඩම

බේරුවල හපුගොඩ ප්‍රදේශයේ පිහිටි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සතු ඉඩමක් අධිකරණ නියෝගයක් මත නිදහස් කර ඇති අතර ඉන්පසු ඊට අදාළ කටයුතු නැවතී ඇති බවත් මීට අදාළ ලේඛන ලබාදිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මෙම ඉඩම නැවත අමාත්‍යාංශය වෙත පවරාගෙන පොදු භාවිතය සඳහා යොදා ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව පෙ. ව. 11.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 මාර්තු මස 03**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (සභාපති)
ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍ය)
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා
ගරු චන්දන තෙන්නකෝන් මහතා
ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
ගරු නන්දන පත්මකුමාර මහතා
ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය
ගරු මනෝජ් රාජපක්ෂ මහතා
ගරු කංචන වැලිපිටිය මහතා
ගරු දේවානන්ද සුරවීර මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු ටී. කේ. ජයසුන්දර මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

**1. වෙනත් කරුණු**

**1.1 සමාජ ආරක්ෂණය සහ ප්‍රජා සවිබල ගැන්වීම සම්බන්ධයෙන් වූ සේවාවන් - ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් අමාත්‍යාංශය පිළිබඳව ලබා දුන් තොරතුරු ඉතා ප්‍රයෝජනවත් වන අතර ජනතාවට සහනාධාර සහ වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් විවිධ ගැටලු පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය තොරතුරු ප්‍රාදේශීය නිලධාරීන් මාර්ගයෙන් අදාළ රාජ්‍ය ආයතන සහ එහි නිලධාරීන් දැනුවත් කිරීම මඟින් මහජනතාවට අමාත්‍යාංශයේ සේවාවන් පහසුවෙන් ලබා ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරමින් පවතින බවත් ඉන් කිහිපයක් මේ වන විටත් ක්‍රියාත්මක කළ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එමඟින් රාජ්‍ය නිලධාරීන් ද දැනුවත් වන අතර කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත් කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ධීවර ප්‍රජාව වෙනුවෙන් පෙර ලබා දෙනු ලැබූ විශ්‍රාම වැටුප් අරමුදල මේ වන විට ලබාදීම නතර කර තිබේ ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

විධිමත් නොවන රැකියාවල නියුතු පුද්ගලයන්හට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම සිදු වූ බවත් මෙහිදී ධීවර සහ කෘෂි නියුක්තිකයින් ඒ සඳහා දායක කර නොගන්නා අතර ඔවුන් සඳහා වෙනත් විශ්‍රාම අරමුදල් ක්‍රම මේ වන විට ක්‍රියාත්මක බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

උතුරු සහ නැගෙනහිර පළාත්වල, විශේෂයෙන්ම මඩකලපුව දිස්ත්‍රික්කයේ දීර්ඝ කාලයක් පුරා පැවති යුධමය වාතාවරණයෙන් පීඩා විඳි ජනතාව විවිධ වූ දුෂ්කරතා මැද (උදා:- ආබාධ තත්ත්වයන්, මවුපියන් අහිමි වීම් ආදී) සිටින බැවින් ඔවුන්ට සහනදායී වැඩපිළිවෙලක් සකස් කර දීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

උතුරු සහ නැගෙනහිර විවිධ වූ අපහසුතා සහ අවදානම් සහගත තත්ත්වයේ පසුවන ජනතාව ද ආවරණය වන පරිදි දිවයින පුරා සිදුකරනු ලබන සුභසාධන කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ලාදුරු රෝගීන් සම්බන්ධයෙන් ද කිසිඳු සහනශීලී වැඩපිළිවෙළක් නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ද අවධානය යොමු කිරීම වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.2 සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු - ගරු දේවානන්ද සුරවීර මහතා**

දරිද්‍රතාවයෙන් පීඩිත ජන කොටස් සඳහාත්, ඉදිරි කාලසීමාව තුළ වැඩිහිටි ජනගහනය වර්ධනය වන තත්ත්වයට පෙර සූදානමක් ලෙසත් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය හඳුන්වා දී ඇති සුරැකුම/ ආරක්ෂාව වැනි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවලට දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයින් දායක වීමේ දී වාරික ගෙවීම් සම්බන්ධයෙන් ගැටලු පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

වර්තමානයේ සමාජ ආරක්ෂණ මණ්ඩලය පවත්වා ගෙන යනු ලබන එකී අරමුදල් ක්‍රමයන්ට ජනතාවට ප්‍රවේශ වීම ප්‍රයෝගිකව අපහසු බවත් මේ පිළිබඳව විශේෂ අවධානයක් ලබා දීමේ අවශ්‍යතාවයක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

"සෑම පුරවැසියෙකුටම ප්‍රීතිමත් විශ්‍රාම දිවියක්" යන තේමාව ඔස්සේ සියලු දෙනාටම විශ්‍රාම වැටුපක් හිමි විය යුතුය යන පදනමේ සිටින බවත් රජයේ සේවකයින් ඇතුළු පුද්ගලයින්ගේ මූලික වැටුප් වැඩි

කිරීම, වැඩි විශ්‍රාම වැටුපක් ලැබීමට අවස්ථාව සැලසීමේ මාර්ගයක් ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි අවිධිමත් රැකියා අංශයේ විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රම සම්බන්ධයෙන් ගැටලු පවතින අතර 1,000,000ක් පමණ ප්‍රතිලාභීන් සිටිය ද එයින් 40,000ක පමණ ප්‍රතිලාභීන් ප්‍රමාණයක් ක්‍රියාකාරි දායකත්වයක් දැක්වූ බවත් අවශ්‍ය ප්‍රතිපාදන පුළුල් කර නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඔස්සේ 45,000කට පමණ සීමා වී තිබුණු අවස්ථා 300,000ක පමණ ප්‍රතිලාභීන්ට ලබා දීමේ ඉලක්කයක් සහිතව කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

පවත්නා තත්ත්වයන් අනුව පූර්ණ වශයෙන් මහජනතාවගේ බදු මුදලින් පමණක්ම නොරැඳෙමින් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් මේ වන විට ක්‍රියාත්මක වන බවත් ඉදිරියේ දී ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන පරිදි මේ සඳහා අදාළ පනත් සංශෝධන සිදුකිරීමේ අවශ්‍යතාවයක් වෙතොත් එසේ කිරීමට හැකියාවක් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ග්‍රාමීය ජනයා සමඟ නිරතුරුවම රැඳෙමින් රාජකාරි කටයුතු කරන ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් ඇතුළු අනිකුත් නිලධාරීන් සතුව මෙම විශ්‍රාම වැටුප් ක්‍රම සම්බන්ධයෙන් අවම දැනුමක් පවතින බවත් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සම්බන්ධීකරණ නිලධාරියකු හරහා මෙකී ක්‍රියාවලිය මේ වන විට සිදුවන බැවින් ඒ පිළිබඳව අධීක්ෂණයක් සිදු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන විට බඳවා ගැනීම් 1,000,000ක් ඉක්මවා තිබුණ ද 350,000ක ක්‍රියාකාරී දායකත්වයක් පමණක් ඇති අතර මෙයට පාදක වූ විවිධ හේතූන් ඇති බව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

නමුත්, මෙම වසරේ දී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අස්වැසුම වැඩසටහන සම්බන්ධ කර ගනිමින් පුද්ගලයන් 250,000ක් පමණ බලගැන්වෙන වැඩසටහනක් සහ විවිධ ක්ෂේත්‍රවල නිරතවන (ස්වයං රැකියා ආදිය) පුද්ගලයන් බඳවා ගැනීමට ද සැලසුම් සකස් කර තිබෙන බව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට සම්බන්ධීකරණ නිලධාරියෙකු හරහා සම්බන්ධීකරණ කටයුතු සිදුකෙරෙන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 90%කට පමණ සමාජ ආරක්ෂණ නිලධාරීන් මේ වන විට පත් කර ඇති බවත් එම නිලධාරීන් විසින් එහි අනෙකුත් සියලුම නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම ද සිදුවන බවත් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ වන විට ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනු කමිටුවක් ලෙස සමාජ ආරක්ෂණ කමිටුව පත් කිරීම සඳහා යෝජනා කර ඇති බවත් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ අනුකමිටුවක් පත් කර, නිරන්තරයෙන් සමාජ ආරක්ෂණය පිළිබඳව අදාළ ක්ෂේත්‍රවල නිලධාරීන් දැනුවත් කරමින් ප්‍රතිලාභීන්

බඳවා ගැනීම සඳහා සැලසුම් කර තිබෙන බවත් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

එමෙන්ම, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි වාරික සම්බන්ධයෙන් ගැටලුවක් පවතින නමුත් විශ්‍රාම වැටුප් නොලබන ස්වයං රැකියාවල යෙදෙන සියලුම කණ්ඩායම් මේ සඳහා බඳවා ගත යුතු බවත් ඉදිරියේ දී සියලුම පුද්ගලයන්ට තම ක්‍රය ශක්තිය හා ගැළපෙන නව වාරික ක්‍රමයක් සහිත, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) වැඩසටහනට අනුව (සුරැකුම සහ ආරක්ෂාවට අමතරව) දායක වීමට හැකි නම්‍යශීලී වාරිකයක් සමඟ වැඩසටහනක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 1.3 ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

### 1.3.1 තරුණ ප්‍රජාව ආක්‍රමණය කරන මත්ද්‍රව්‍ය උවදුර

මේ වන විට සමාජය පුරා පැතිර යන මත්ද්‍රව්‍ය උවදුර උතුරු පළාතේ පාසල් සිසුන් හා තරුණ ප්‍රජාව අතර පැතිරීම හේතුවෙන් ආර්ථික හා සමාජ ගැටලු රාශියක් නිර්මාණය වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් සහ නිවැරදි මාර්ගෝපදේශ පාසල් දරුවන්ට සහ තරුණ ප්‍රජාවට අත්‍යවශ්‍ය බවත් එමඟින් එම ප්‍රදේශය පුරා පවත්නා සොරකම්, නීතිවිරෝධී කටයුතු රාශියක් අවම කර ගැනීමට හැකි වනු ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මාතෘ මූලික පවුල් රාශියක් ද ඇති අතර මෙම මත්ද්‍රව්‍ය උවදුරෙන් සිදුවන්නා වූ පීඩනයන්ට ඔවුන් මුහුණ දෙන ආකාරය සම්බන්ධයෙන් යම්කිසි සහනශීලී ක්‍රමවේදයක් පවතී ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ වන විට පාසල් සිසුන් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන්, පුනරුත්ථාපන වැඩසටහන් සහ සමාජ උපදේශන වැඩසටහන් ද ක්‍රියාත්මක වන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

පාසල් දරුවන්ගේ මානසික යහපැවැත්ම සහ ප්‍රවර්ධනය වෙනුවෙන් මත්ද්‍රව්‍ය මැඩලීමේ වැඩසටහන් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙන අතර මත්ද්‍රව්‍ය මැඩලීමේ වැඩසටහන් සහ ඊට සමගාමීව තරුණ ප්‍රජාවගේ මානසික යහපැවැත්ම උදෙසා වැඩපිළිවෙළක් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙන අතර යාපනය සහ මඩකලපුව දිස්ත්‍රික්ක ද ඊට ඇතුළත් බවත් අධ්‍යක්ෂ (උපදේශන) විසින් දැනුම් දෙන ලදී.

එකී පරිද්දෙන් වැඩසටහන් ක්‍රියාත්මක වුවත් ඉලක්කගත සමස්ත ප්‍රජාව ආවරණය වීමට ප්‍රමාණවත් නොවන බවත් වඩා ඵලදායි ප්‍රායෝගික ක්‍රියාවලියක් මේ සඳහා යොදා ගත යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පාසල් මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක වන අතර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් මෙකී මත්ද්‍රව්‍ය මැඩලීමේ කටයුතු කෙරෙන අතර මෙමඟින් සමාජයේ පැතිර යමින් තිබෙන තර්ජනාත්මක ගැටලු පාලනය කිරීමට දෙමාපියන්ගේ, ගුරුවරුන්ගේ මෙන්ම මුළු මහත් සමාජයේම සහයෝගය මෙකී කර්තව්‍ය සඳහා අපේක්ෂා කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මත්ද්‍රව්‍ය ගෙන්වීම, බෙදා හැරීම සහ භාවිතය යන සෑම පැතිකඩක් ඔස්සේම රජය මත්ද්‍රව්‍ය මර්දනය කිරීම සඳහා කැප වී සිටින බවත් මෑත කාලයේ දී මත්ද්‍රව්‍ය අතිවිශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගත් බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාමාර්ගය තුළින් මූලිකව මත්ද්‍රව්‍ය ගෙන්වීමේ ජාලය බිඳ දැමීම රජයේ ප්‍රධානම කාර්යභාර්ය බවත් මේ සඳහා විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවක් ඒකරාශී වී කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවූවන් පුනරුත්ථාපනය, පාසල් මට්ටමින් දැනුවත් කිරීම සහ අවශ්‍ය උපදේශන සේවා සැපයීම ආදී සමාජ ආරක්ෂණ කටයුතු කිහිපයක් පමණක් මෙම අමාත්‍යාංශය යටතේ සිදු කෙරෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සමාජය මත්ද්‍රව්‍ය උවදුරෙන් බේරාගැනීම සඳහා මහජනයා සතුව දැවැන්ත කාර්යභාර්යක් ද ඇති බව පෙන්වා දෙමින් මේ වන විට සිදුවෙමින් පවත්නා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා පිළිගනිමින්, ඉදිරි කාලය තුළ වඩා සාර්ථකව මෙම කටයුතු ඉටු කිරීම සඳහා උත්සාහ කරන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 1.3.2 අස්වැසුම අරමුදල ලබා දීම

ග්‍රාමීය ජනතාවට අස්වැසුම අරමුදල් ලබාදීමේ දී සලකා බලනු ලබන සුදුසුකම්වලට පදනම් වන නිර්ණායක සහ ඒ හා සම්බන්ධ සංසන්දනාත්මක කරුණු ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම දත්ත ගොනු නඩත්තු කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පෙර දැනුම් දුන් ආකාරයටම ඩිජිටල් තලයක් ඔස්සේ මෙම කටයුතු සිදු වූවත් පවතින අඩුපාඩු නිවැරදි කරගනිමින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම තුළින් මෙම කටයුතු නිරාකරණය කරගැනීම සඳහා තම අමාත්‍යාංශය කටයුතු සිදු කරන බවත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් එකී අස්වැසුම අරමුදල නියාමනය කරන බැවින් එම අමාත්‍යාංශය අදාළ කටයුතු සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම ද අත්‍යවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.4 සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම - ගරු නන්දන පත්මකුමාර මහතා**

සමාජ ආරක්ෂණ ක්‍රියාවලියේ දී වැඩිහිටියෙකුට ජීවත් වීමට සැලකිය යුතු මුදලක් ලැබිය යුතු බවත් පෙර සඳහන් කරනු ලැබූ සමාජ ආරක්ෂණ අරමුදල් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

බොහෝ අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල සැලකිය යුතු පිරිසක් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වෙමින් සිටින බැවින් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සමාජ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා ක්‍රම වයස, බලාපොරොත්තු වන විශ්‍රාම වැටුප සහ අවශ්‍යතාව අනුව තෝරාගැනීමට හැකියාව පවතින බව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

විශ්‍රාම වැටුප් ගෙවීමේ දී 1996 වර්ෂයේ බැඳුණු පුද්ගලයන් රු. 500/- මට්ටමේ සිටින තත්ත්වයක් දැකගත හැකි අතර වර්තමානයේ දී රු. 50,000/-ක් පමණ විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින් සිටින බව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට ලක්ෂ 04ක් පමණ සක්‍රීය සාමාජිකයන් සිටින අතර නව සාමාජිකයන් මිලියනයක් පමණ බැඳුන නමුත් වාරික නොගෙවීම මත එම ගිණුම් අක්‍රීය වී ඇති බවත් එම වාරික එකතු කිරීමට කටයුතු කරමින් සිටින බවත් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කළ පරිදි පිරිවැය ආවරණය කරගනිමින් අවම වාරික ක්‍රමයක් යටතේ නව විශ්‍රාම යෝජනා ක්‍රමයක් සැලසුම් කරමින් සිටින බව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අවම වශයෙන් රු. 18,000/-ක විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ හැකියාව සැලසෙන පරිදි මෙය සැලසුම් කර ඇති අතර අවුරුදු 18 දී සාමාජිකත්වය ගනු ලබන සාමාජිකයෙකුට රු. 50,000/-ක මාසික විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබෙන බවත් අවුරුදු 55 - 56ක සාමාජිකයන්ට රු. 18,000 - 20,000/-ක මාසික විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට සැලසුම් යෝජනා කර තිබෙන බවත් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**1.5 වැඩිහිටි දීමනා ප්‍රතිලාභීන් මුහුණදෙන ගැටලු - ගරු කංචන වැලිපිටිය මහතා**

වැඩිහිටි දීමනාව අස්වැසුම ගිණුමට බැර කිරීමෙන් ග්‍රාමීය වැඩිහිටි ජනතාව අපහසුතාවයට පත් වන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන විට වැඩිහිටි දීමනාව ද අස්වැසුම ප්‍රතිලාභීන් ලබා දී ඇති ගිණුමටම බැර කළ ද අස්වැසුම ප්‍රතිලාභ නොලබන අවුරුදු 70ට වැඩි

410,000කට ආසන්න වැඩිහිටියන් ප්‍රමාණයකට පෙර පැවති අයුරින්ම ගෙවීම් සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන එකම දත්ත පද්ධතිය වන මෙය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් මෙම ගැටලුව ඇති වී ඇති බැවින් එම පද්ධතිය පාදක කර ගනිමින් සමාජ ආරක්ෂණ ක්‍රියාවලි කිහිපයක් ක්‍රියාත්මක වන බැවින් එකී ගැටලු නිරාකරණය කිරීමේ පොදු අවශ්‍යතාවයක් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් ප්‍රශ්නාවලියක් සකස් කර එය දත්ත පද්ධතියට අන්තර්ගත කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතින බවත් පවත්නා දත්ත පද්ධතියේ අඩුපාඩු පැවතිය ද සමස්ත සුභසාධන ප්‍රතිලාභීන්ගේ දත්ත ඇතුළත් එකම මූලාශ්‍රය එය වන බැවින් පවත්නා අභියෝගයන්ට මුහුණ දෙමින්, කෙටි කාලයක් තුළ එහි සංශෝධන සිදු කර අවශ්‍ය සේවාව කාර්යක්ෂමව සැපයීමට මේ වන විටත් කටයුතු කරමින් සිටින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය වශයෙන් අස්වැසුම ප්‍රතිලාභීන් සතු අභියාචනා සලකා බැලීම සඳහා මේ වන විට නිලධාරීන් තිදෙනෙක් (ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී සහ සමෘද්ධි නිලධාරී) සහ ප්‍රජා නියෝජිතයෙකු ද ඇතුළත්ව ග්‍රාමීය වශයෙන් කමිටුවක් පත් කර, ඒ ඔස්සේ පවත්නා ගැටලු අවම කර ගෙන කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල චක්‍රලේඛයක් මඟින් දැනුවත් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමා පෙන්වා දුන් පරිදි පවත්නා අඩුපාඩු නිරාකරණය කර ගනිමින් මැයි මාසය පමණ වන විට මෙකී දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඇතුළු අවශ්‍ය සියලු පාර්ශ්වයන් සමඟ සාකච්ඡා පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.6 ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

### 1.6.1 සුහුරු ගම්මාන සංකල්පය

"සුහුරු ගම්මාන" (Smart Villages) සංකල්පය පිළිබඳව හැඳින්වීමක් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

1952 දී සීදුව ප්‍රදේශයේ ආරම්භ වූ, සමාජ සංවර්ධන ආයතනය සමාජ වැඩ පිළිබඳව උපාධිය ප්‍රදානය කරන ආයතනයක් වන අතර ප්‍රධාන වශයෙන් සමාජ වැඩ පාසල, පර්යේෂණ අංශය සහ පුහුණු කිරීම යන ත්‍රිත්වය ඔස්සේ සමාජය සවිබලගැන්වීමේ අරමුණින් පවත්වා ගෙන යනු ලබන බව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී අවදානම් සහගත සමාජ කණ්ඩායම් ඉන් මුදවාගෙන සමාජ සවිබලගැන්වීම සඳහා අභිමුඛ කණ්ඩායම් ලෙස තෝරා ගනු ලබන අතර අවශ්‍ය කරන දැනුම ලබා දීම සිදු කෙරෙන බව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

සුහුරු ගම්මාන (Smart Villages) ඇති කිරීම පිළිබඳ සංකල්පයක් මෙම වර්ෂයේ සිට වැඩසටහනට අන්තර්ගත වන බවත් එහිදී විවිධ පළාත්වල ග්‍රාම නිලධාරී වසම් 09ක් තෝරාගෙන එහි සිටින සවිබල ගැන්විය යුතු පවුල් හඳුනා ගැනීමෙන් අනතුරුව සමාජ වැඩ උපාධිය හදාරන සිසුන් යොදාගෙන විවිධ වැඩසටහන් වෙත ප්‍රතිලාභීන් යොමු කරමින් දැනුවත් කිරීමේ සහ සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ස්වයං රැකියා වැඩසටහන් සඳහා යොමු කරනු ලබන බවත් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙය නියමු ව්‍යාපෘතියක් (Pilot Project) ලෙස පෙර සඳහන් කළ පරිදි තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 09ක ක්‍රියාත්මක කළ බවත් 2025 වර්ෂයේ දී ශිෂ්‍යයන් ඊට සම්බන්ධ කරමින් තවදුරටත් ප්‍රායෝගික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට තක්සේරු වාර්තා (Need Assessments) සකස් කරමින් සිටින බව ද ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 1.6.2 අඩු ආදායම්ලාභී සීමාව නැවත තක්සේරු කිරීමේ අවශ්‍යතාව

මේ වන විට පවත්නා අඩු ආදායම්ලාභී සීමාව නැවත තක්සේරු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

යම්කිසි පවුලක් සඳහා ආධාර ලබාදීමේ දී එකී පවුලේ සාමාජිකයින්ගේ තත්ත්වය (පවුලේ පසුබිම) සම්බන්ධයෙන් සහ එම පවුලට ලැබෙන ආධාර සම්බන්ධයෙන් (උදා: ආබාධ සහිත දරුවන් සිටින පවුල්) සොයා බලා කටයුතු කිරීම වඩා සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඇතැම් පුද්ගලයින් ආධාර ලැබීමේ මට්ටමේ නොසිටින නමුත් ආධාර ලබන බව දැක ගත හැකි බැවින් ප්‍රතිලාභීන් තෝරාගැනීමේ දී උචිත නිර්ණායක සැකසිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ආබාධ සහිත පුද්ගලයින් වර්ගීකරණය දශකයකට අධික කාලයක් පුරා සාකච්ඡාවට ගත් නමුත්, නිවැරදි වර්ගීකරණයක් හෝ නිර්වචනයක් මෙතෙක් නොමැති බවත් මිහිමිත් ප්‍රජාව මෙහිදී ආබාධ සහිත කණ්ඩායමක් ලෙස නොසලකා හැරීම මෙන්ම රුධිරාබාධ (උදා:- තැලිසීමියා, ලියුකේමියා) ආබාධිත වර්ගීකරණයට නොගැනීම සම්බන්ධයෙන් ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, ඉදිරි මාස කිහිපය තුළ මෙම සංගණනය සිදු කිරීමේ හැකියාව, ඒ සඳහා පවතින වැඩපිළිවෙළ සහ පෙර සඳහන් කරන ලද ඉලක්ක සපුරාගැනීමේ හැකියාව පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වකුගඩු දීමනාව සඳහා සුදුසුකම් ලැබීමට නම් ග්ලෝමියුලර් පෙරීමේ අනුපාතය (GFR) 30 දක්වා සලකා බැලීමට නියමිතව තිබුණ ද එය ලේ පිරිපහදු මට්ටම වන මෙම රෝගයේ දරුණුතම අවස්ථාවක් බැවින්

ඊට පෙර අවධියේ දී මෙම දීමනාව ලබා දීමට කටයුතු සිදු කිරීමට එය (GFR) 90 දක්වා ඉහළ නැංවීමට යෝජිත බව ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට රෝගීන් 47,000කට වකුගඩු දීමනාව ලබා දෙන බවත් පැවති සාකච්ඡා අනුව එය තවදුරටත් 3,000 කින් පමණ වැඩි කළ හැකි බවත් ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

පවතින අවශ්‍යතාවය මූලික කර ගනිමින් මේ වන විටත් යම් ප්‍රමාණයකට ඉහළ දමන ලද වකුගඩු දීමනාලාභීන් සංඛ්‍යාව තවදුරටත් සැලකිය යුතු ප්‍රමාණයක් ඉහළ නැංවීමට යෝජනා කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දී ඇති වර්ගීකරණය අනුව බිහිරි බව, අන්ධභාවය, බුද්ධිමය ආබාධිතභාවය, චලනය, කථනය, මනෝචිකිත්සාව, අපස්මාරය යන අංශ 7 ඔස්සේ ආබාධ සහිත පුද්ගලයින් කාණ්ඩ හතක් ඔස්සේ වර්ගීකරණය කර ලිඛිතව දන්වා ඇති බව ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ වන විට එම වර්ගීකරණය ප්‍රායෝගික නොවන බවත් වෛද්‍යවරුන් විසින් පෙන්වා දෙනු ලබන සෞඛ්‍යමය තත්ත්වයන්වලින් ඔබ්බට සමාජ විද්‍යාත්මක ගැටලුවක් ලෙස සලකා බලා අවශ්‍ය වෙනස්කම් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වන විට වෛද්‍ය ආකෘතියෙන් බැහැරව සමාජයීය ආකෘතියක් ලෙස ගෝලීයකරණ වෙනස්වීම් හමුවේ මෙකී නිර්ණායකයන් වෙනස්විය යුතු බවත් අදාළ විශේෂඥයින් සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදුකිරීමට ක්‍රියා කරන ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ නිලධාරීන් හට උපදෙස් ලබාදෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.7 කාර්යක්ෂම, නිවැරදි දිශානතියක් ඔස්සේ සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය සිදුවීම - ගරු චන්දන තෙන්නකෝන් මහතා**

දිළිඳු ජනතාව බලගැන්වීමේ වැඩසටහන් පිළිබඳව සැලකීමේ දී සාපේක්ෂව අස්වැසුම ප්‍රතිලාභීන් යනු බලපෑම් කළ නොහැකි, බැඳියාව අවම තත්ත්වයක පැවතෙන හුදෙක් මූල්‍යාධාර ලබාදීමට පමණක් සීමා වී ඇති පාර්ශ්වයක් බැවින්, මෙය යම්කිසි නිශ්චිත ආකෘතියකට ගොනු කිරීමේ හැකියාව පවතී නම් එය වඩාත් උචිත බවත් නිලධාරීන්ගේ අඛණ්ඩ මැදිහත්වීමත් සමඟ කාර්යක්ෂම, නිවැරදි දිශානතියක් ඔස්සේ මෙකී සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය සිදුවිය යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මූල්‍යමය සහනාධාර මෙන්ම නිෂ්පාදන සහනාධාර අංශය වැඩිදියුණු කිරීම සඳහා යම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ දිළිඳුභාවය වර්ධනය වීම වැළැක්වීමට තෝරාගත්

ග්‍රාමයක පවුල් කිහිපයක් නිශ්චිත කාලරාමුවක් තුළ දිරිගැන්වීමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක වේ ද යන්න පිළිබඳව දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ඔස්සේ අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වන අතර තම අමාත්‍යාංශයේ කාර්යභාර්ය ප්‍රජාව සවිබලගැන්වීම බවත් ඒ අනුව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ඒ සඳහා යොමු කිරීමට කටයුතු කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

අමාත්‍යාංශ දෙකක් ඔස්සේ දීමනා සහ සවිබලගැන්වීම සිදු කිරීමේ ප්‍රායෝගික ගැටලුවක් පවතින බවත් මෙය නිරීක්ෂණය කිරීමේ දී එකී සුභසාධන පනතේ සඳහන් පරිදි කටයුතු කිරීම මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සතු කාර්යභාර්යක්ව තිබිය යුතු බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම වර්ෂයේ පවුල් ලක්ෂ 4ක් සවිබල ගැන්වීම අරමුණ බවත් ඒ ඔස්සේ මේ වන විටත් අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සඳහා පංචවිධ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති බවත් අස්වැසුම ප්‍රතිලාභ ලැබිය යුතු නමුත් ඒ සඳහා ඇතුළත් නොවූ පිරිසක් මෙන්ම දැනට අස්වැසුම ලබන නමුත් ඒ සඳහා නුසුදුසු පුද්ගලයින් යන දෙකොට්ඨාසයම මෙහි අන්තර්ගත තත්ත්වයක් ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ලෝක බැංකුවේ ආධාර, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහ රජයේ අරමුදල් යන ත්‍රිත්වය දායක කර ගනිමින් ව්‍යාපෘති 03ක් එක් කොට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙහි ප්‍රථම පියවර ලෙස දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක වශයෙන් සිදු කෙරෙන බවත් අප්‍රේල් මාසයේ සිට මෙම සවිබල ගැන්වීමේ වැඩසටහන සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ මූලික කාර්ය වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.8 වකුගඩු රෝගීන් සඳහා ආධාර ලබාදීම - ගරු ටී. කේ. ජයසුන්දර මහතා**

වකුගඩු රෝගීන් සඳහා ආධාර ලබාදීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ දැනුම් දී ඇති පරිදි සීමාවක් පවතින බවත් එහිදී බොහෝ රෝගීන් අසරණ වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව යම්කිසි සහනයක් ලබාදීමේ හැකියාවක් පවතී ද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

වකුගඩු රෝගීන් නිශ්චිතවම හඳුනා ගැනීමේ හැකියාවක් තිබෙන අතර ඔවුන්ට අදාළ දීමනා ලබාදීමට කිසිඳු අපැහැදිලි කාරණාවක් නොමැති බැවින් මෙම ආධාර ලබාදීමේ දී රෝගීන් සංඛ්‍යාව තව කොතෙක් දුරට වැඩි කළ හැකි ද එනම්, සීමාවකින් තොරව මෙකී කටයුත්ත සිදු කළ

නොහැකිද යන්න සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් විමසීමක් කරන ලදී.

මේ වන විට රෝගීන් 47,000කට වකුගඩු දීමනාව ලබා දෙන බවත් පැවති සාකච්ඡා අනුව එය තවදුරටත් 3,000කින් පමණ වැඩි කළ හැකි බව පැවති සාකච්ඡාවල දී සඳහන් කළ බවත් ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

වකුගඩු රෝගීන් මෙන්ම ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධව ද මෙකී ආධාර දීම සම්බන්ධ ගැටලුව පැනනැඟුණු බවත් මෙවර අයවැයෙන් එකී දෙපාර්ශ්වය සඳහාම ලබාදෙන දීමනාව අප්‍රේල් මාසයේ සිට රු. 7,500/- සිට රු. 10,000/- දක්වා ඉහළ නැංවීමට කටයුතු කර තිබෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම රජය පත්වීමට පෙර ආබාධ සහිත පුද්ගලයින් 420,000කට දීමනා ලබා දීමට ගැසට් කර තිබූ නමුත් 136,000කට ආසන්න ප්‍රමාණයකට පමණක් දීමනා ලබා දී තිබූ බැවින් ගැසට් කර තිබූ ආකාරයට තවදුරටත් එම සංඛ්‍යාව ඉහළ දැමීමට හැකියාව පවතින බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට ආබාධිත දීමනාව පුද්ගලයින් 136,057කට සහ වකුගඩු දීමනාව පුද්ගලයින් 47,027කට ලබා දෙන බවත් මෑතක දී පවත්වන ලද සාකච්ඡාවකින් පසු ගරු අමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි, සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් තවදුරටත් මෙම සුභසාධනය අවැසි පුද්ගලයින් හඳුනාගෙන එම දීමනාව ලබා දීමට කටයුතු කිරීමට යෝජනා වූ බවත් ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

ආබාධ සහිත පුද්ගලයින් විග්‍රහ කිරීම සහ වෙන් කර හඳුනා ගැනීම සඳහා පවතින නිර්ණායක පිළිබඳව දැනුවත් කරන ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහිදී උපතින්ම ආබාධ සහිත සහ වූ පසුව යම් අනතුරකින් ආබාධ තත්ත්වයට පත් වූ යන දෙකොට්ඨාසයම ආබාධිත ගණයට ගනු ලබන බව 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතෙහි අදාළ නිර්වචනයන් සහිතව ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලදී.

මෙහිදී ප්‍රයෝගික ගැටලු පවතින බවත් ආබාධ තත්ත්වයන් සම්බන්ධයෙන් නිසි පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර තහවුරු කිරීමෙන් අනතුරුව නිසි අයුරින් කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම වකුගඩු රෝගීන් සම්බන්ධ පොරොත්තු ලේඛන පවතින බැවින් මේ සම්බන්ධ නෛතික රාමුව පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස ගරු චන්දන තෙන්නකෝන් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහිදී සෑම විටම අඩු ආදායම්ලාභීන් හඳුනා ගනිමින් කටයුතු කරන බවත් ලබා දෙනු ලබන දීමනා අගයන් ඉහළ දැමීම සිදු කරන නමුත් එහිදී ද යම්කිසි සීමාවන්වලට යටත්ව කටයුතු කිරීමට සිදු වන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ආබාධ සහිත ජනතාව සම්බන්ධයෙන් පූර්ණ නිරවද්‍යතාවයකින් යුත් ගණනය කිරීම් නිශ්චිතව තවමත් හමු වී නොමැති අතර තම රජය ප්‍රථමයෙන් පෙර කී දත්ත පද්ධතියේ අවශ්‍ය යාවත්කාලීන කිරීම් සිදු කිරීමට සැලකිලිමත් වන බවත් මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් අදාළ නිළධාරින් ද තවදුරටත් දැනුවත් කිරීම සිදු කරනු ලබන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී එම අදාළ පුද්ගලයින් ආබාධිතභාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය වාර්තාවක් ද අඩු ආදායම්ලාභීන් ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරී විසින් සහතික කිරීම සිදුවිය යුතු බව ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙවර අයවැයෙන් වෙන් වූ රු. මිලියන 100ක අමතර ප්‍රතිපාදනයන් ද මේ සඳහා යොදවමින් ආබාධ සහිත ජනතාව වර්ගීකරණය සඳහා වන දත්ත පද්ධතිය සකස් කිරීමට යොදා ගනු ලබන බවත් ද මෙතුළින් සමාජ ආරක්ෂණය අවැසි සියලු ජන කොටස් හඳුනා ගැනීමට හැකියාව සැලසීම අරමුණ වී ඇති බවත් ද ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**1.9 දිළිඳුකම හා බැඳුණු ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැටලුව - ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**

පෙර සඳහන් කරන ලද සීමාවන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් නිසි ලෙස දැනුවත් කිරීමේ අවශ්‍යතාවය දැඩිව පවතින බවත් එසේ නැතහොත් නිවැරදි දත්ත ජනතාව වෙත ලබා නොදීමෙන් මහජනතාව අපහසුතාවයන්ට පත් වන බවත් ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, උතුරු සහ නැගෙනහිර පළාත්වල දිළිඳුකම හා බැඳුණු, ක්ෂුද්‍ර මූල්‍ය ණය ගැටලුවෙන් පීඩිත ප්‍රජා කණ්ඩායම් හඳුනාගෙන මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති මඟින් යම් සහනදායි වැඩපිළිවෙළක් ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහිදී මෙකී තත්වයන්ට මුහුණ දී ඇති කාන්තාවන් සම්බන්ධයෙන් ද විශේෂ අවධානයක් දී ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.** කාරක සභාව පෙ.ව. 11.50 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---------------------------------------------------------------------------

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2025 මාර්තු මස 07**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (සභාපති)
ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය)
ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
ගරු අබූබකර් අතම්බාවා මහතා
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
ගරු චන්දන තෙන්නකෝන් මහතා
ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
ගරු නිමල් පලිහේන මහතා
ගරු රුවන් මාපලගම මහතා
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
ගරු මංජුල සුගත් රත්නායක මහතා
ගරු සුනිල් රාජපක්ෂ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ගමගෙදර දිසානායක මහතා
ගරු රවී කරුණානායක මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා
ගරු තිලංක යූ. ගමගේ මහතා
ගරු ටී. කේ. ජයසුන්දර මහතා
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
ගරු නිශාන්ත පෙරේරා මහතා
ගරු ලාල් ප්‍රේමනාත් මහතා
ගරු සුදත් බලගල්ල මහතා
ගරු ඊ. එම්. බස්නායක මහතා
ගරු තුරෛරාසා රවිකරන් මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු අරවින්ද සෙනරත් මහතා
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

**(i) 2022 වර්ෂය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව**
(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව**

(2024.12.17 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**(iii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව**
(2025.01.07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**(iv) 2023 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව**
(2025.01.07 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

සලකා බැලීමෙන් අනතුරුව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද ඉහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

## 2. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

මේ වසර තුළ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ වැදගත් තීරණ ගැනීමට සිදුවන බවත් අධ්‍යාපනය පිළිබඳ අනු කාරක සභා කිහිපයක් පත් කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදු කිරීමට බලාපොරොත්තු වන පරිවර්තන ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබාදීම, ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම, පවතින අධ්‍යාපන ක්‍රමය තුළ පැන නැඟී ඇති ගැටලු යනාදිය සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබා ගැනීමට අනුකමිටු පත්කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 2.1 වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම

ඇතැම් ආයතනවල වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් පවතින බවත් මෙම වාර්ෂික වාර්තාවල පවතින ඇතැම් කරුණු විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා වන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මෙම වාර්ෂික වාර්තාවල පවතින කරුණු සම්බන්ධව සියලු දෙනා සලකා බැලිය යුතු බව ද ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

විගණන සහ කළමනාකරණ වාර්තාව වාර්ෂික වාර්තාවේ කොටසක් වන බවත් ඒ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් සහ ආයතන මට්ටමින් පසු විපරම සිදුකරගෙන යන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

විගණන සහ කළමනාකරණ වාර්තාවේ පවතින නිරීක්ෂණවලට ප්‍රතිචාර දැක්වීමටත් නිවැරදි කරගත යුතු ස්ථාන නිවැරදි කර ගැනීමටත් කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

**2.2 අනු කාරක සභා පත්කර ගැනීම**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, පාසල්වල පවතින මානව හා භෞතික සම්පත් ඌනතාවය, පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා ළමයින් ඇතුළත් කිරීම, අධ්‍යාපන සභාව පිහිටුවීම, උසස් අධ්‍යාපන අංශය, නිපුණතා අධ්‍යාපන අංශය යනාදී අංශවලින් අනු කාරක සභා කිහිපයක් පත්කරගෙන ඒ පිළිබඳව වැඩිදුර සාකච්ඡා කළ යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

**2.3 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ**

2026 වන විට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර 2025 වසර තුළ සාමාන්‍ය අධ්‍යාපනයට මූලිකත්වය ලබා දෙමින් මෙම වසර තුළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා සූදානම් වන බවත් මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ නව විෂය නිර්දේශයක් හඳුන්වාදීම, මානව සම්පත දියුණු කිරීම, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, ජනතාව දැනුවත් කිරීම, ඇගයීම සහ තක්සේරු කිරීම යනාදී ආකාරයේ ප්‍රධාන කුළුණු පහක් පවතින බවත් ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

2026 වර්ෂයේ දී 01 ශ්‍රේණියට සහ 06 ශ්‍රේණියට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන අතර එම අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව 2029 වර්ෂයේ දී මෙම කණ්ඩායම අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දෙන බවත් අ.පො.ස. සාමාන්‍ය පෙළ 10 ශ්‍රේණියේ විෂය මාලාව දිගු කාලයක් පුරා සංශෝධනය නොකිරීම හේතුවෙන් එම විෂය මාලාව නැවත සමාලෝචනය කිරීමක් සිදුකරන අතර අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙම විෂය මාලාව සමාලෝචනය කිරීම සිදුකරන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට නම් අවම වශයෙන් ගුරුවරුන්, විදුහල්පතිවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ මීට අදාළ නිලධාරීන් ලක්ෂයක් පමණ 2025 වර්ෂයේ දී පුහුණු කළ යුතු වන අතර එය 2025 වර්ෂයේ දී අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කටයුත්තක් වන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

**3. වෙනත් කරුණු**

**3.1 ගරු ටී. කේ. ජයසුන්දර මහතා**

**3.1.1 පූර්ව ළමා විය අධ්‍යාපනය**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට පූර්ව ළමා විය සංවර්ධනය සඳහා වන අධ්‍යාපනය අයත් වන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

පූර්ව ළමා විය අධ්‍යාපනය සම්බන්ධව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විෂය මාලාව සකස් කිරීම සහ ගුරු පුහුණුව ආරම්භ කිරීමට කටයුතු කරන බවත් ප්‍රාථමික අංශය, කනිෂ්ඨ ද්විතියික අංශය සහ ජ්‍යෙෂ්ඨ ද්විතීක අංශය යනුවෙන් වසර

13ක් අධ්‍යාපනය ලබාදීම සහ පූර්ව ළමා විය අධ්‍යාපනය සඳහා වසර 02ක් ලබා දෙන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.1.2 සම්පත් බෙදී යාමේ අසමානතාව

දිස්ත්‍රික්කය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පත් බෙදීයාමේ අසමානතාව සමනය කිරීමට මෙම නව ක්‍රමවේදය තුළින් ගෙන ඇති පියවර සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අසමානතාව අඩු කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන අතර තාක්ෂණය හරහා අසමානතාවයන් අඩු කිරීමට මැදිහත් වන ආකාරය පිළිබඳව සාකච්ඡා කරන බවත් ගුරුවරයාට මෙහි වැදගත් භූමිකාවක් පවතින බැවින් ගුරු පුහුණුව ලබාදීමට කටයුතු කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

ගුරුවරුන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන අනෙකුත් පුද්ගලයින්ගේ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අධ්‍යාපන සභාව හරහා ද කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 3.2 විශේෂ අධ්‍යාපන උපදේශක සභාව පත් කිරීමේ ප්‍රමාදය - ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ දී අන්තර්කරණීය අධ්‍යාපන සංකල්පය සහිතව පන්ති කාමරය, විෂය මාලාව, ගුරු පුහුණුව ආදී සෑම අංශයකදීම ආබාධ සහිත ප්‍රජාව ඇතුළත් කර ගැනීමත්, ඔවුන් පිළිබඳව දරුවන් තුළ ධනාත්මක සිතුවිලි ඇතිකර ගැනීමත් අපේක්ෂා කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

විශේෂ අධ්‍යාපන උපදේශක සභාව මේ වන විටත් පත් කර නොමැති බැවින් මේ පිළිබඳව ද අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

විශේෂ අධ්‍යාපන උපදේශක සභාව පත් කිරීමේ ප්‍රමාදයක් පැවතිය ද මේ වන විට එහි පත් කිරීම් සිදුකර ඇති බවත් පත්වීම් ලිපි ලද විගසම මාර්තු මාසය අවසන් වීමට පෙර විශේෂ අධ්‍යාපන උපදේශක සභාව පත් කිරීමේ නිවේදනය සිදුකරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

විශේෂ අධ්‍යාපන උපදේශක සභාව පත් කිරීමේ ප්‍රමාදයක් ඇති වූ බව පිළිගන්නා බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී .

## 3.3 ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා

### 3.3.1 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

අධ්‍යාපන ප්‍රතිසංස්කරණය තුළින් පාසල් පද්ධතිය නවීකරණය කිරීම සම්බන්ධව අදහස් පැවැති අතර පාසල්වල ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිවීම, වැසිකිළි පහසුකම් නොමැතිවීම ආදී ගැටලු සම්බන්ධව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ලබාදෙන විසඳුම් සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

2025 වර්ෂය තුළ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වෙන්කර ඇති මුදල්වලින් වැඩි ප්‍රමාණයක් පාසල්වල මූලික පහසුකම් ලබාදීම සඳහා වැය කරන බවත් දරුවාගේ ඉගෙනුම් පරිසරය සහ පාසලක තිබිය යුතු අවම නිර්ණායක ද හඳුනාගෙන එම මට්ටමට ළඟා කරගත හැකි පාසල් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

පාසල් 10,000ක් අතරින් සිසුන් 50ට වඩා අඩුවෙන් අධ්‍යාපනය ලබන පාසල් 1,502ක්, සිසුන් 100ට වඩා අඩුවෙන් අධ්‍යාපනය ලබන පාසල් 3,000ක් සහ සිසුන් 500ට වඩා අඩුවෙන් අධ්‍යාපනය ලබන පාසල් 5,000ක් පමණ පවතින අතර සිසුන් 50ට වඩා අඩුවෙන් අධ්‍යාපනය ලබන පාසල්වල පාසලක තිබිය යුතු අවම නිර්ණායක පවතී ද යන්න සම්බන්ධව ගැටලුවක් පවතින බවත් මෙම පාසල් හඳුනාගැනීමේ නියමු ව්‍යාපෘතියක් මේ වන විටත් සිදුකර ගෙන යන අතර එය ප්‍රතිසංවිධානය කරනු ලබන ආකාරය සම්බන්ධව මේ වන විට කටයුතු සිදු කරමින් යන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ප්‍රවාහන පහසුකම් නොමැති වීම, දේශපාලන අවශ්‍යතාවයන් මත පාසල් ස්ථානගත නොකිරීම, නිසි සම්පත් ලැබිය යුතු පාසල් හඳුනාගෙන කටයුතු කිරීම ඉතා වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එක් එක් පාසල තුළ පවතින වෙනස්කම් හේතුවෙන් ක්ෂේත්‍ර චාරිකාවක් සිදුකර මේ සම්බන්ධව තීරණ ගත යුතු බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

පළාත් 09 තුළ පාසල් 200ක් මේ වන විට භෞතිකවම පරීක්ෂා කර ඇති බවත් ඒ තුළ පාසල් ප්‍රතිසංවිධානගත කිරීමේ බහුතර හැකියාවක් පවතින බවත් පළාත් අධ්‍යාපන කාර්යාල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල මගින් ලබා දෙන නිරීක්ෂණ අනුව කටයුතු කිරීමට සිදුවන අතර පාසලෙන් පාසලට මේ පිළිබඳව වෙන් වෙන් වශයෙන් තීරණ ගැනීමට සිදුවන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ලංකාව පුරා ජන වර්ග අනුව පාසල් බොහෝමයක් ස්ථානගත කර ඇති අතර එම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන් සමාජානුයෝජනය කිරීමට බාධා ඇතිවී ඇති බැවින් පාසල් නැවත ස්ථානගත කිරීමේ ක්‍රියාවලියේ දී මේ සම්බන්ධව අවධානය යොමු කළ යුතු බව ගරු චන්දන තෙන්නකෝන් මහතා විසින් දැනුම් දෙන ලදී.

### 3.3.2 සියනෑ ජාතික පාසලට විදුහල්පතිවරයෙක් පත් කිරීම

සියනෑ ජාතික පාසලට විදුහල්පතිවරයෙක් ලබාදෙන ලෙස කිහිප වරක් ඉල්ලීම් කළ ද මේ වනතෙක් පාසලට විදුහල්පතිවරයෙකු නොමැති බවත් තවත් පළාත් සභා පාසල් කිහිපයක මෙම ගැටලුව පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කොළඹ ප්‍රධාන පෙළේ පාසල් ඇතුළු දිවයින පුරා ජාතික පාසල් 49ක විදුහල්පති තනතුරු සඳහා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවූ අතර ලැබුණු අයදුම්පත් 29 සලකා

බලා මේ වන විට සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් වූ නමුත් ඒ අතරින් පුරප්පාඩු පිරවිය හැකි වන්නේ පාසල් 15ක පමණක් බවත් පවතින තත්ත්වය අනුව අයදුම්පත් එවනු ලබන අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් පසුව අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් හට අවස්ථාව ලබා දී ක්‍රමයෙන් පහළට ගමන් කිරීමට සැලසුම් කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙම යෝජනාව සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව එකඟ විය යුතු බවත් නැවත විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ දී මේ ආකාරයෙන් ශ්‍රේණියෙන් ශ්‍රේණිය පහළ නිලධාරින් හට අවස්ථාව ලබාදීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවුවහොත් ලැබෙන අයදුම්පත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රධාන පාසල්වලට ද විදුහල්පතිවරුන් නොමැති වීමේ ගැටලු ඇතිවිය හැකි බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

## 3.4 ගරු චන්දන සූරියාරච්චි මහතා

### 3.4.1 පාසල්වල 01 ශ්‍රේණියට සිසුන් ඇතුළත් වීමේ ඌණතාවක් පැවතීම

නව වසරේ නව පන්තිවලට දරුවන් බඳවා ගැනීමේ දී 01 ශ්‍රේණියට සිසුන් ඇතුළත් වීමේ අඩුවක් පවතින අතර එයට හේතුව ලෙස 2021 - 2022 වර්ෂවල මෙරට දරු උපත් ප්‍රමාණය අඩුවීම දැක්විය හැකි බවත් ප්‍රාදේශීයව පවතින පාසල්වල 01 ශ්‍රේණියට ළමුන් ඇතුළත් නොවීම මත ක්‍රමානුකූලව එම පාසල් වැසී යාමේ ගැටලුවකට මුහුණ දෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා ප්‍රායෝගික වැඩසටහනක් ආරම්භ කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.4.2 පවතින ගුරු හිඟය සහ ගුරු බඳවා ගැනීමේ ක්‍රියාවලිය

ලංකාව පුරා පාසල්වල 40,000ක පමණ ගුරු හිඟයක් පවතින බව වාර්තා වන නමුත් මින් පෙර පැවැති ගැටලු හා තීන්දු තීරණ හේතුවෙන් තරඟ විභාග පවත්වා බඳවා ගැනීම් සිදුකිරීමේ ප්‍රමාදයක් පවතින බවත් මෙම ගුරු හිඟය අවම කර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග කඩිනමින් පරිපාලනමය වශයෙන් සිදු කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

අද වන විට ගුරුවරුන් ලෙස පත්වීම් ලබා දිය හැකි වන්නේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පාඨමාලාව සමත් වන ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් පමණක් වන බවත් 4,000ක් පමණ මෙම මස අවසාන වන විට අභ්‍යාසලාභී ගුරුවරුන් ලෙස සේවයට බඳවා ගත හැකි බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

පළාත් වශයෙන් ගුරුවරුන් බඳවා ගැනීම් සිදුකරමින් පවතින අතර අධිකරණ නියෝග හේතුවෙන් ගුරු විභාග පැවැත්වීමේ ගැටලුවක් පවතින නමුත් මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශයක් ඉදිරිපත් කර එය නීතිපති හරහා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බැවින් ගුරු විභාග පැවැත්වීම සම්බන්ධව යම් සහනයක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන බව අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 3.4.3 පළාත් සහා පාසල්වල පවතින භෞතික හා මානව සම්පත් හිඟය

පාසල් ගොඩනැගිලි අබලන්ව අවදානම්කාරී ලෙස පැවතීම හේතුවෙන් පාදුක්ක එම්. ඩී. එච්. ජයවර්ධන විද්‍යාලයේ පන්ති 05ක අධ්‍යාපන කටයුතු විහාරස්ථානයක සිදුකරන අතර මෙවැනි ගැටලු එක්වර මතු නොවූ, කාලයක් පුරා පැවති ගැටලු බවත් මෙවැනි ගැටලු සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, මේ තත්ත්වය දීප ව්‍යාප්තව පවතින ගැටලුවක් බවත් ප්‍රාදේශීය වශයෙන් ව්‍යුහ කමිටු ක්‍රියාත්මක වීම සහ නොවීම මත මෙවැනි දත්ත සහ තොරතුරු ලැබීම සම්බන්ධ ගැටලුවක් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

2025 අයවැය මගින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් රු. බිලියන 11ක් ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වෙන් කර ඇති අතර පළාත් පාසල්වල සංවර්ධන කටයුතු සඳහා පළාත් අරමුදල් යටතේ මුදල් වෙන් කර ඇති බවත් මේ වන විට අවදානමට ලක්ව ඇති, අතරමග වැඩ නවතා ඇති විවිධ ව්‍යාපෘති හරහා සිදුකළ ගොඩනැගිලි ඉදිකිරීම් හඳුනාගෙන ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම වසරේ දී ප්‍රමුඛතාවය ලබා දෙන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් ද සැලකිල්ලට ගෙන කටයුතු කරනු ඇති බවට බලාපොරොත්තු වන බවත් මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඉදිකිරීම් අවසන් කර නොමැති ගොඩනැගිලිවල ඉදිකිරීම් අවසන් කිරීම, අවදානම් සහිත ඉදිකිරීම් ආරක්ෂිත ඉදිකිරීම් ලෙස සකස් කිරීම, වැසිකිලි සහ සනීපාරක්ෂක පහසුකම් සම්පූර්ණ කිරීම ආදී නිර්ණායක යටතේ වන පාසල් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන බවත් මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සමඟ සම්බන්ධ විය යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

ප්‍රතිසංවිධානය කිරීමට අපේක්ෂා කරන පාසල් සඳහා වැඩි අවධානයක් යොමුවන බවත් මෙම ප්‍රමුඛතා පදනම හා පළාත් සභා වෙත වෙන්වන ප්‍රතිපාදන හරහා පළාත් පාසල්වල කටයුතු සිදු කරන ලෙස පළාත් සභා

අධ්‍යාපන අමාත්‍යාංශ වෙත දැනුම් දෙන බවත් ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ගුරු විභාග පැවැත්වීම, ගුරුවරුන් බඳවා ගැනීම සහ දුෂ්කර පාසල් සහ නගරබද පාසල් අතර ගුරු තුලනය සම්බන්ධව ගරු මංජුල සුරවීර ආරච්චි මහතා විසින් ද අදහස් දක්වන ලදී.

රට තුළ පවතින 9,500ක් පමණ පළාත් පාසල් තුළ ගුරු තුලනය සිදුකළ යුතු බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ඌව පළාතේ පාසල් සඳහා ගුරුවරුන් 264 දෙනෙකු බඳවා ගැනීම සඳහා කළ ඉල්ලීමේ ප්‍රගතිය සම්බන්ධව ගරු සුදත් බලගල්ල මහතා විසින් විමසීමක් කරන ලදී.

එම බඳවා ගැනීම් ලැයිස්තුව අනුමතිය සඳහා ලැබී ඇති බව අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට පළාත් සභා ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය තුළ මෙම කටයුතු සඳහා නිසි මඟපෙන්වීමක් නොමැති බැවින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීම බලාපොරොත්තු වන බව ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.

මාස තුනකට වරක් පළාත් ආණ්ඩුකාරවරුන්, පළාත් ලේකම්වරුන් සහ අදාළ නිලධාරින් සමඟ රැස්වීම් පවත්වන බවට ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

ගුරු ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන මෙම මොහොතේ ගුරු තුලනයකට යාමෙන් ගැටලුව තවත් සංකීර්ණ වන බවත් ජුලි මාසයේ අධිකරණ තීරණයට පෙර ගුරු විභාග පැවැත්විය හැකි නම් 2025 වර්ෂය තුළ ගුරුවරුන් වැඩි සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් මෙම ගැටලුවට යම් විසඳුමක් ලබාගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගුරු ස්ථාන මාරු සිදු කිරීම සඳහා සියලු නියෝග ලබාදී ගුරු මාරු මණ්ඩල ක්‍රියාත්මක වන අතර ගුරු මාරු මණ්ඩල විසින් ලබා දුන් නිර්දේශ ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වන බවත් ගුරු ස්ථාන මාරු සිදු කිරීම සම්බන්ධව ගරු ඇමැතිතුමිය, නියෝජ්‍ය ඇමතිවරුන් හෝ කිසිදු නිලධාරියෙක් මැදිහත්වීම් සිදු නොකරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

## 3.5 ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

### 3.5.1 ගුරු සේවය සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් බඳවා ගැනීම

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ගුරු වෘත්තියට පිවිසීම සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් අපේක්ෂාවෙන් සිටින නමුත් මේ සම්බන්ධව පවතින ක්‍රියාවලිය ඉතා මන්දගාමී බැවින් මෙම ක්‍රියාවලිය කඩිනම් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උපාධිධාරී ගුරුවරුන් බඳවාගැනීමට අදාළ විභාගය පැවැත්වීම වළක්වන අතුරු තහනම් නියෝගයක් ලබා දී ඇති අධිකරණ නඩුවක් විභාග වෙමින් පවතින අතර මෙය වසර කිහිපයක් මුළුල්ලේ පවතින බවත් මේ සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන එය අධිකරණයට දැන්විය යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

ගුරු බඳවාගැනීම් සිදුකිරීමට හැකි වන්නේ එම ප්‍රතිපත්තිමය තීරණය අධිකරණයට දැනුම් දීමෙන් පසුව පමණක් වන අතර මෙම නඩුව විසඳා ගැනීම සඳහා මේ වන විට ප්‍රමුඛතාවය ලබා දී ඇති බවත් එතෙක් මෙම ගුරු බඳවා ගැනීම් ගැටලුවක් වනු ඇති බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.5.2 මඩකලපුව කලාප අධ්‍යාපන කාර්යාලය සඳහා ස්ථිර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු පත් කිරීම

මඩකලපුව කලාප අධ්‍යාපන කාර්යාලය සඳහා ස්ථිර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු පත් කිරීම ප්‍රමාදවීමට හේතුව කුමක්ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මීට අදාළ පුවත්පත් දැන්වීම් සකස් කර ඇති නමුත් පළාත් පාලන ඡන්ද විමසීම පැවැත්වීමට නියමිත වීම හේතුවෙන් මේ සඳහා අවසර ගැනීමට අදාළ ලිපි ලේඛන මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බව නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මේ වනතෙක් පළාත් පාලන ඡන්ද විමසීම සඳහා දින නියම කර නොමැති බැවින් මැතිවරණ කොමිෂන් සභාවෙන් අවසර ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මීළඟ සිකුරාදා දිනය වන විට අදාළ පුවත්පත් දැන්වීම ප්‍රසිද්ධ කළ හැකි බව නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මහ මැතිවරණය අවසන් වූ දින පටන් මඩකලපුව කලාප අධ්‍යාපන කාර්යාලයේ ස්ථිර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා ද මේ සම්බන්ධව අදහස් දක්වන ලදී.

මඩකලපුව කලාප අධ්‍යාපන කාර්යාලයට ස්ථිර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු පත් කර ගැනීම සඳහා වන ක්‍රියාවලිය කඩිනම් කළ හැකි ද යන්න පිළිබඳව ගරු සභාපතිතුමිය විසින් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්ගෙන් විමසීමක් කරන ලදී.

මීළඟ සඳුදා දින අයදුම්පත් භාරගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකරන බව නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.5.3 නැගෙනහිර විශ්වවිද්‍යාලය සඳහා උපකුලපතිවරයකු පත් කිරීම

නැගෙනහිර විශ්වවිද්‍යාලය සඳහා උපකුලපතිවරයකු පත් කිරීම සඳහා වන ඡන්ද විමසීම පැවැත්වීමේ අවසන් දිනය මාර්තු මස 14 වැනිදා වන

නමුත් ඒ සඳහා මේ වන තෙක් කවුන්සිලය පත්කර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

අනුමත සේවක සංඛ්‍යාවක් නොතිබිය දී නැගෙනහිර විශ්වවිද්‍යාලය විසින් එහි පශ්චාත් අධ්‍යයන පීඨයේ පීඨාධිපති පත්කරගෙන තිබීම සම්බන්ධ ගැටලුව පළමුව විසඳිය යුතු බවත් නැගෙනහිර විශ්වවිද්‍යාලයේ කවුන්සිලයේ සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම ලබා දෙන තෙක් බලා සිටි අතර මේ වන විට එම කටයුතු සිදු වී ඇති බැවින් නැගෙනහිර විශ්වවිද්‍යාලය සඳහා උපකුලපතිවරයකු පත් කිරීම සඳහා වන කටයුතු අද දින සිට ආරම්භ කළ හැකි බවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

### 3.5.4 නැගෙනහිර විශ්වවිද්‍යාලයේ නීති පීඨය ස්ථාපිත කිරීම

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ නීති පීඨයක් නොමැති බැවින් නීති පීඨයක් ස්ථාපිත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.6 විදුහල්පතිවරුන් පත් කිරීම - ගරු අරවින්ද සෙනරත් මහතා

අඟුණුකොළපැලැස්ස මහානාග ජාතික පාසලේ සහ කටුවන ජාතික පාසලේ විදුහල්පතිවරුන් දේශපාලන වුවමනාවන් මත ස්ථාන මාරු කර, එකම පාසල වෙත විදුහල්පතිවරුන් දෙදෙනකු පත් කර ඔවුන් නැවත ඉවත්කර මෙම පාසල් ව්‍යාකූල තත්ත්වයකට පත්කර වසර එකහමාරක පමණ කාලයක් ගත වී ඇති බවත් මෙම පාසල්වල අධ්‍යාපන කටයුතු සහ පරිපාලන කටයුතු බිඳ වැටෙමින් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, අමාත්‍යාංශ මට්ටමින් මෙම ගැටලුව විසඳීම සඳහා බොහෝ කාලයක් ගෙන ඇති බවත් අඟුණුකොළපැලැස්ස මහානාග ජාතික පාසලට අදාළව පළාත් අධ්‍යාපන කාර්යාලය සහ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් නිර්දේශ නිකුත් කර ඇති නමුත් ඒවා ද ක්‍රියාත්මක කර නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පාසලක විදුහල්පති පුරප්පාඩුවක් ඇති වූ විට එහි වැඩ ආවරණය කිරීම සඳහා වැඩ බලන විදුහල්පතිවරයකු එම පාසල වෙත අනුයුක්ත කරන බවත් ඒ අතරතුර විධිමත් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා විදුහල්පතිවරයකු පත් කළ විට අදාළ පාසලේ රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කළ විදුහල්පතිවරයා විසින් නව විදුහල්පතිවරයාට වැඩ භාර නොදීම හෝ රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කළ විදුහල්පතිවරයා අදාළ පාසලෙන් ස්ථාන මාරුවීමට අකමැති වීම සිදුවන බවත් අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, පාසලක විදුහල්පති පුරප්පාඩුවක් ඇති වූ විට එම පාසලේ සිටින ජ්‍යෙෂ්ඨතම නියෝජ්‍ය විදුහල්පතිවරයා විදුහල්පති තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා පත් කිරීමට මේ වන විට තීරණය කර ඇති බවත් අඟුණුකොළපැලැස්ස මහානාග ජාතික පාසලේ විදුහල්පති තනතුරට විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් වෙනත් නිලධාරියෙකු පත්වුවහොත් රාජකාරී ආවරණය කළ විදුහල්පතිවරයාට

අසාධාරණයක් සිදුවන බැවින් ඔහුව අඟුණුකොළපැලැස්ස මහානාග ජාතික පාසලේ විදුහල්පති තනතුරට පත් කළ නොහැකි බවත් අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තව ද, අඟුණුකොළපැලැස්ස මහානාග ජාතික පාසලේ විදුහල්පති තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා මෙම නිලධාරියාව නිර්දේශ කර තිබෙන්නේ වෙනත් අධ්‍යාපන කලාපයකින් බව අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව පරීක්ෂා කර බලන බවත් මෙය විශේෂ හේතුවක් ලෙස සලකා රාජකාරී ආවරණය සඳහා මෙම පාසල් 02 සඳහා නිලධාරීන් යොදවන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 3.7 ගරු නිමල් පලිහේන මහතා

### 3.7.1 විදුහල්පති පුරප්පාඩු

විදුහල්පති ධුරය පුරප්පාඩු වූ විට රාජකාරී ආවරණය සඳහා යොදවන නිලධාරියාගෙන් ඊට අවශ්‍ය කටයුතු සිදු වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගුරු පුරප්පාඩු 2,573ක් පවතින බවත් අනුරාධපුර මධ්‍ය විද්‍යාලයට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකු නොමැති අතර විදුහල්පති තනතුරු සඳහා ශ්‍රේණිධාරීන් යොමු නොවන්නේ ඒ සඳහා අවශ්‍ය වටපිටාව නොමැතිවීම නිසා බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

දීර්ඝ කාලයක් මුළුල්ලේ ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක නොවීම තුළින් අධ්‍යාපන පද්ධතිය තුළ බොහෝ අර්බුද නිර්මාණය වී ඇති බවත් මෙවැනි ගැටලු පිළිබඳව කඩිනම් තීරණ ගන්නා අතරතුර අධ්‍යාපන පද්ධතිය තුළ මානව සම්පත නිසි ලෙස සකස් කර ගැනීමට මැදිහත් වන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පාසල්වල විදුහල්පතිවරුන් ලෙස සේවය නොකිරීමට විසඳුමක් වශයෙන් මෙවර අයවැයෙන් ඔවුන්ට දීමනාවක් ලබාදීමට කටයුතු සූදානම් කර ඇති බවත් මෙමඟින් ඔවුන් දිරිමත් වනු ඇතැයි අපේක්ෂා කරන බවත් අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් දැනුම් දෙන ලදී.

ඉදිරියේ දී නිලධාරීන් පත් කිරීමේ දී අධ්‍යාපන කලාපවලට සහ පළාත් සභාවලට වැඩි අවධානය යොමු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.7.2 පාසල් භූමිවල අනාරක්ෂිත තත්ත්වයන්

පාසල් භූමි පිරිවිතර සලකා බැලීමේ දී බොහෝ පාසල්වල අනාරක්ෂිත තත්ත්වයන් පවතින බැවින් එළඹෙන නිවාඩු කාලය තුළ රේඛීය අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් පාසල්වල පවතින අනාරක්ෂිත

තත්ත්වයන් ඉවත් කර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.8 ගරු ගමගෙදර දිසානායක මහතා

### 3.8.1 විදුහල්පතිවරුන්ගේ හිඟය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හිඟයක් පවතින අතර එම තනතුරුවල සේවය කරනු ලබන්නේ වැඩ ආවරණය කිරීමේ නිලධාරීන් වන බැවින් මේ සම්බන්ධව විසඳුමක් ලබා දිය යුතු බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

1AB සහ ජාතික පාසල්වල ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් මෙම කලාප කාර්යාලවලට අනුයුක්ත කර ගැනීමට හැකියාව පවතින්නේ නම් කලාප අධ්‍යාපන කාර්යාලවල පරිපාලනමය කටයුතු සිදුකර ගැනීමට හැකිවන බව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

අධ්‍යාපන කොට්ඨාසවල ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා තනතුරුවල පුරප්පාඩු පවතින බවත් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා සීමිත පදනමින් නිලධාරීන් බඳවා ගැනීමේ සියලු කටයුතු සිදුකර නිලධාරීන් 800කගේ ලේඛනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

සීමිත පදනමින් බඳවා ගන්නා මෙම නිලධාරීන් කණ්ඩායම රේඛීය අමාත්‍යාංශය තුළ රඳවා නොගෙන ප්‍රාදේශීය වශයෙන් සේවයේ යෙදවීමට තීරණය කර ඇති බවත් එමඟින් මෙම ගැටලුව යම්තාක් දුරකට සමනය කරගත හැකි වනු ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 3.8.2 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් කිරීම

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශය හෝ පළාත් සභාව මඟින් ද යන්න පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ බලය පළාත් සභාව සතුවන නමුත් කටයුතු කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් රේඛීය අමාත්‍යාංශය සමඟ කටයුතු කළ යුතු බවත් පළාත් සභාව සහ රේඛීය අමාත්‍යාංශය අතර සම්බන්ධතාවය පවතින්නේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හරහා බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සම්බන්ධීකරණ තනතුරක් බවත් රේඛීය අමාත්‍යාංශය හරහා එම තනතුරට නිලධාරීන් පත් කිරීමේ දී එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ පළාත් සභා නියෝජිතයෙකු ද සිටිය යුතු බවත් අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් දැනුම් දෙන ලදී.

වයඹ සහ ඌව පළාත්වල පළාත් ආණ්ඩුකාරවරුන් විසින් එම පළාත්වල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු පත්කර ඇති බව ද අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) විසින් දැනුම් දෙන ලදී.

**3.9 ගුරුවරුන් බඳවා ගැනීමේ දී දුෂ්කර ප්‍රදේශ සඳහා ප්‍රමුඛතාවක් ලබාදීම - ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**

නුවරඑළිය වැනි ඇතැම් ප්‍රදේශවල ගුරු සේවා ව්‍යවස්ථා සහ විදුහල්පති සේවා ව්‍යවස්ථා අනුව බඳවා ගැනීම් සිදුකිරීමේ ගැටලු පවතින බවත් ගුරු හිඟයට විසඳුම් ලෙස සංවර්ධන නිලධාරීන් සේවයේ යෙදවීම, ස්වේච්ඡා ගුරුවරුන් බඳවා ගැනීම, ධර්මාචාර්ය විභාගය සමත් වූවන් බඳවා ගැනීම සහ ගුරු සහයකයින් බඳවා ගැනීම ද සිදුකළ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ විද්‍යාපීඨ සහ උපාධි පදනම මත ගුරු පත්වීම් ලබා දුන්න ද ගුරු හිඟය පියවා ගත නොහැකි අතර ගම්බද පාසල් ජාතික තලයට ළඟා කර ගැනීමට නම් විශේෂ අවධානයක් ලබාදිය යුතු ප්‍රදේශ සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පාසල්වල විදුහල්පති ධූරයට අමාත්‍යාංශය හරහා ස්ථිරවම නිලධාරියෙකු පත් කළ විට එතෙක් එම ධූරයේ රාජකාරී ආවරණය කළ නිලධාරියා රාජකාරී බාර නොදීමේ අවස්ථාවකදී අමාත්‍යාංශය වශයෙන් ගනු ලබන පියවර සම්බන්ධව ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් විමසීමක් කරන ලදී.

විදුහල්පතිවරුන් සම්බන්ධ මෙම ගැටලුවේ දී පසුගිය කාලවකවානුවලදී යම් යම් පාර්ශ්ව මේ සඳහා මැදිහත්වීමෙන් රේඛීය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද නියෝග ඉටු නොකර තිබූ අතර වර්තමානයේදීත් එම කටයුතු සිදුකිරීම සඳහා උත්සාහ දරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.10 පාසල්වල කටයුතු සඳහා දරුවන්ගෙන් මුදල් අය කර ගැනීම - ගරු නිහාල් ගලප්පත්ති මහතා**

පාසල්වල කටයුතු සඳහා පාසල් දරුවන්ගේ මව්පියන්ගෙන් මුදල් අයකර නොගන්නා ලෙස ලංකාවේ සියලුම පාසල්වල විදුහල්පතිවරුන්ට දැනුම් දී තිබෙන නමුත් මේ වන විටත් ජාතික පාසල් සහ පළාත් පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේ දී පන්ති කාමර සකස් කිරීම සඳහා රු. 15,000/- 17,000/- වැනි මුදලක් අයකර ගන්නා බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව නිශ්චිත තොරතුරු ලබාදිය හැකි නම් එම පාසල් සම්බන්ධව පරීක්ෂා කරන බවත් මේ වන විටත් මෙවැනි කටයුතු පිළිබඳව තොරතුරු අමාත්‍යාංශය වෙත ලැබී ඇති බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි කටයුතු මගින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උල්ලංඝනය කිරීම සිදුවන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි කටයුතු සිදුකරන පුද්ගලයින්ගේ නම් සමඟ තොරතුරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවලට සහභාගී වන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ බවත් එයට පිළිතුරු ලෙස මෙවැනි කටයුතු නවත්වන ලෙස නියෝගය කර ඇති බව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු විසින් දැනුම් දුන්න ද මෙම කටයුතු නොනවත්වා සිදුවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව ගරු අරවින්ද සෙනරත් මහතා විසින් ද අදහස් පළ කරන ලදී.

මේ සම්බන්ධව ලැබී තිබෙන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් විමර්ශන ඒකකයක් නොමැති බවත් කාලයක් පුරා කඩා වැටී තිබූ පද්ධතියක් යළි යථා තත්ත්වයට නැඟී සිටුවීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවන අතර කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමේ අපහසුතා පවතින බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 3.11 දුෂ්කර ප්‍රදේශවල පවතින පාසල් - ගරු ඊ. එම්. බස්නායක මහතා

මේ වන විට මහනුවර දිස්ත්‍රික්කයේ ගුරු පුරප්පාඩු 6,000ක් පමණ පවතින බවත් උඩුදුම්බර තෙල්දෙණිය අධ්‍යාපන කලාපයේ පාසල් 97ක් පමණ පවතින අතර මෙම ප්‍රදේශයේ පවතින ගම්වල ඉතා සීමිත සිසුන් සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා ඉගැන්වීම් කටයුතු සිදුකරන පාසල් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එහෙත්, ගම්මානවල පවතින මෙම පාසල් කලාප අධ්‍යාපන කාර්යාල මගින් වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට නොහැකි වන්නේ එම ගම්වල පවතින එකම පාසල මෙය වීම හේතුවෙන් සහ වැඩි ආර්ථිකමය හැකියාවක් පවතින ජනතාව ගම්වලින් ඉවත්වන පසුබිමක එවැනි හැකියාවක් නොපවතින ජනතාවගේ දරුවන්ට අධ්‍යාපනය ලැබීමට මෙම පාසල පමණක් ඉතිරි වන බැවින් මේ සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

තව ද, එම ජනතාවගේ ආර්ථික මට්ටම සහ දුෂ්කරතා හේතුවෙන් ඔවුන්ගේ දරුවන්ට ගමේ පාසලේ පවතින අධ්‍යාපන මට්ටමෙන් ඉහළට පැමිණීමට නොහැකි බැවින් මේ සම්බන්ධව සලකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දිස්ත්‍රික්කයේ ප්‍රධාන පෙළේ පාසල්වල පවතින මට්ටම් අනුව 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු ලබා දෙන අතර දිස්ත්‍රික් පදනම මත අ. පො. ස. සාමාන්‍ය පෙළ සහ අ.පො.ස. උසස් පෙළ විභාගවල ලකුණු ලබා දෙන බැවින් දිස්ත්‍රික් පදනම මත නොව පාසල් පදනම මත සලකා බලා ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ හැකිද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම විෂමතාවය නැති කිරීමට අමාත්‍යාංශය මගින් උත්සාහ කරන බවත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් මෙය සිදුකිරීමට සැලසුම් කරන අතරතුරදී මෙවැනි ප්‍රදේශ හා පාසල්වලට විශේෂ අවධානයක් යොමු කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

සංඛ්‍යාත්මක පදනම මත නොව හූ විෂමතා සහ අනෙකුත් හේතූන් පදනම් කරගනිමින් පාසල් නැවත ස්ථාපිත කිරීමට කටයුතු කරන බව අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.12 ගරු ලාල් ප්‍රේමනාත් මහතා

### 3.12.1 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදුකිරීමට යන පරිවර්තනය සම්බන්ධව ගුරුවරුන්, දෙමව්පියන් සහ දරුවන් හට අවබෝධයක් නොමැති අතර ජාතික පාසල්, ජනප්‍රිය පාසල් සහ පළාත් පාසල් යනාදී වශයෙන් ඇති බෙදීම ජනතාව තුළ තවමත් පවතින බවත් මෙම වැරදි අවබෝධය ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.12.2 පාසල් වෙත ළමුන් ඇතුළත් කිරීමේ දී විදුහල්පතිවරුන් විසින් සිදු කරන ක්‍රියා

මොරවක ජාතික පාසලේ 06 ශ්‍රේණිය සඳහා 05 ශ්‍රේණිය ශිෂ්‍යත්වය සමත් සිසුන් ඇතුළත් කර ගැනීමේ දී චක්‍රලේඛවල කුමක් සඳහන්ව තිබුණ ද රු. ලක්ෂ 3.5ක් පමණ වැය වන පාසල් තාප්පය ඉදිකර දිය යුතු බවට විදුහල්පතිතුමිය විසින් එම දෙමාපියන්ට දැනුම් දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.12.3 අධ්‍යාපන පරිපාලන නිලධාරීන් ස්ථාන මාරු කිරීම

පළාත් රාජ්‍ය සේවය තුළ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් එකම සේවා ස්ථානයේ වසර 10 - 15ක් පමණ සේවය කරන බැවින් ඔවුන්ට ස්ථාන මාරු ලබාදිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.12.4 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවතින ගැටලු

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වෙත විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර විශේෂයෙන්ම නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ විශාල ගැටලු සංඛ්‍යාවක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ නිරීක්ෂණය කිරීම සඳහා සැලසුම් කර ඇති බවත් එමෙන්ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සම්බන්ධව විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 3.13 ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

### 3.13.1 පාසල් අවට මත්ද්‍රව්‍ය විකිණීම

පාසල් අවට මත්ද්‍රව්‍ය විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මක වන බැවින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ආරක්ෂක අංශ මැදිහත් වී මෙම අනීතික ක්‍රියාව වළක්වන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.13.2 පාසල් විභාග අසමත් වන දරුවන් සම්බන්ධව අවධානය යොමු කිරීම

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග සමත්වන දරුවන් ඇගයීමට ලක් කරන්නා සේම එම විභාග අසමත් වන දරුවන් පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.13.3 පාසල්වල සිදුවන මුදල් එකතු කිරීම්

හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විපුලානන්ද දෙමළ මහා විද්‍යාලයේ සාමාන්‍ය පෙළ පන්තිවල සිසුන් සඳහා 2025.03.10 වැනි දින පෙ. ව. 10.00ට සමුගැනීමේ උත්සවයක් පවත්වන අතර ඒ සඳහා එක් සිසුවෙකුගෙන් රු. 2,500/-ක් අයකර ගැනීමට නේසමලර් නැමති ගුරුවරිය විසින් දැනුම් දී ඇති බවත් එම සාදය අවසන් වූ පසු එලෙස අයකර ගත් මුදල්වලින් වියදම් සිදු කර ඉතිරිවන මුදලින් රු. ලක්ෂයක් යම් ව්‍යාපෘතියක් වෙනුවෙන් වැය කිරීම සඳහා ලබා දිය යුතු බවට සුරේෂ් නම් ගුරුවරයා විසින් දැනුම් දී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මේ සම්බන්ධව පරීක්ෂා කර මීට අදාළව යම්කිසි වැඩපිළිවෙළක් සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.14 ගරු මංජුල සුගත් රත්නායක මහතා

### 3.14.1 අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු

පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පවතින බැවින් එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කරන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 3.14.2 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය

2026 වර්ෂයේ දී 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සුපුරුදු අයුරින් 2026 වර්ෂයේ දී 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන බවත් 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට ඉදිරියේ දී සිදුවිය යුතු වෙනස්කම් සම්බන්ධව කටයුතු කිරීම සඳහා විශේෂඥ දැනුමක් ඇති කමිටුවක් පත් කරන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 3.15 ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයට අයත් ඉඩම - ගරු රුවන් මාපලගම මහතා

ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයට යාබද ඉඩමේ කලාප අධ්‍යාපන කාර්යාලය සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය පවත්වාගෙන යන බවත් දිස්ත්‍රික් සංවර්ධන කමිටු වාර කිහිපයකදීම මෙම ඉඩම සම්බන්ධව ඉල්ලීමක් කළ නමුත් මේ වනතෙක් ඒ සඳහා ප්‍රතිචාරයක් නොලැබුණු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල තුළ කලාප අධ්‍යාපන කාර්යාලය සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය ස්ථාපිත කිරීමට සූදානම් කර තිබූ බවත් ඊට අමතරව රු. මිලියන 76ක මුදලක් වෙන් කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව රේඛීය අමාත්‍යාංශය දැනුවත් බවත් ඉදිරියේදී කටයුතු සිදුකරන බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

## 3.16 ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

### 3.16.1 උතුරු පළාතට සින්තටික් ධාවන පථයක් නොමැති වීම

උතුරු පළාතේ සින්තටික් ධාවන පථයක් නොමැති බැවින් මෙම වසරේදී හෝ සින්තටික් ධාවන පථයක් ඉදිකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව ඉදිරියේ දී අවධානය යොමු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.16.2 උතුරු පළාතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරී හිඟය

උතුරු පළාතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ අනුමත නිලධාරීන් සංඛ්‍යාවෙන් 50%ක් පමණ පුරප්පාඩු වී ඇති බැවින් මෙම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉදිරියේ දී නිලධාරීන් පත් කිරීමේ දී අධ්‍යාපන කලාපවලට සහ පළාත් සභාවලට වැඩි අවධානය යොමු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.16.3 විභාග ප්‍රශ්න පත්‍ර දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමෙන් ඇතිවන ගැටලු

අ. පො. ස. උසස් පෙළ විභාග ප්‍රශ්න පත්‍ර (විශේෂයෙන්ම ජීව විද්‍යාව ප්‍රශ්න පත්‍රය) දෙමළ භාෂාවට පරිවර්තනය කිරීමේ දී බොහෝ වැරදි සිදුවී ඇති බවත් දෙමළ භාෂාවට පරිවර්තනය කර ඇති විභාග ප්‍රශ්නය මඟින් අපේක්ෂා කරන පිළිතුර කුමක් ද යන්න හෝ විභාග අපේක්ෂකයින්ට අවබෝධ නොවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.16.4 කොල්ලකාරී/ වංචාකාරී සඟරා (Predatory Journals)

කොල්ලකාරී/ වංචාකාරී සඟරා (Predatory Journals) ප්‍රකාශනය කිරීමේ වර්ධනයක් දක්නට ඇති අතර පවතින සඟරාවලින් 30%ක් පමණ කොල්ලකාරී/ වංචාකාරී සඟරා (Predatory Journals) වන බැවින් මේ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙය වසර කිහිපයක් පුරා ගෝලීය වශයෙන් පවතින ගැටලුවක් වන අතර මෙම ගැටලුව යම්තාක් දුරට හෝ විසඳීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යම් පියවරක් ගත යුතු බවත්

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් උසස්වීම් ලබා ගැනීම සඳහා ඔවුන්ගේ පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීමේ පීඩනය මත පහසු ක්‍රම සොයා යෑමෙන් කොල්ලකාරී/ වංචාකාරී සඟරාවලට (Predatory Journals) හසු වන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, කොල්ලකාරී/ වංචාකාරී සඟරා (Predatory Journals) ආචාර්යවරුන් සහ පර්යේෂකයින් පසුපස හඹා යමින් ඔවුන්ට විවිධ ප්‍රතිලාභ ලබාදෙන බව පවසමින් කටයුතු කරන බවත් මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ආරක්ෂා කර ගැනීමට මේ සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

#### 3.16.5 විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථාන සඳහා සෞඛ්‍ය නිලධාරීන් පත් කිරීම

වැටුප් පරිමාණ ආදී ගැටලු හේතුවෙන් විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානවල සෞඛ්‍ය නිලධාරීන් ලෙස කටයුතු කිරීමට වෛද්‍යවරුන් නොපැමිණීමෙන් විශ්වවිද්‍යාල දැඩි අපහසුතාවයකට පත්ව තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානවල සෞඛ්‍ය නිලධාරීන් සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය හරහා පත්වීම් ලබාදීම සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධව අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.17 සිසුන් 50ට වඩා අඩු පාසල් වසා දැමීම - ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

සිසුන් 50ට වඩා අඩු පාසල් වසා දමන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට අධ්‍යාපන කලාපයේ ඇඳුරාපොළ දෙමළ විද්‍යාලය, මහබාගේ අතුලඋඩ විද්‍යාලය වැනි පාසල්වල පිළිවෙළින් සිසුන් 49ක් 47ක් පමණක් අධ්‍යාපනය ලබන බැවින් මෙම පාසල්වල 01 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර නොගෙන විදුහල්පතිවරුන් අත්තනෝමතික ආකාරයෙන් ක්‍රියා කරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තව ද, දුෂ්කර ප්‍රදේශවල පවතින පාසල්වල සිසුන් අඩුවීමේ ගැටලුවට හේතුවක් වන්නේ ගමනාගමන පහසුකම් සහ යටිතල පහසුකම් නොමැතිවීම බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.18 ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

#### 3.18.1 දෘෂ්‍ය ආබාධ සහිත සිසුන්ට විභාගවලට මුහුණ දීමේ දී ඇතිවන ගැටලු

මඩකලපුව දිස්ත්‍රික්කයේ නොච්චිමුනෙයි ප්‍රදේශයේ පිහිටි දරිසනම් දෘෂ්‍යාබාධිත විද්‍යාලයේ දෘෂ්‍ය ආබාධ සහිත සිසුන් 50කට වැඩි

සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන අතර අධ්‍යාපනය ලැබූ සිසුන් බොහෝ ප්‍රමාණයක් විශ්වවිද්‍යාල වරම් ලබා ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම සිසුන් අ. පො. ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගවලට මුහුණ දීමේ දී එම ප්‍රශ්න පත්‍රවල පවතින රූප සටහන්, සිතියම් හා ප්‍රස්ථාර ඇසුරෙන් ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම විශාල අභියෝගයක් බව එම සිසුන් විසින් දැනුම් දී ඇති බැවින් මෙම සිසුන්ට එම විභාග ප්‍රශ්න වෙනුවෙන් විකල්පයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.18.2 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු නිකුත් නොකිරීම

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු මේ වන තෙක් නිකුත් නොකිරීමෙන් 06 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීමේ දී ගැටලු මතු වී ඇති හෙයින් එම කඩඉම් ලකුණු කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 3.18.3 දුෂ්කර පාසල්වල ගුරු හිඟය

දුෂ්කර සහ අති දුෂ්කර පාසල්වල විශාල ගුරු හිඟයක් පැවතීම හේතුවෙන් විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය ආදී විෂයයන් ඉගැන්වීමට නොහැකි තත්ත්වයක් පවතින බැවින් ප්‍රධාන පෙළේ පාසල්වලට මෙන්ම මෙම දුෂ්කර සහ අති දුෂ්කර පාසල්වලට ද ගුරුවරුන් සහ අනෙකුත් පහසුකම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.19 ගරු රවී කරුණානායක මහතා

#### 3.19.1 විශ්වවිද්‍යාල වරම් අහිමිවන දරුවන් දිරිගැන්වීම

අ. පො. ස. උසස් පෙළ විභාගය සමත්වන සිසුන් 170,000ක පමණ ප්‍රමාණයෙන් සිසුන් 55,000ක් පමණ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය වෙත ඇතුළත් කරගත් පසු ඉතිරි වන සිසුන් සංඛ්‍යාව දිරිගැන්වීමේ වැඩසටහන් සහ ඔවුන්ට පවතින අවස්ථා පිළිබඳව දැනුවත් කිරීම වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

2015 වර්ෂයේ දී උපාධිධාරී සිසුන් සඳහා පොලී රහිත ණය ලබාදීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර මේ වන විට එය ක්‍රියාත්මක නොවන බැවින් රාජ්‍ය බැංකු මැදිහත් කර ගනිමින් මෙම වැඩසටහන යළි ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පොලී රහිත ණය ලබාදීමේ 08 වැනි කණ්ඩායම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කර අයදුම්පත් බාරගත් බවත් ලංකා බැංකුවට අමතරව මහජන බැංකුව ද සම්බන්ධ කරගෙන මෙම වැඩසටහන සිදුකිරීම නිසා ණය ලබාදීම සඳහා දැන්වීම ප්‍රසිද්ධියට පත් කිරීම ප්‍රමාද වූ බැවින් හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වූ බැවින් සිසුන් වෙනත් අධ්‍යාපන වැඩසටහන් සඳහා සහභාගී වීම නිසා 07 වැනි කණ්ඩායම සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව අඩුවීමෙන් 2024 වසරේ දී ණය ලබාදීම් ප්‍රමාණය අඩු වූ බවත් උසස් අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) විසින් දැනුම් දෙන ලදී.

2025 වර්ෂයේ දී මේ වන විට ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව 10,000ක් පමණ වන බවත් ණය ලබාදිය හැකි උපරිම සංඛ්‍යාව 7,000ක් පමණ වුවත් අදාළ අධ්‍යාපන ආයතනවල සහ අධ්‍යාපන පාඨමාලාවල ධාරිතාවය අනුව පමණක් මෙම කටයුතු සිදුකරන බවත් උසස් අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන) විසින් දැනුම් දෙන ලදී.

### 3.19.2 පෞද්ගලික විශ්වවිද්‍යාල පද්ධතිය

පෞද්ගලික විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සංචාරක අධ්‍යාපන පද්ධතිය සම්බන්ධ කර ගන්නා ලෙසත් මේ පිළිබඳව ගරු සභාපතිතුමිය විසින් ප්‍රකාශයක් සිදු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අධ්‍යාපනය යනු ආරක්ෂා කර ගත යුතු අයිතිවාසිකමක් බවට රජයේ මතය වන අතර අධ්‍යාපනය ලබාදීමේ මූලික වගකීම රජය සතු වන බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

වෙනස් වන උසස් අධ්‍යාපන සන්දර්භයේ අවශ්‍යතාවලට අනුකූල වීමට අසමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය කඩා වැටෙමින් පවතින බවත් එහි ප්‍රතිඵලයක් වශයෙන් නියාමනය නොවූ පෞද්ගලික උසස් අධ්‍යාපන අංශයක් නිර්මාණය වී ඇති බවත් ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙරට තුළ පවතින රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය පිළිබඳව අධ්‍යයනයක් සිදු කර රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන පද්ධතියට සිදුකළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳව ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රතීතන සහ තත්ත්ව සහතිකකරණ ස්ථාවර කමිටුව (Standing Committee on Accreditation and Quality Assurance - SCAQA) වෙත දැනුම් දී ඇති බවත් මෙය නියාමනය කළ යුතු වුවත් එය කඩිනමින් සිදුකළ නොහැකි බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය තුළින් පවතින ස්ථර අනුව සමස්ත පද්ධතියම නියාමනය කළ යුතු වුවත් ඒ සඳහා නිසි ප්‍රතිපත්තියක් පැවතිය යුතු බවත් අධ්‍යාපනය යනු වෙළෙඳ භාණ්ඩයක් නොව සේවාවක් බැවින් එහි ගුණාත්මකභාවය ආරක්ෂා කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

එමඟින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයට කිසිඳු භූමිකාවක් හෝ කාර්යභාර්යක් නොමැති බව අදහස් නොවන බවත් විශේෂයෙන්ම වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය තුළ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය සැලකිය යුතු කාර්යභාර්යක් ඉටුකරන අතර එම අංශය පුළුල් කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා රු. බිලියන 135ක් වැය කරන නමුත් විදේශීය විශ්වවිද්‍යාලවල අධ්‍යයනය කිරීම සඳහා විදෙස් ගතවන සිසුන් 50,000

- 60,000 ක පමණ ප්‍රමාණයක් හේතුවෙන් රු. බිලියන 300ක පමණ මුදලක් රටින් පිටවන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම සංඛ්‍යාත්මක දත්ත පිළිබඳව නිසි අධ්‍යයනයක් සහ නිසි ඇගයීමක් සිදුකළ යුතු අතර අනාගතයේ දී ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව මෙම අංශයට අදාළ විද්වතුන් විසින් නිසි අදහසක් ලබාදිය යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

### 3.19.3 පාසල්වල 01 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් වීම අඩුවීම

මීට වසර 05කට පමණ පෙර පාසල්වල 01 ශ්‍රේණිය සඳහා සිසුන් 150,000ක් පමණ ඇතුළත් වූ නමුත් මේ වන විට එම සංඛ්‍යාව 110,000කට පමණ අඩුවීම සම්බන්ධ සත්‍යතාවක් පවතී ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙරට උපත් අනුපාතය අඩු වෙමින් පවතින බැවින් 01 ශ්‍රේණියට සිසුන් ඇතුළත් වීමේ අඩුවක් පවතින නමුත් එය විශාල අඩුවීමක් නොවන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව පරීක්ෂා කර බලන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.19.4 රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් පත් කිරීම

මේ සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කරන ලෙසත් දක්ෂ නිලධාරීන් මෙම තනතුරු සඳහා පත් කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන් පත් කිරීම දේශපාලනීකරණය නොකිරීම සහ එම කටයුතු විශ්වවිද්‍යාල කවුන්සිලයන්ට සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉටුකිරීමට අවස්ථාව ලබා දිය යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවලිය දේශපාලනීකරණයෙන් තොර වුව ද විශ්වවිද්‍යාල අභ්‍යන්තරයෙහිම මේ සඳහා යම් පෙළෙඹවීම් පවතින බවත් උසස් අධ්‍යාපන පද්ධතිය නැවත සමාලෝචනය කර එය දියුණු කිරීමට සහ විනිවිද භාවයක් ඇති කිරීමට කටයුතු කළ හැකි ආකාරය පිළිබඳව පරීක්ෂා කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම, උපකුලපතිවරුන් තෝරාගැනීමේ ඡන්ද විමසීමේ ක්‍රියාවලිය සම්බන්ධව ද පරීක්ෂා කළ යුතු බවත් ගරු සභාපතිතුමිය විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

## 3.20 ගරු සුනිල් රාජපක්ෂ මහතා

### 3.20.1 විදුහල්පතිවරුන් බඳවා ගැනීම

2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල්වල විදුහල්පති තනතුරු සැලකිය යුතු සංඛ්‍යාවක් පුරප්පාඩු වීමෙන් ඒවායේ වැඩ බලන විදුහල්පතිවරු බොහොමයක් සේවය කරන බැවින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට යාමේදී මෙවැනි පාසල් සඳහා ගුණාත්මක නායකයින් පත් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා විදුහල්පති තනතුරුවලට බඳවා ගැනීම් සහ පුහුණු කිරීමේ කටයුතු සිදුවන්නේ ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 3.20.2 ගුරු උපදේශකවරුන්ගේ වැටුප් විෂමතා

ගුරු සංවර්ධනය සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ කටයුතුවල නිරත වන ගුරු උපදේශකවරුන්ගේ සේවයේ පවතින වැටුප් විෂමතා හේතුවෙන් බොහෝ නිලධාරීන් එම තනතුරේ වැඩ භාර නොගන්නා බවත් ගුරු උපදේශකවරුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් බඳවාගෙන එම සේවය ශක්තිමත් කිරීමෙන් තොරව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අපහසු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.20.3 එක් පන්ති කාමරයක ඉගෙනුම ලබන සිසුන් ප්‍රමාණය

ඇතැම් පාසල්වල එක් පන්ති කාමරයක් සඳහා හෝ සිසුන් නොමැති අතර ඇතැම් පාසල්වල එක් පන්ති කාමරයක් සඳහා සිසුන් 60ක් පමණ සිටින බැවින් එක් පන්ති කාමරයක් සඳහා සිසුන් 35ක් පමණ ඇතුළත් කර ගැනීමට අදාළව ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

## 3.21 ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

### 3.21.1 දෙවන භාෂාව ලෙස සිංහල සහ දෙමළ ඉගැන්වීම සඳහා ගුරුවරු ලබා ගැනීම

උතුරු සහ නැගෙනහිර පළාත්වල පිහිටි දෙමළ පාසල්වල දෙවන භාෂාව ලෙස සිංහල ඉගැන්වීම සඳහා සිංහල ගුරුවරුන් ද සිංහල පාසල්වල දෙවන භාෂාව ලෙස දෙමළ ඉගැන්වීම සඳහා දෙමළ ගුරුවරුන් ද ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම, දෙමළ පාසල්වල ඉගැන්වීම් කටයුතු සිදුකිරීම සඳහා සිංහල ගුරුවරුන් නොපැමිණෙන බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.21.2 දෙමළ පාසල්වල සිටින ස්වේච්ඡා ගුරුවරුන්

මෙම ස්වේච්ඡා ගුරුවරුන් සඳහා සාධාරණයක් ඉටු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.21.3 කඩාවැටීමට ආසන්න පාසල් ගොඩනැගිල්ල

අම්පාර දිස්ත්‍රික්කයේ කරෙයිතිව් විපුලානන්ද විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල කඩා වැටීමට ආසන්න තත්ත්වයේ පවතින බැවින් එහි සිසුන්ට එළිමහන් ස්ථානවල ඉගැන්වීම් කටයුතු සිදු කරන බැවින් මේ සම්බන්ධව කඩිනම් පියවරක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 3.22 ගරු නිශාන්ත පෙරේරා මහතා

### 3.22.1 පාසල්වල මුදල් එකතු කිරීම

පාසලේ පාසල් සංවර්ධන සමිතිය සඳහා, පාසලේ තීන්ත ආලේප කිරීම සඳහා සහ පන්ති කාමරවල තීන්ත ආලේප කිරීම ආදී ලෙස කිහිපාකාරයකින් පාසල්වල මුදල් අය කිරීම් සිදුකරන බැවින් මෙම ගැටලු කොට්ඨාස අධ්‍යාපන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 3.22.2 පළාත් පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය

පාසල් මුරකරුවන් වැනි අනධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් පාසල්වල ඇති වටිනා උපකරණ සොරකම් කිරීම සිදුවන බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල දී දැනුම් දෙන බැවින් මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

2022 වර්ෂයේ දී මහබැංකුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින් අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් පිහිටුවා ඇති කමිටුවට පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව ඉදිරිපත් කර ඒ සඳහා අවශ්‍ය අනුමතීන් ලබාගැනීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.22.3 පාසල්වල ගුරු හිඟය

පළාත් පාසලක ගුරුවරයෙක් හට ජාතික පාසලකට ගුරු ස්ථාන මාරුවක් ලබා දුන් නමුත් එම ගුරුවරයා කලාප කාර්යාලයට ඉල්ලීම් කර නැවත පළාත් පාසලක් වෙත ස්ථාන මාරුව ලබා ගන්නා බැවින් පළාත් සභා අධ්‍යාපන නිලධාරීන් සහ ජාතික පාසල් නිලධාරීන් අතර අන්‍යෝන්‍ය අවබෝධයක් පැවතිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.22.4 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු නිකුත් නොකිරීම

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු මේ වන තෙක් නිකුත් නොකිරීමෙන් දෙමාපියන් විසින් තම දරුවන් 06 ශ්‍රේණියට ඇතුළත් නොකර නිවාසවල තබාගෙන සිටින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 3.22.5 පාසල් ඉඩම්වල අයිතිය

නීත්‍යානුකූලව පාසල් වෙත පවරා නොගත් ඉඩම් බොහොමයක් පවතින බවට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත පැමිණිලි ලැබෙන බැවින් මේ සම්බන්ධව පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.23 පළාත් පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය - ගරු අබූබකර් අතම්බාවා මහතා**

නැගෙනහිර පළාතේ පළාත් පාසල්වල රසායනාගාර සහායකයින්, මුරකරුවන් වැනි අනධ්‍යයන කාර්ය මණ්ඩලවල හිඟයක් පවතින බැවින් කඩිනමින් මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

2022 වර්ෂයේ දී මහබැංකුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින් අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් පිහිටුවා ඇති කමිටුවට පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව ඉදිරිපත් කර ඒ සඳහා අවශ්‍ය අනුමතීන් ලබාගැනීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.24 පොලී රහිත ණය යෝජනා ක්‍රමය - ගරු සුදත් බලගල්ල මහතා**

පෞද්ගලික විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලැබීම සඳහා සිසුන්ට පොලී රහිත ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වූ අතර උපාධිය ලබා ගත් පසු එම සිසුන්ට රැකියාවක් සොයා ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවන බවත් උපාධි අවසන් වූ වහාම ණය ගෙවීම ආරම්භ කළ යුතුවන බැවින් එම සිසුන් දැඩි අපහසුතාවයට ලක්වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින්, මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව අවධානය යොමු කරන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

**4.** කාරක සභාව ප.ව 01.05ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.